ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

විශේෂ අතිරේකයක්
නොමිලේ




# ධරණී

සතුටින් ජීවිතය දරන්නී


2023 ජූලි 05 වන බදාදා
3 කාණ්ඩය 31 කලාපය
මිල රු. 80 යි




විසි හතර පැයම කුසගින්නට හඬන කෑගල්ලේ **යෝධ බබා**

සෙනසුරු අපලය ෆේස්බුක් ගිණුමට හැරවූ **මොළ හතානෝ**

ආචාර්ය උපාධියක් හිමි එකම සහ ප්‍රථම විදුහල්පතිනිය ආචාර්ය සුමේධා ජයවීර ධරණීට කී කතාව

කොස් ගෙඩියක් විසින් කැඳවූ සාක්ෂිකරු තිස්මඩ මිනීමැරුමේ ඝාතකයින් හෙළිකරයි

හත්මුතු පරම්පරාවටම ආඩම්බර වෙන්න මූනේ දැලි ගාගන්නේ කොහොමද?

වෘත්තීයිකා
නයෝමි
ගීතිකා අතුරලිය

ඡායාරූපය
ප්‍රදීප් දඹරගේ

දැන්වීමකි

# හරිස්චන්ද්‍ර රස මැදුර





විධායක සූපවේදී
සුජිත් ආරියරත්න

## ඉඳිආප්ප පිට්ටු

**හරිස්චන්ද්‍ර ඉඳිආප්ප = 30**
(සාදා ගන්නා ආකාරය පැකට්ටුවේ සඳහන් කර ඇත)

- කැරට් 50g
- ලීක්ස් 50g
- ළූණු 30g
- සුදුලූනු 10g
- ඉඟුරු 10g
- කුකුල් මස් 200g
- පොල්තෙල් මේස හැඳි 4
- කරපිංචා ඉති 2
- ගාගත් පොල් 100g

❖ කැරට්, ලීක්ස් සහ ලූනු, සුදුලූනු හීනියට කපා ගන්න. ඉන්පසුව එයට ගාගත් පොල් දමා කලවම් කරගන්න.

❖ එයටම හරිස්චන්ද්‍ර සුදුකැකුළු හාල්පිටි සහ කඩාගත් ඉඳිආප්ප දමා කලවම් කර පිට්ටු බම්බුවක් ආධාරයෙන් හුමාලයෙන් තම්බා ගන්න.

## වම්බටු හොට්සෝස්

- වම්බටු 400g
- සුදුලූනු 15g
- ඉඟුරු 15g
- ළූණු 50g
- අමුමිරිස් 20g
- හරිස්චන්ද්‍ර සෝයා සෝස් තේ හැඳි 2
- හරිස්චන්ද්‍ර හාල්පිටි 50g
- ලුණු පදමට
- සීනි තේ හැඳි 1
- තක්කාලි සෝස් මේස හැඳි 3
- බැද ගැනීමට තෙල්

❖ වම්බටු කැමැති ආකාරයට හීනියට කපාගන්න. එයට ලුණු, ගම්මිරිස් සහ හාල්පිටි දමා හොඳින් සීසන් කර රත් වූ ගැඹුරු තෙලේ බැදගන්න.

❖ ඉන්පසුව වෙනත් භාජනයක් ළිප තබා එයට තෙල් මේස හැඳි 3 ක් එකතු කර රත්වන විට එයට ලූනු, සුදුලූනු, ඉඟුරු, තක්කාලි එකතු කර හෙමින් තෙම්පරාදු කරගන්න. ඉන්පසුව එයට තක්කාලි සෝස්, හරිස්චන්ද්‍ර සෝයා සෝස් සහ අනිකුත් ද්‍රව්‍ය දමා කලවම් කර බැදගත් වම්බටු එකතු කර හොඳින් කලවම් කර ගන්න.

සටහන : රුවන් අමරසේකර

# විශිෂ්ටත්වයේ විශ්වාසය




හරිස්චන්ද්‍ර කර්මාන්ත ආයතනය - මාතර



# පුතාට කන්න දෙන්න වේලකට හාල් කිලෝ එකකවත් බත් ඕනේ





## රෝමාශ පංකජ



**ගමේ ළමයි මෙයාට තඩියා, මෝඩයා කියලා විහිලු කරනවා. අපේම නෑයෝ පවා අපිව කොන් කරලා තියෙන්නේ**





යෝධ බබා කිව්ව හැටියේ ලංකාවේ මිනිස්සුන්ගේ මතකෙට එන යෝධ බබාලා දෙන්නෙක් ඉන්නවා. එක්කෙනෙක් තඹුත්තේගම යෝධ බබා.

එක්දස් නවසිය හතළිස් ගණන්වල ජීවත්වුණු තඹුත්තේගම යෝධ බබා හාල් සේරු තුන හතරක බත් එකවේලට ගිල දාපු බබෙක්. නිතරම කෑම ඉල්ලලා අඬපු යෝධ බබාට කන්න දෙන එක සුළුපටු වැඩක් වුණේ නැතිලු. මැතිවරණ රැලිවලට සෙනඟ අද්දන්න සමහරු මේ දරුවව පාවිච්චි කළාලු. රැලිවලදි අඩු වයසෙන්ම බොන්න පුරුදුවුණු යෝධයා අකාලේ මිය ගිහින්. ඊගාව යෝධ බබා ගැන ඇහුණේ දිඹුලාගල පැත්තෙන්. ඒ එක්දස් නවසිය අනූගණන්වලදි. මේ දරුවා නිතරම කන්න ඉල්ලලා අඬනවය, තඹුත්තේගම යෝධයා වගේම හාල් සේරු ගණන් කනවය කියලා ඒ දවස්වල පත්තරවල ගියා. ගොඩාක් කට්ටිය මේ බබාව බලන්න එහෙමත් ගියා. පස්සේ එහෙමම දිඹුලාගල බබා ගැන හාහුවක් නැතිව ගියා. පස්සේ ආරංචිය ආවේ යෝධ බබා මැරුණා කියලයි.

මේ කියන්න යන්නෙත් ඔය බබාලා දෙන්නා වගේම තවත් යෝධ බබෙක් ගැන. බබෙක් කිව්වට මේ අවුරුදු 12ක පුතෙක්. නිතරම කෑම ඉල්ලලා අඬන පුතා නිසා මේ පුතාගේ අම්මලාත් ගොඩක් අසරණ වෙලා. තඹුත්තේගම යෝධ බබාගේ කතාව වගේම දිඹුලාගල යෝධ බබාගේ කතාව අවසන් වුණෙත් ඛේදාන්තයකින්. මේ පුතාගේ කතාවටත් එහෙම අවසානයක් නොලැබෙන්න ඕනා නිසයි පුතාගේ කතාව මේ විදියට ලියන්න හිතුවේ.

අපි මේ කියන යෝධ බබාගේ නම රෝමාශ පංකජ. දරුවා ඉන්නේ කෑගල්ලේ, දේවාලේගම. රෝමාශ පුතාට හරියට කතා කරන්න බැහැ. දරුවා දන්න එකම වචනේ 'බඩගිනී' කියන එක. බඩගිනී... බඩගිනී... බඩගිනී... දවසේ පැය විසිහතරම පුතා අඬන්නේ ඔහොම. රෝමාශ පුතාගේ සංවේදි කතාව ගැන අපිත් එක්ක කතා කළේ පුතාගේ අම්මා චන්ද්‍රිකා ජයලත්.

**"පුතා ඉපදුණේ 2010දි. අවුරුදු තුනක් යනකල් කිසිම වෙනසක් තිබුණේ නැහැ. එතැනින් එහාට පුතාට තරහා යන ගතියක් ආවා. අපිට ගහන්න හදනවා. කොනිත්තනවා. හරියට කතාබහ කළෙත් නැහැ. පස්සේ අපි පුතාව දොස්තර මහත්තයෙක්ට පෙන්නුවා. පුතාට මානසික ප්‍රශ්නයක් තියෙනවා කියලයි ඒ මහත්තයා කිව්වේ. කාලයක් අපි බෙහෙත් කළාට දරුවා සුවවුණේ නැහැ. දිගටම ප්‍රතිකාර කරන්න සල්ලි නැති නිසා එහෙමම බෙහෙත් කිරිල්ලත් නතර වුණා."**

රෝමාශ පුතාගේ තාත්තා කරන්නේ කුලී වැඩලු. ආර්ථික ප්‍රශ්න නිසා දරුවට දිගටම ප්‍රතිකාර කරන්න බැරි වුණා කියලා අම්මා චන්ද්‍රිකා කිව්වේ ලොකු වේදනාවකින්. ඒ හැමදේමත් එක්ක දැන් මේ ගෙදර ලොකුම ගැටලුව මේ දරුවට කන්න දෙන එකලු.

**"ලොකු වෙන්න වෙන්න පුතාට ඕන කරන කෑම ප්‍රමාණය වැඩි වුණා. පස්සේ තමයි එයා මහත් වුණේ. දැන් දවසට වේල් පහක් හයක් කන්න දෙනවා. වේලකට හාල් කිලෝ එකකවත් බත් ඕනේ. ඒ කාලා අනිත් පැත්තට බඩගිනී කියලා අඬන්න ගන්නවා. කන්න නොදී හිටියොත් ඔලුව බිත්තියේ ගහගන්නවා. මම ඉතින් මෙයාගේ ළඟටම වෙලා ඉන්නවා. රෑට නිදගන්නේ නෑ රෑටත් කන්න ඉල්ලලා විලාප තියනවා. රෑටත් මම ඇහැරන් පුතා ගාවම ඉන්නවා."**

දරුවෙක් කන්න ඉල්ලලා විලාප තියන එක අම්මා කෙනෙක්ගේ හදවත පැලෙන්න තරමේ වේදනාවක් ගේන කාරණාවක්. එහෙමයි කියලා නිතරම එහෙම කන්න දෙන්න අපහසු නිසා වැඩිපුරම පුතාට දෙන්නේ කොස් ඇට, කොස්, පොල්, කුරුම්බා වගේ ජාතිලු.

**"මොන දේ දුන්නත් කනවා. වෙලාවකට අපි බඩගින්නේ ඉඳලා අපේ කෑමත් පුතාට දෙනවා. අනික මෙහෙම කන්න දෙන්න හොඳත් නැහැනේ. කාලා කාලම මගේ දරුවා මැරිලා යයි."**

අවුරුදු 12හේ මේ පුතාගේ බර 130Kgක්. රෝමාශ පුතාට තියෙන්නේ අසනීප තත්ත්වයක්. ඒකට විසඳුම ඉල්ලන තරමට කන්න දෙන එක නෙමෙයි. ඉක්මනින්ම පුතාව වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු කරන්න උදව්වක් දෙන්න පුළුවන් නම් මේ පුතාට කරන්න පුළුවන් ලොකුම උපකාරේ ඒක.

**"පුතා නිදගන්නේ පොළොවේ රෙදි කෑල්ලක් දාලා. එයාට කොට්ටයක්, මෙට්ටයක්වත් නැහැ. වැසිකිළි කරන්නෙත් ගේ ඇතුළෙමයි. අපිට තියෙන ප්‍රශ්න එක්කලා පුතාට ප්‍රතිකාර කරන්න අමාරුයි. පුළුවන් කෙනෙක් ඉන්නවා නම් පුතාව හොඳ දොස්තර කෙනෙක්ට පෙන්වන්න උදව් කරන්න කියලා තමයි අපි වැඳලා ඉල්ලන්නේ."**

රෝමාශ පුතාගේ අම්මා කතා කළේ ඇඬූ කඳුළින්. දරුවෙක් විඳින මෙහෙව් වේදනාවක් ඉවසන්න කොයි අම්මටද පුළුවන්? රෝමාශ පුතාගේ අසනීපේ නිසා බොහෝදෙනෙක් ඒ අයව කොන් කරලා කියලාත් ඒ අම්මා අපිත් එක්කලා කිව්වා.

**"විශේෂ දරුවන්ගේ ඉස්කෝලේට පුතාව දාන්න හැදුවා. නිතරම බඩගිනි හැදෙන නිසා ඉස්කෝලෙට ගන්නත් බෑ කිව්වා. ගොඩක් අය දරුවව පිළිකුල් කරනවා. ගමේ ළමයි මෙයාට තඩියා, මෝඩයා කියලා විහිලු කරනවා. අපේම නෑයෝ පවා අපිව කොන් කරලා තියෙන්නේ. පුතාව ඉස්පිරිතාලෙකට අරන් යන්න වාහනයක් එන්නේ නැහැ. මෙයා ඇඳේ මුත්‍රා කරගන්නවා කියලා අප්පිරියාවයි කියනවා."**

අලි මදිවට කොටි කියන්නා වාගේ දරුවගේ අසනීප මදිවට පුතාගේ අම්මලාට මේ වගේ ප්‍රශ්නවලටත් මුහුණ දෙන්න වෙලා. අර මම මුලින් කියාපු ඛේදාන්ත කතා වගේ මේ පුතාගේ කතාවත් ඛේදාන්තයක් වෙන්න දෙන්න එපා කියන එකයි අපේ ඉල්ලීම. උණුවෙන හදවතකින් මේ පුතා දිහා බලලා ඔහුට උපකාර කරන්න කැමති නම් 0765469075 පුතාගේ අම්මා චන්ද්‍රිකාට මේ අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

ජායාරූප: කාංචන කුමාර ආරියදාස



අත්තනායක එම්. හේරත්

# දූට පුළුවන්ද පොලියානා වගේ වෙන්න?



රත්තරන් දුවේ


කුරුණෑගල සිප්විින් ආයතනයේ උසස් පෙළ දරුවන්ට උගන්වන විට හැකිතරම් විෂය නිර්දේශයට පරිබාහිර සාහිත්‍යමය කාරණාවන් දරුවන්ගේ සිත්වලට කාවැද්දීමට මම උත්සාහ දැරුවා. ඒක ටිකක් අමාරු වැඩක්. සිංහල උගන්වන ගුරුවරුන්ගෙන් (අමතර පංති) වැඩිදෙනෙක් පුංචි දුවලගේ පුතාලගේ ලෝකයට කාවද්දන්න හදන්නේ ලිංගිකත්වයට කිට්ටු දෙපිට කැපෙන කුණුහරුප. ඒ අය ඒක ළමයින්ට හුරු කරලා තිබුණ හින්ද උසස් පෙළදී දැනුම දෙන්න උගන්වන ගුරුවරයාට පරාජය බාරගන්න වෙන්නේ.

ඉතින් මං එදා උදාහරණෙට ගත්තේ 'පොලියානා' ළමා නවකතාව. ඒකේ ඉන්නවා පොලියානා කියලා දුවෙක්. ඒ දුවගේ අම්මා විවාහවෙලා තිබුණේ කතෝලික පූජකයෙක් එක්ක. එයාගේ අම්මා රදල පවුලකට අයිතිවෙලා මේ දුප්පත් පූජකයා එක්ක පැනලා ඇවිල්ලා. ඉතින් පොලියානගෙ ලොකු අම්මලා පොලියානා දිහා හැරිලාවත් බැලුවේ නැහැ. ඒ අය හිටියේ පොලියානා ඉන්න ප්‍රදේශයේ ඉඳලා ගොඩක් ඈත පළාතක. පොලියානාගේ තාත්තා පූජකයෙක්නේ. දුප්පත් පුංචි පොලියානාට සෙල්ලම් බඩුවක්වත් අරන් දෙන්න තාත්තට සල්ලි නැහැ.

දවසක් මේ දේවගැතියට තෑග්ගක් හම්බවුණා. ඒ තමයි හැරමිටි යුගලයක්. තාත්තා ඒක පොලියානාට දුන්නා. පොලියානා අහනවා **"මට මොකටද තාත්තේ කිලිහිකරු දෙකක්?"** තාත්තා කියනවා **"ඒ ගැන ආඩම්බර වෙන්න දුව. දුවට කිහිලිකරු ඕනෙ නැති එක ගැන සතුටුවෙන්න."** තමන්ට ලැබෙන ඕනම දෙයකින් සතුටුවෙන්න තාත්තා පොලියානාට පුරුදු කරා. ඊටපස්සේ වැඩිකල් යන්න මත්තෙන් තාත්තා මියගියා. ටික දවසකින් අම්මත් මියගියා. පොලියානා ගැන දන්න අසල්වැසියෝ පොලියානාව ගෙනිහින් විවාහ නොවෙච්ච එයාගේ ලොකු අම්මට බාර දුන්නා. පොලියානා දුම්රියේ යනකොටත් කල්පනා කරේ තමන්ට ලැබෙන විශාල වලව්ව සහ සුඛෝපභෝගී කාමරය ගැන. ඒත් ලොකු අම්මා පොලියානාට දුන්නේ උඩ තට්ටුවේ කසිකබල් කාමරයක්. ඒකෙ හරිම දුප්පත් ජනේලයක් තිබ්බ ඒක ඇරියම පහල තට්ටුවට සම්බන්ධ වහලයක් තිබුණා. රාත්‍රියේ උණුසුම හින්ද පොලියානා පැන්නා මේ වහලට. වහලේ උළු ගොඩේ නිදාගත්තා. එයා හිතුවා ඒක තමයි හොඳ, සතුට ඇත්තේ එතැන. පහළ තට්ටුවේ ලොකු අම්මට ඇහුණා වහලෙ සද්දයක්. එයා උඩට ඇවිල්ලා පොලියානා හිතාගෙනම හිටපු විදියේ හොඳ කාමරයක් දුන්නා. ඊටපස්සෙත් එන දුක සතුටට පෙරළන හැටි එයා අත්වින්ද. පොලියානාගේ අම්මට පෙම් බැන්ද අවිවාහක රදලයාට පොලියානා උදව් කළා. **"අම්මා ඔයා දාලා ගිය එකට සතුටුවෙන්න"** පොලියානා එයාට කිව්වා. **"අම්මා දේවගැති තාත්තා එක්ක ගිය හින්ද තමයි ඔයාට උදව් කරන්න මට දැනුම ලැබුණේ."** මේ දරදඬු රදලයා තමන්ගේ දේපළ ඔක්කොම තම අතීත පෙම්වතියගේ දුවට ලිව්වා. ඉතින් දුවේ හැමදේකටම සතුටු වෙන්න. සතුට තුළ තමයි ඊළඟ සැපත උදාවෙන්නේ.

ඉතින් මේ කතාව කියලා මං පංතියෙන් සමුගත්තා. මම කවදාවත් හිතුවේ නැහැ හැමදේකටම සතුටුවීමේ කලාව මගේ පංතියේ දුවකගේ ජීවිතය වෙනස් කරවයි කියලා. ඒ පංතියේ ඉඳලා තියෙනවා දුවක් නිලූ නාරායන කියලා. වාරියපොළ පැත්තේ දුවක්. ඒ දුවගේ අම්මා දුව පුංචි කාලෙම මියගිහින්. අම්මා නැතිවෙලා ටික දවසකින් තාත්තත් මියගිහින්. හරි නම් දුවෙක් ඉපදුණාම ඒක දරුවන්ගේ පිටින් යන සමාජයක්නේ අපට තියෙන්නේ. තනිවෙච්ච දුව මගේ දේශනය අහනකල් හිතාගෙන ඉඳලා තියෙන්නේ හැමදෙයක්ම විපතක් කියලා. දුක තුළමයි සතුට ඇත්තේ කියලා ඒ දුවට තේරෙන්න ගත්තේ එදා ඉඳලා. මේ පුංචි දුව රැක බලාගන්න නිලූගේ පොඩි අම්මා විවාහවෙන එක නැවැත්තුවා. පොඩි අම්මට රස්සාවක් නැති හින්ද එයාගේ ලොකු මාමාත් විවාහයකට ගියේ නැහැ. ආච්චි අම්මත් සීයත් නිලූ වෙනුවෙන් කැපවුණා. ඉතින් පොලියානා කියවන දවස වෙනකොට නිලූගේ හිතේ තිබිලා තියෙනවා මේක මගේ කරුමයක්. තමන් වෙනුවෙන් සියල්ල අතහැරි පොඩි අම්මා, ලොකු මාමා ගැන එයාගේ හිතේ භක්තියක් තිබිලා නැහැ. මං දවසක් ඒ දරුවන්ට කිව්වා ඔයාලව ඔයාලගේ අම්මා තාත්තා පණ වගේ රකිනවා නම් එයාලගේ විශ්වාසය කඩලා විවාහ වෙන්න එපා දුවේ කියලා.

**දුක හිතෙන දේවල් ඇතුළෙමයි සතුට හැංගිලා තියෙන්නේ මගෙ දුවේ. ඒක හොයාගන්න**



ඔන්න ඔය දවස්වල මාතර පැත්තේ කෙනෙක් නිලූව රවටාගෙන යන්න හදනකොට නිලූට මතක් වෙලා මගේ දුක සතුටක් කරගත් ආච්චි, සීයා, පොඩි අම්මා, ලොකු මාමා දාලා ගියොත් ඒ අයට මිනිස්කම තිත්ත වෙයි කියලා. පැනලා යන්න සියල්ල සූදානම් කරගත්ත දුව ඒ ප්‍රේමය අතහැරියා. පස්සේ තමයි නිලූ දැනගත්තේ එයා දැරියන් රවට්ටන කෙනෙක් බව. පොලියානා දුවව බේරුවා. දුව හැරුණා අධ්‍යාපනය දිහාවට. ඇයට උපාධිය දිනාගැනීම ඉතාම පහසු වුණා.

ඉතින් දුවේ ඔයාලා නිතරම ඔයාලගේ ආරක්ෂකයෝ ගැන තුන්වරක්වත් හිතන්න. එහෙම හිතපු හින්ද අනාථ වෙන්න ගිය නිලූ ජීවිතය බේරගත්තා. දුවක් වෙනුවෙන් 'සතුට බෙදාගත් පොලියානා' මෙන් දුවගේ ආච්චි, සීයා, පොඩි අම්මා, ලොකු මාමාට ඒ දුව සතුට බෙදාගැනීමේ ප්‍රීතිය බෙදලා දුන්නා. මගේ දුවේ කියවන්න, ඉක්මනින්ම 'සතුට බෙදන පොලියානා'. මට මතක හැටියට මේ පොත පරිවර්තනය කළේ කත්‍යානා අමරසිංහ. මට ඇගේ නම වැරදුණා නම් සමාවන්න. 'සතුට බෙදන පොලියානා' කියන පොත හොයාගන්න. මේ පොත රචනා කළේ දුව 'එලීනා එච් පෝටර්' කියන ලේඛකයා. මුල් කෘතියේ නම 'Polyana grows up'.

අත්තනායක එම්. හේරත්


ජාවාරම්කරුවන්ට හසුනොවී
වැදගත් විදිහට වැඩ ටික කරගෙන
සතුටින්
රට යන්න
ඔබ රට රස්සාවකට යන්නෙ, ඔබේත් ඔබේ ආදරණීයයන්ගේත් සිහින ඉටු කරගෙන, ජීවිතේ සැපවත් කරගන්න. ඒ යන ගමන, වැදගත් විදිහට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙලා ගියොත් ඔබට පුළුවන් ඔබේ ආරක්ෂාව, රැකියාව පිළිබඳ හොඳ විශ්වාසයක් ඇතුව සතුටින් පිටව යන්න.
රට යනකොට කතා කරන්න 1989
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙන්න.
www.slbfe.lk
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය



**අංජලී බුදවත්ත ජයවර්ධන**
මනෝඋපදේශිකා/ මාධ්‍යවේදිනී



# සිගරට්ටුවෙන් පිච්චුවේ පුංචි දුවව බය කරන්නද?

ළමුන් සමඟ ලිංගික කටයුතු සිදුකිරීමට ඇති කැමැත්ත නැත්නම් 'කෞමාර කාමුකත්වය' කියලා මනෝවිද්‍යාවේදී හඳුන්වන Pedophilia ගැන ලියන්න හිතුණේ උදෙන්ම පත්තරෙන් දැකපු පුවතක් නිසයි.

සිද්ධියට අනුව අතවරයට ලක්වෙලා තිබුණේ වයස අවුරුදු 10ක දියණියක්. මේ වගේ සිද්ධියක් දැක්කහම 'මොන හිතකින් මුන් මෙහෙම කරනවද' කියලයි කාටත් මුලින් හිතෙන්නේ. මනුස්සයෙක්ට මේ වගේ තිරිසන් මානසිකත්වයක් එන්නේ ඔහුගේ නොහැදියාවට වඩා මානසික ව්‍යාකුලත්වයක් නිසයි. ඉතින් මේ දේවල් ගැන දැනුවත් වෙලා ඉන්න එකෙන් තවත් එක මනුස්සයෙක්, දරුවෙක් බේරගන්න අපිට පුළුවන් වේවි.

කෞමාර කාමුකත්වය කියන්නේ මනෝලිංගික අක්‍රමතා කියන කාණ්ඩයට අයත්වෙන දෙයක්. මේ තත්ත්වය අත්විඳින පුද්ගලයින් නිතරම කැමැත්තක් දක්වන්නේ වයස අවුරුදු 12-13 පහළ ගැහැනු දරුවන් හෝ පිරිමි දරුවන්ගෙන් ආශාවන් සංතෘප්ත කරගන්නයි. කලින් කියපු සිදුවීමේදී අතවරයට ලක්වෙච්චි දියණියව සිගරට් එකකින් පුච්චලත් තියෙනවා. ඒ කියන්නේ මේ සිද්ධියේදී කෞමාර කාමුකත්ව ලක්ෂණවලට අමතර පරපීඩිත කාමුකත්ව (Sexual Sadism) ලක්ෂණත් දකින්න තියෙනවා. Sexual Sadism කියන්නේ තමා සමඟ ලිංගිකව එකතුවෙන පුද්ගලයාට කායික වදහිංසා පමුණුවමින් තෘප්තිමත් වීමට. තාම මේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වෙන නිසා අදාළ පුද්ගලයාට පරපීඩිත කාමුකත්වයක් තිබුණද කියලා අපිට කියන්න බැහැ. ඒ පුද්ගලයා දියණියව සිගරට්ටුවෙන් පුච්චනවා කියලා බය කරගෙන තමන්ගේ වැඩේට පොළඹවා ගත්තා වෙන්නත් පුළුවන්. කොහොම නමුත් අදාළ පුද්ගලයාට මානසික විකෘතියක් තියෙනවා කියන එක පැහැදිලියි. ඒ දරුවගේ පාසලේ ගුරුභවතුන්ට ස්තූතිවන්ත වෙන්න ඕනේ දරුවගේ හැසිරීමේ වෙනස ගැන අවධානය යොමු කරලා මේ වෙනුවෙන් ක්‍රියාත්මක වුණාට.

මේ වගේ නින්දිත වැඩ කරන්නේ පීඩිත සමාජ පසුබිම්වලින් එන අය කියලා ඇතැමුන් කියනවා. නැහැ පීඩිත පසුබිම්වලින් එන උදවිය විතරක් නෙවෙයි හොඳ පවුල් පසුබිම්වලින් එන අයත් මේ දේවල් කරනවා. ඒ කියන්නේ මොන තත්ත්වයක හිටියත් මේ වගේ මානසිකත්වයක් ඇතිවෙන්න පුළුවන්. අනික මේ දියණිය සම්බන්ධ ක්‍රියාව කරලා තියෙන්නේ පාසල් ශිෂ්‍යයෙක් කියලනේ කියන්නේ. ඉතින් සමහර වෙලාවට මේ වගේ මානසිකත්වයට වයස බලපාන්නේ නැති අවස්ථාත් තියෙනවා.

> **මේ ලෙඩේ තියෙන අයව පිටින් බලලා අඳුරගන්න බෑ**

කෙනෙක්ගේ මනස ව්‍යාකුල වෙන්න බලපාන හේතු කාරණා කිහිපයක් තියෙනවා. සමාජයීය බලපෑම, මනෝවිද්‍යාත්මක කාරණා, ජානමය සාධක. ඔය ඕනෙම දෙයක් නිසා මිනිස්සුන්ට මානසික ව්‍යාකූලතා ඇතිවෙන්න පුළුවන්. මත්ද්‍රව්‍ය කියන්නේ තවත් ප්‍රබලම සාධකයක්. අරක්කු, ගංජා, කොකේන්, හශීෂ්, හෙරොයින් වගේ දේවල් නිසා විශේෂයෙන්ම මේවයේ අධිමාත්‍රා නිසා මිනිස්සුන්ගේ මධ්‍ය ස්නායු පද්ධතියට (Central Nerve System) බලපෑම් ඇතිවෙනවා. මධ්‍ය ස්නායු පද්ධතිය හේතුකොටගෙන මොළයේ රසායන වෙනස්කම් සිද්ධවෙනවා කියලයි වෛද්‍ය විද්‍යාවෙන් කියැවෙන්නේ. මිනිස්සු මත්පැන් මත්ද්‍රව්‍ය පාවිච්චි කළහම ඔවුන්ගේ මනුස්සකම යටපත් වෙලා තිරිසන්කම එළියට එන්න ගන්නවා. තමාව තමන්ගේ පාලනයෙන් ගිලිහෙනවා. එතකොට පාලනය කරගෙන හිටපු සමහර මනෝභාවයන් කිසිම බාධකයක් නැතුව එළිට එන්න පටන්ගන්නවා. මත්පැන් සහ මත්ද්‍රව්‍ය නිසා අමනක්‍රියා වෙන්නේ එතකොටයි.

මෙහෙම දේවල් සිදු කරන්න ඇතැම් පුද්ගලයන්ට ඔවුන්ගේ අතීතයේ පීඩාකාරී අත්දැකීම් ඒ කියන්නේ නුසුදුසු දෙමාපිය අත්දැකීම්, අපයෝජනයන්ට ලක්වීම් වගේ කාරණාත් බලපාන්න පුළුවන්. ඒ දේවල් නිසාත් පශ්චාත් කම්පන තත්ත්වයන් ඇතිවෙලා ඒ හරහා මානසික අක්‍රමතාවලට ගොදුරු වෙන්න පුළුවන්. තියෙන ප්‍රශ්නේ තමයි මේ මානසික ලෙඩ බාහිර ලෝකයට පේන්නේ නැහැ. මේ පුද්ගලයෝ ඉතා සාමාන්‍ය ලෙස තමයි සමාජයේ හැසිරෙන්නේ. යම් අපරාධයක් වුණාහම තමයි අවධානය යොමුවෙන්නේ. ඒකම තමයි දරුණුම අවදානම. එතකොට අපේ දරුවෝ මේවට ගොදුරු වෙන්නේ අපි නොහිතන විදියට. අපි කොයිතරම් දරුවෝ ආරක්ෂා කළත් මේ අය හරි සූක්ෂම ලෙස පුංචි ඉඩකින් පවා ප්‍රයෝජන ගන්න පෙළඹෙනවා.

සේයා සඳෙව්මි දැරියගේ ඝාතනයත් එවැන්නක්. මත්ද්‍රව්‍ය භාවිතය නිසා විකෘති වූ මනසක් තිබුණු පුද්ගලයෙක් අතින් ඒ සිදුවීම වුණු බව වාර්තා වුණානේ. සමහර මත්ලෝලීන් වින්දිතයා ළාබාලද, වැඩිහිටිද කියලා බලන්නේ නැහැ. ලැබෙන අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නවා. හැබැයි අපි කතා කරපු අර කෞමාර කාමුකත්වය ඇති අය සොයන්නේ ළාබාල දරුවන්ව විතරයි.

තව සිද්ධියක් මතක් වුණා. මම දන්න කාන්තාවකගේ සැමියෙක් අතීතයේ ඉඳලම ජංගම දුරකතනයෙන් නිල් චිත්‍රපට බලන්න පෙළඹිලා හිටියලු. ඒ කාරණාව ඇය එතරම් ගාණකට අරගෙන නැහැ. නමුත් මෑතක ඉඳලා සැමියා නරඹන්නේ වැඩිහිටි පිරිමි ළාබාල දරුවන් සමඟ කරන ලිංගික ක්‍රියා බව ඇයට තේරිලා. ඒක එතරම් හොඳ දෙයක් නොවන බව තේරුම්ගත්තු බිරිඳ ඔහුව මනෝ ප්‍රතිකාරවලට යොමු කරලා ඔහුව ඒ තත්ත්වයෙන් මුදවගෙන තියෙනවා. මේ බිරිඳ ඇත්තටම අගය කළ යුතු බිරිඳක්. තමන්ගේ සැමියා මොන නින්දිත ක්‍රියාවක් කළත් ඒවා සාධාරණීකරණය කරන කාන්තාවනුත් මට හමුවෙලා තියෙනවා. ඒත් මේ විදියට සැමියගේ අසාමාන්‍ය බව තේරුම් අරගෙන පිළියමක් යෙදීමට උත්සාහ කරන කාන්තාවන් සැබෑ ලෙස සමාජයට හිතැති කාර්යයන් සිදුකරන්නියන්. තත්ත්වය හඳුනාගෙන නිසි ක්‍රියාමාර්ග ගන්නවා නම් ඒ පුද්ගලයාට වගේම ඔවුන්ගෙන් දරුවන්ට වෙන්න පුළුවන් අවැඩත් නතර කරන්න පුළුවන්.

අපි ජීවත්වන සමාජයේ කොහොම කොතැන මෙහෙම දේවල් වෙනවද කියලා අපි දන්නේ නෑ. හැබැයි මෙහෙම දේවලුත් ලෝකේ තියෙනවා, මෙහෙම දේවලුත් වෙන්න පුළුවන් කියලා අවබෝධයෙන් ඉන්න. එතකොට ඔබටත් ඔබේ දරුවන්ව ආරක්ෂා කරගන්න පුළුවන්.

ධරණී

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය
0112 127204
දැන්වීම් අංශය
0112672601, 0112672603, 0761393811
ෆැක්ස්
0112 673 451

ධරණී

පුවත්පත නිවසටම ගෙන්වාගන්න අමතන්න 076 1367 623




දැන්වීමකි

# අත් පාද හිරිවැටීමෙන් පීඩා විඳින ඔබට ස්ථිර සුවයට හෝමියෝපති



අපූරුවට දුවලා පැනලා ඇවිදලා ගිය අයකු ක්‍රම ක්‍රමයෙන් මන්දගාමීව බයෙන් බයෙන් අඩිය තබා යනවා ඔබ දුටුවාද, කාලය ගෙවී යාමත් සමග මෙවැනි තත්ත්වයකට ඔබද ගොදුරු විය හැකිය. පාදයක නොදැනීම හිරිය ලෙස හඳුන්වනවා. හිරිය රෝගයක් නොව රෝගී




ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය. පාදයක දැනීම නොදැනීයාම, කුඹී දුවනවා වගේ දැනිම, ඉදිකටු අනිනවා වගේ දැනීම, පිච්චෙනවා වගේ දැනීම හිරි වැටුණු පාදයක රෝග ලක්ෂණයි.

කොන්ද ආශ්‍රිත කශේරුකා වෙනස්වීමකදී විශේෂයෙන්ම (L2) කොන්ද මැද සිට කලවා උඩු කොටස, (L3) කලවා හා දණහිස දක්වාද, (L4) කොන්දේ සිට මහපට ඇඟිල්ල දක්වාද,(L5) කොන්දේ සිට පාදයේ සුලඟිල්ල හැර ඉතිරි ඇඟිලි හා විළුඹ කොටස, (S1) කොන්දේ සිට සුලඟිල්ල දක්වා යන ස්ථානවල වෙනස්වීමකදී හිරිවැටීම ඇතිවිය හැකියි. අප නොසිතූ මොහොතක සිදුවන අනතුරු නිසා පාදයේ පිහිටා ඇති Femoral Nerve තුවාල වීමද හිරියට තව එක් සාධකයකි. විශේෂයෙන් වයසට යාමත් සමග ඇතිවන කැල්සියම් (Ca), පොස්පරස් (P), මැග්නීසියම් (Mg) වල පෝෂණ ඌනතාවද, නහරවල සිහින්තාවද,

- තයිරොක්සින් හෝර්මොනයේ අසමතුලිතතාව
- දියවැඩියාව
- පාද නහර ගැටගැසීමද
- දීර්ඝ කාලීනව භාවිත කරන ඇතැම් ඖෂධවල අතුරු ආබාධ නිසාද හිරිවැටීම ඇතිවිය හැක.
- විටමින් ඌනතාව (විටමින් B1 , B6 , B12 , E)

මෙවැනි හේතු සාධක හේතු කොට ගත් පාද හිරිය නැති කිරීමට රෝග මූලය (හේතු සාධනය) යථා තත්ත්වය ගෙන දෙන ප්‍රතිකාරය හෝමියෝපති ප්‍රතිකාරය තුළ ඇත. විවිධ වූ ඖෂධ දහස් සංඛ්‍යාවන් අතරින් රෝගියාට ආවේණික වූ නිවැරැදි ඖෂධය තෝරා දීම තළ රෝග ලක්ෂණය නැතිව යන්නේ හෝමියෝපති සිද්ධාන්තයට අනුවය. සමාන දෙයින් සමාන දේ සුවපත් වේ. යන න්‍යාය මතය. එහිදී හිරියට හේතු වූයේ කශේරුකා අතර කාටිලේජ ගෙවීයාමක් නිසා ස්නායු තදවීමෙන් නම් මේ නිසා ඇතිවූ හිරිය නැතිව යන්නේ තෙරපුමට හේතු වූ ගෙවී ගිය කාටිලේජ් නැවත වර්ධනයත් සමග තෙරපීම නැතිවී යාමෙන්ය. නහර ගැට ගැසීම නැවත යථා තත්ත්වයට සැකසීමද, සෑම අසමතුලිතතාවන්ට සමතුලිතතාවයට පත්වීම ඕනම වයසක කෙනකු මේ තුළින් සුවය ලැබිය හැක.




ඉතාම සාර්ථක ප්‍රතිකාර ක්‍රමයක්, ඖෂධ තිත්ත රසයෙන් යුක්ත නැහැ. පාවිච්චිය හරිම පහසුයි, ලෙහෙසියි. එක රෝගයකට ප්‍රතිකාර ගත් විට ශරීරයේ අප දැනුවත් හෝ නොදැනුවත්ව තිබෙන අනෙකුත් රෝගී තත්වයන් නැතිව යාමක් සිදුවෙනවා. ප්‍රතිශක්තිය ගොඩනැගීම මේ තුළින් සිදුවන නිසා රෝග සෑදීම වළක්වා ගැනීමටත් මෙය මහඟු ප්‍රතිකාරයක් වනවා.

ඔබ වයසට ගියත් මහලු වුවත් තාරුණ්‍යයට රැගෙන යන මෙම ප්‍රතිකාර ක්‍රමය තුළ ඔබගේ හිරිවැටීම පමණක් නොව ඔබගේ සෑම රෝගයක් සඳහාම සුවය අත්දකින්න. ඔබට නිරෝගී ජීවිතයක් මෙම ප්‍රතිකාර ක්‍රමය තුළින් නිසැකවම උරුම වනු ඇත.



සුවහසක් රෝගීන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමයෙන් සුවපත් කරන එච්.කේ. හෝමියෝපති ආරෝග්‍යශාලාවේ නිර්මාතෘ
වෛද්‍ය අනුෂා හේමකුමාර

සටහන ජේ. ඒ. සී. ශාන්ත කුමාර

විමසීම් :
එච්. කේ. හෝමියෝපති
හෙල්ත් කෙයාර් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ්
නො.12, පී.බී. අල්විස් පෙරේරා මාවත,
කටුබැද්ද, මොරටුව.
0112 637740/ 0112 637741
071 8250716 / 071 8250717

# මගේ දරුවෙක් වෙලා මගේ කුසේ ඉපදෙන්න ප්‍රාර්ථනා කරනවා කියලා දුවෙක් ලියලා තිබුණා

## මිලාගිරිය ශාන්ත පාවුළු විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමිය

## ආචාර්ය සුමේධා ජයවීර

## (ආචාර්ය උපාධියක් සහිත ලංකාවේ පළමු සහ එකම විදුහල්පතිනිය)

**"පාසල් දරුවන්ගේ නරක දරුවෝ කියලා කොට්ඨාසයක් නැහැ. කොහෙද නරක දරුවෝ ඉන්නේ?"**

**මෙයට වසරකට පමණ පෙර විකාශය වූ දොරමඩලාව වැඩසටහනකදී විද්වත් මණ්ඩලයේ විද්වතියකගෙන් ඇසුනු කතාවකි. දරුවන්ගේ වැරදිම දකින වැඩිහිටියන් සුලබ රටක දරු පාර්ශවය වෙනුවෙන් කතා කළ ඇය සැබෑම විද්වතියක් යැයි මොහොතකින් සිතුනු නිසා මා ඇය කවුදැයි විපරම් කළ අතර, ඇය මිලාගිරිය ශාන්ත පාවුළු බාලිකා පාසලේ ගරු විදුහල්පතිතුමිය බව දැනුවත් වුණෙමි. ශාන්ත පාවුළු බාලිකා පාසල ඉහළ සංවර්ධනයක් කරා රැගෙන ගිය දරුවන්ට ආදරය කරන විදුහල්පතිතුමියක් ලෙස එවකටත් ඈ ප්‍රකටය.**

**එදින දොරමඩලාවෙන් දුටු ඒ විශේෂ විදුහල්පතිනියව දිනක මුණගැසී කතාබහ කරන්නට ලැබෙතැයි නොසිතුවත් ඇය සමඟ එසේ කතා කරන්නට මට අවස්ථාවක් ලැබුණේ ඇය ලංකාවේ ආචාර්ය උපාධිය සහිත ප්‍රථම සහ එකම විදුහල්පතිනිය යන විශේෂ පුවත දැනගත් පසුවය. මේ මිලාගිරිය ශාන්ත පාවුළු බාලිකා පාසලේ ගරු විදුහල්පතිනිය ආචාර්ය සුමේධා ජයවීර සමඟ කළ ඒ කතාබහේ සටහනයි.**




"පළවැනි පත්වීම ලැබුණේ මහියංගණය මැදඹය කනිෂ්ඨ විද්‍යාලයට, විද්‍යාව ගුරුතුමියක් විදියට. එතකොට මට 23යි. මහියංගණේ ඉඳලාත් හැතැප්ම 20කට එහායි ඉස්කෝලේ තිබුණේ. මගේ බෝඩිම තිබුණේ ටවුන් එකේ. බෝඩිමට යන්න බස් එක ගන්න ඉස්කෝලේ ළඟ ඉඳලා ඉරිඟු හේනක් මැදින් කිලෝමීටරයක් පයින් යන්න ඕනේ. ඒ පැත්තේ හරියට අලි. ඉතින් ඉස්කෝලේ ලොකු පංතිවල පුතාලා හතර පහක් මාත් එක්ක තනියට එනවා. බස් එක එනකල් අපි ගල්පොත්තක් උඩ ඉඳගෙන කතා කරනවා. ඒ දරුවන්ට හරි අගහිඟකම්. හේන්වල වැඩ කරන්න පිරිස මදි නිසා අස්වනු නෙළන කාලෙට ඉස්කෝලේ එන්නේ නැහැ. ඉස්කෝලේ යන එකේ වැදගත්කම ගැන මම පුතාලට පැහැදිලි කරනවා. ඒ මතක හරි ලස්සනයි."

අද මෙන් නොව එකල ගුරුවරියන්ට වසර තුනක දුෂ්කර සේවාව අනිවාර්යය විය. පවුලේ හිතවත්කම් මත තරමක් හෝ ළඟ පාසලක් ලබාගැනීමට හැකියාව තිබුණද සුමේධා ජයවීර මහියංගණය පාසලට ගියේ මහත් ආසාවෙනි. ඈ කොළඹට කිරි ගමට කැකිරි තාලේ ගුරුවරියක් නොවීම එයට හේතුවයි.

**"මගේ තාත්තා ජයවීර විජයපාල. 'සුදු වැද්ද' පොත පරිවර්තනය කළේ ඔහුයි. ඔහු අමාත්‍ය ලේකම්වරයෙක්. පවුලට නංගිලා දෙන්නයි මමයි. පුංචි කාලේ අපි හැදුනේ ගස් ගල් උඩමයි. අපිට ටියුෂන් නැහැ. හැබැයි හොඳට ඉගෙනගත්තා. මට මුලින්ම ඕන වුණේ වෛද්‍යවරියක් වෙන්න. ඒකට උසස් පෙළින් පුංචි ලකුණු ප්‍රමාණයක් මදි වුණා. ඔහොම ඉන්දැද්දි 88/89 කලබල ආවා. ඒවත් එක්ක ආයෙත් උසස් පෙළ කරන්න අපහසු නිසා කැම්පස් යන්න හිතුවා. ඔය කාලෙදි අවුරුදු තුනකට කැම්පස් වැහුවා. ඒ නිසා විද්‍යාපීඨ ඇතුළු වෙලා ගුරුවරියක් විදියට පුහුණු වුණා. විශ්වවිද්‍යාල විවෘත කළාම උපාධියත් සම්පූර්ණ කළා. ඒ කරලා තමයි මහියංගණේ ඉස්කෝලෙට ගියේ. දුෂ්කර පාසලකයි කොළඹ ඉස්කෝලවලයි තියෙන අසමානතාවය එතැනින් මම දැක්කා. කොළඹ තියෙන පහසුකම්වලින් උපරිම ප්‍රයෝජන ගන්න ඒ අත්දැකීම රුකුලක්."**

විද්‍යා ගුරුවරියක ලෙස ඇගේ සේවා කාලය වසර දහයකි. ඒ වසර දහය ඇතුළත පරිපාලන සේවා විභාගය ලිවීමට සූදානමින් හිටියත් ඒ කාලසීමාව තුළ පරිපාලන සේවා විභාග නොපැවැත්විණි.

"අධ්‍යාපන පරිපාලන සේවා තරඟ විභාගය මුලින්ම ලිව්වේ 2002දී. ඒත් ඒකේ ප්‍රතිඵල නිකුත් වුණේ නැහැ. 2005දී නැවතත් විභාගය ලියලා තමයි අධ්‍යාපන පරිපාලන සේවයට එකතු වුණේ."

ආචාර්ය සුමේධා ජයවීර විදුහල්පතිනියගේ පරිපාලන අංශයේ මුල්ම පත්වීම කොළඹ ඩී.එස්.සේනානායක විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිනිය ලෙසයි. විද්‍යාලයේ වසර තුනක් සේවය කළ ඇයගේ ඊළඟ පත්වීම කොළඹ රාජකීය විද්‍යාලයේ මධ්‍යම අංශයේ විදුහල්පතිනියයි. නැවතත් තර්ස්ටන් විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිනිය ලෙස සේවය කළ ආචාර්ය සුමේධා මිලාගිරිය ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය ලෙස වැඩ භාරගත්තේ 2015 වර්ෂයේදීයි.

"විදුහල්පතිනියක් විදියට සේවය කරන්න අරන් අවුරුදු 8ක්. මම පශ්චාත් උපාධියත් කරලයි හිටියේ. ඉතින් ආචාර්ය උපාධිය කරගන්න ඕනේ කියන එක කාලෙක ඉඳලා හිතේ තිබුණා. ඒකට අවුරුදු තුනක් යනවා. විදුහල්පතිකමක් කියන්නේ බොහොම භාරදූර වගකීමක්. ඒ වැඩත් එක්ක ආචාර්ය උපාධිය කරන්න කාලයක් තිබුණේ නැහැ. 2019දී මම මගේ පර්යේෂණ මාතෘකාව කැම්පස් එකට බාරදුන්නා. ඒ බාරදීලා ඉද්දි තමයි 2020දි කොවිඩ් ආවේ. ඉතින් ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන අරගෙන ආචාර්ය උපාධිය සම්පූර්ණ කළා. අධ්‍යාපනයේ යෙදී සිටින අධ්‍යාපන නිලධාරීන්ගේ (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන නිලධාරීන්, විදුහල්පතිවරුන්) වෘත්තිකභාවය ගැන තමයි PHD රිසර්ච් එක හැටියට කළේ. අපේ රටේ වෘත්තිකභාවය සම්බන්ධ ගැටලු රාශියක් තියෙනවා. මම ඒ හැම කාරණාවක් ගැනම රිසර්ච් කළා. එතැනදි මට රටවල් 16ක් එයාලගේ අධ්‍යාපන පද්ධතිවල වෘත්තිකභාවය කළමනාකරණය කරගන්නේ කොහොමද කියන එක ඉගෙනගන්න ලැබුණා. විදුහල්පතිවරියක් විදියට වැඩ කරද්දි ඒ දේවල් මට ප්‍රායෝගිකවත් භාවිතා කරන්න පුළුවන්."

ආචාර්ය උපාධිය ගැනීමටත් පෙර සිටම ඈ අවවාදයට වඩා ආදර්ශය උතුම් කොට සලකමින් ප්‍රායෝගිකව වැඩ කළ විදුහල්පතිමවකි. මිලාගිරිය ශාන්ත පාවුළු බාලිකා පාසලේ අද සංවර්ධනය පිටුපස ඇති යෝධ හස්තය ඈ බව කවුරුත් දන්නා කරුණකි.

"මම ඉස්කෝලෙට යනකොට දරුවන්ගේ විනය ගැටලු තිබුණා. විභාග පාස්වෙන නිකන්ම උගත්තු බිහි කරලා වැඩක් නැහැ. දශක ගාණක් තිස්සේ අපි උගත්තු බිහිකළා. අද අපේ රටට මොනවද ලැබිලා තියෙන්නේ? ඒ නිසා මුලින්ම හදන්න ඕනේ දරුවන්ගේ විනය, සාරධර්ම. අදටත් හැම සඳුදම උදේ රැස්වීම තියලා දරුවෝ එක්ක කරුණු කතා කරනවා. දරුවොත් හරි ආසාවෙන් අහගෙන ඉන්නවා. හැම පංතියක පංතිභාර ගුරුතුමියට CR පොතක් දීලා තියෙනවා. පොතේ එක පිටුවක් එක දරුවෙක්ට වෙන් කරලා තියෙනවා. දරුවෙක්ගේ පුංචි වෙනසක් දැක්කත් ඒ පොතේ ලියන්න ඕනේ.




ඒ ගැන හොයලා බලන්න ඕනේ. දරුවෙක්ට ගැටලුවක් වුණා කියලා හිතන්නකෝ. එතකොට ගන්නවා දරුවගේ 7, 8, 9 පොත් ටික. ප්‍රශ්නේ වුණේ කොතැනින්ද කියලා ඒ ටික බැලුවහම හොයාගන්න පුළුවන්. ඔය වගේ දේවල් නිසා මගේ දරුවන්ගේ විනය හැදුනා. මගේ ඉස්කෝලේ විනය මණ්ඩලයක් නැහැ. මම හිතන්නේ විනය මණ්ඩලයක් නැති ලංකාවේ එකම පාසල මේ පාසල වෙන්න ඇති."

විනය ගැටලුවට විසඳුම් දෙමින් තිබියදී ඇයට විසඳීමට වූ තවත් ගැටලුවකි. ඒ පාසලේ කුණු පරිවහනයට හරිහමන් ක්‍රමවේදයක් නොතිබීමයි. ඒ ගැටලුව විසඳීමට සුමේධා විදුහල්පතිනිය තව අපූරු උපක්‍රමයක් යෙදුවාය.

**"දරුවෙක්ට ඉගෙනගන්න යහපත් ඉගෙනුම් පරිසරයක් තියෙන්න ඕනේ. පාර්සල් වෙනුවට කෑම පෙට්ටිවල කෑම ගේන්න කියලා මම දරුවන්ට ආදරෙන් කිව්වා. කුණු බඳුන් අයින් කළා. ආපනශාලාව ළඟ ඇරුණම වෙන කිසිම තැනක කසල බඳුන් නැහැ. තමන් ගේන අපද්‍රව්‍ය තමන්ම අරගෙන යන්න ඕනේ. දවසයි දෙකයි ගියේ. දරුවෝ ඒ ක්‍රමේට හැඩගැහුනා. පස්සේ අපි මුළු පාසලේම මල් වැව්වා. පාසලේ මුදල් සකසුරුවමින් වියදම් කරලා 2018දී ඉස්කෝලෙට සෝලා ක්‍රමේ ගෙනාවා. ඒකත් එක්ක ලංකාවේ පළමු හරිත පාසල කියන ශීර්ෂය අපිට ලැබුණා."**

බොහෝ දරුවන් පෞද්ගලික ගැටලු ගුරුවරුන් සමඟ මුහුණට මුහුණ කතා කරන්නට බියක් දක්වයි. ඒ ගැටලුවට විසඳුම 'විදුහල්පතිනියට ලියුමක්' මැයෙන් පාසලේ ඇති ලියුම් පෙට්ටියයි.





# මම කවදාවත් දරුවෙක්ට අත උස්සලා නැහැ. මගේ ගුරුවරුන්ට අත උස්සන්න දීලත් නැහැ





"දරුවෝ එයාලගේ පෞද්ගලික ප්‍රශ්න ගැන ලියලා දනවා. මංම තමයි ඒවා බලන්නෙ. ලියුම් ලියද්දි ගොඩක් දරුවෝ මට ආමන්ත්‍රණය කරලා තියෙන්නේ 'අම්මා' කියලා. 'ආයේ ආත්මෙක මගේ දරුවෙක් වෙලා මගේ බඩේ ඉපදෙන්න ප්‍රාර්ථනා කරනවා' කියලා දවසක් දුවෙක් ලියලා තිබුණා. ඒවා මගේ ගුරු ජීවිතේ බොහොම සංවේදී තැන්."

සාරධර්ම ඇති දරුවන් හදන්නට වේවැල් කෝටු නාරං සියඹලා අතු දරුවන්ගේ දෑසට පෑ යුතු යැයි සිතන ගුරුවරු අදටද දුලබ නැත. එහෙත් ආදරෙන් විනා දඬුවමින් දරුවන් තැනීම විදුහල්පති සුමේධා ජයවීරගේ ක්‍රමය නොවේ.

"මම කවදාවත් දරුවෙක්ට අත උස්සලා නැහැ. මගේ ගුරුවරුන්ට අත උස්සන්න දීලත් නැහැ. ඉස්කෝලෙට ආපු මුල් කාලේ මගේ වැඩේම ඉස්කෝලේ වටේ ඇවිදින එක ටීචර්ස්ලා දරුවන්ව දණ ගස්සලාද බලන්න. මම ඒ දඬුවම් ක්‍රම නතර කළා. දරුවෝ වුණත් ලස්සනට හැදුනේ ඊටපස්සේ."

ආර්ථික අපහසුතා ඇති දරුවන් 72ක් තෝරාගෙන ඔවුන්ට ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීමද සුමේධා විදුහල්පතිනියගේ සංකල්පයකි. ශාන්ත පාවුළු විද්‍යාලයේ එංගලන්ත ආදිශිෂ්‍ය කණ්ඩායමේ මුදල් පරිත්‍යාගයෙන් ලැබෙන මෙම ශිෂ්‍යත්ව 72 පාසලේ ආර්ථික අපහසුතා සහිත දරුවන්ට මහත් රුකුළකි.

**"ඔය වැඩ ටික කරද්දි පාසල වගේම දරුවොත් දියුණු වුණා. 2015 මම එද්දි පාසලේ ගණිත අංශය සමත් ප්‍රතිශතය තිබුණේ 36%යි. දැන් විද්‍යාව, ගණිත අංශ දෙකම සමත් ප්‍රතිශතය 75%යි. අපේ පාසලෙන් දරුවෝ 12 වාර්ෂිකව වෛද්‍ය විද්‍යාලයට යනවා. ඉංජිනේරු පීඨයට දරුවෝ 7ක්, විශ්වවිද්‍යාලවලට යන පිරිස 150ට වැඩියි. මේ අවුරුද්දේ A නවයක් තිබුණු දරුවෝ 67ක් හිටියා. මම එද්දි 163ට තිබුණු ශිෂ්‍යත්ව කඩයිම් ලකුණ දැන් 185 දක්වා වැඩි වෙලා."**

ඇගේ කැපකිරීමෙන් ලැබුණු ඒ ජයග්‍රහණ නිසාම 2019 වර්ෂයේ ජාතික මට්ටමේ විදුහල්පති විශිෂ්ඨතා සම්මානයෙන් පිදුම් ලැබීමටද ඇයට හැකි විය.

"මගේ සැමියාගේ නම සරත්. ඔහු ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ඉංජිනේරුවරයෙක්. ඔය හැම ජයග්‍රහණයක් පිටිපස්සෙම ඔහුත් ඉන්නවා. මට දුවෙකුයි, පුතෙකුයි ඉන්නවා. අධ්‍යාපන පරිපාලන සේවා විභාගය කරනකොට දුවට මාස හතරයි. එතකොට සැමියා හිටියේ විදේශගතවෙලා. දුව පොඩි නිසා මම විභාගෙ කරන්න බැහැ කිව්වා. ඔයා මේක ලියන්නම ඕනේ කියලා එහෙ ඉඳගෙන මාව දිරිගැන්නුවේ සැමියා. තමන්ගේ ජීවිතේට ගැළපෙන සහකාරයා හොයාගන්න ඕනේ නිසි වයසට ආවට පස්සෙයි. එතකොට හරි කෙනා තෝරගන්න දැනුම තියෙනවා කියලා මම පාසලේ දූලටත් නිතරම කියනවා."

ආචාර්ය සුමේධා ජයවීර විදුහල්පතිනියගේ පුතු සෙනිඳු සහ දියණිය ඉසිනි ඇගේ වෘත්තීය ජීවිතේ සාර්ථකත්වය වෙනුවෙන් කරනා කැපකිරීම් ගැනත් ඈ සිහිපත් කළාය.

"අපේ ගෙදර තියෙන්නේ වේයන්ගොඩ. ඉස්කෝලෙට ආපු මුල් අවුරුදු 4 මම රෑ අට වෙනකල් වැඩ කළා. අදටත් එකහමාරෙන් පස්සේ හය විතර වෙනකල් වැඩ. ගෙදර යන්න එන්න තියාගෙන ඒ වැඩ හරියට කරන්න බැහැනේ. ඉතින් එදා ඉඳලම මම ඉන්නේ විදුහල්පති නේවාසිකාගාරයේ. මගේ පවුලත් මාත් එක්ක නතරවෙලා ඉන්නවා. මොනවා වුණත් නේවාසිකාගාරය ගෙදර වගේ නැහැනේ. ඉතින් මාත් එක්ක එහෙම ඉන්න කැමති වුණ එකම එයාලා කරන ලොකු කැපකිරීමක්."

ලංකාවේ ප්‍රථම ආචාර්ය උපාධිය ලබාගත් මේ විදුහල්පතිතුමිය දරුවන් 4000ක් වෙනුවෙන් ඈ කරනා කැපකිරීම පිළිබඳව පැවසුයේ නිහතමානී ආඩම්බරකමකිනි.

**"මම මගේ වෘත්තිය කරන අනිත් අයටත් කියන්නේ දරුවන්ට සේවය වෙනුවෙන් අවංකවම කැපවෙන්න. ඒ වගේම ඉගෙනගන්න එක නතර කරන්න එපා. ඒක වෘත්තීය සාර්ථකත්වයට හරි වැදගත්. ඒ වගේම විදුහල්පතිතුමියක් විදියට දෙමාපියන්ටත් වචනයක් කියන්න කැමතියි. මේ ලෝකේ කොහේවත් නරක ළමයි නැහැ. ඉපදුණු දවසේ ඉඳලා දරුවෝ දකින්නේ වැඩිහිටියන්ගේ ලෝකය. මේ රට හැමතැනම බොහොම ගුණයහපත් වැඩිහිටියෝ ඉන්නවා නම් දරුවෝ හැදෙන්නෙත් ඒ විදියට. දෙමාපියන්, සමාජය, මාධ්‍ය, පාසල කියන සාධක හතරම දරුවෙක්ගේ වගකීම දරන්න ඕනේ. මුල්ම දේ දරුවන්ට දැනෙන්න ආදරය කරන්න. පුංචි දරුවන්ට විතරක් නෙමෙයි ලොකු දරුවන්ටත් ආදරේ අවධානය දෙන්න."**

ඒ උපදේශය ඇසූ පසු නැවතත් සිහිපත් වුණේ එදා දෙරමඩලාවේදී ඈ කී වචනයි. 'මේ ලෝකේ කොහෙවත් නරක ළමයි නැහැ. නරක දරුවෝ හදන්නේ අපිමයි.' ඒ ආචාර්ය සුමේධා ජයවීර විදුහල්පතිතුමියගේ ආදරණීයම වචනය. ශාන්ත පාවුළු බාලිකාවේ දරු දැරියන් නොවුවද අපේම රටේ දරු දැරියන් වෙනුවෙන් කරනා කැපවීම නිසා මේ විදුහල්පතිනිය ගැන අපද ආඩම්බර විය යුතුයි. ඉදින් භාරදූර වගකීම් සමුදායක් මැද ලබාගත් සියලුම ජයග්‍රහණ වෙනුවෙන් ඇයට අපගේත් සුභාශිංසන!

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි





මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

# සෙනසුරු අපලය ෆේස්බුක් ගිණුමට හරවලා

අපට දුර ඥාති සම්බන්ධතාවක්ද ඇති ඔහු රජය පිළිගත් පුණ්‍යායතනයක පාලක ලේකම්වරයෙකි. මානව ශාස්ත්‍ර විෂයක් සම්බන්ධ පශ්චාත් උපාධියක් පවා හිමි කරගෙන හිඳින ඔහුගේ බිරිඳ උපාධිධාරී ගුරුවරියකි. ඔවුන්ට දියණියන් දෙදෙනකු සිටින අතර ඔවුහුද උසස් අධ්‍යාපනයේ යෙදෙති.

ඉතා සැහැල්ලු විනෝදකාමී මනැසකින් යුතු මෙම පාලක ලේකම්වරයා සමාජ ඇසුරට ඉතා ප්‍රියමනාප අයෙකි. විවේකයක් ලද විටෙක එකම මේසයක් වටා හිඳගෙන සතුටු සාමිචේයි යෙදෙන්නට, ඔහුගෙන් රස කතා තොග පිටින් අසාගත හැක.

එහෙත්, ඔහු හා කිසිදු කතා කළ නොහැකි එකම මාතෘකාවක් පමණක් තිබේ. ඒ නම් ජ්‍යෝතිෂ්‍යයි. අපගේ ජීවිත පවත්වාගෙන යාමට අම්ලකර කොතෙක් වැදගත් වේද? ඔහුගේ ජීවිතය සම්බන්ධයෙන් ජ්‍යෝතිෂ්‍ය ඊටත් වඩා වැදගත් වී ඇති සේය.

මම පෞද්ගලිකව ජ්‍යෝතිෂ්‍ය විශ්වාස නොකරමි. එහෙත් තරුණ කාලයේ සිට ජ්‍යෝතිෂ්‍ය සම්බන්ධ සිද්ධාන්තමය කරුණු තරමක් දුරට හදාරා ඇත්තෙමි. ඔහු තුළ ජ්‍යෝතිෂ්‍ය සම්බන්ධ මෙම අසීමාන්තික උනන්දුව පළවී ඇත්තේ කලක් අප රටේ ප්‍රධාන පාසලක විදුහල්පති ධුරය හෙබවූ ඔහුගේ පියා නිසාය.

**"මගේ තාත්තා මම පුංචි කාලෙම එතකොට අපේ රටේ හොඳම ජ්‍යෝතිර්වේදියා විදියට නම් දරාගන හිටපු ................ මහත්තයා ලවා මගේ සම්පූර්ණ ජීවිත පලාපල විස්තරය පුංචි පොතක් හැටියට ලියවා ගත්තා. ඊටපස්සේ මාත් අකුරු කියැවීමේ හැකියාව ලැබුණු දවසේ ඉඳලම ඒ පොතේ මං ගැන තියෙන විස්තර එක එක කියවලා මගේ ජීවිතයත් එක්ක ගලපන්න පටන්ගත්තා. පුදුමේ කියන්නේ ඒවායින් වැඩි කොටස හරියට හරි. ඒ හින්ද දැන් මට මගේ අනාගතය මොන විදියට ගතවෙයිද කියන එක ගැන පැහැදිලි අදහසක් තියෙනවා."** දිනක් මා හා සුහද කතාබහක යෙදෙන අතරේ ඔහු මා හා කීය.

**"හැබැයි ඉතින් ජ්‍යෝතිෂ්‍ය සිද්ධාන්ත අනුව වුණත් උප්පත්ති කේන්දරේ තියෙන දේවල් ඒ විදියටම සිද්ධ වෙනවා කියන්න බෑ. මොකද ග්‍රහයන්ගේ ගෝචර ගමන් කියන සාධකය මුල් කරගෙන උප්පත්ති කේන්දරේ තියෙන දේවල් වුණත් උඩු යටිකුරු වෙන්න පුළුවන් කියලා තමයි ජ්‍යෝතිෂ්‍යයේ නම් කියන්නේ."** එවිට මමද ඇඟටපතට නොදැනී කීවෙමි.

**"එහෙම වෙන්නේ කොහොමද?"** ඒ දක්වා සාමාන්‍ය ලෙසින් සිටි මගේ හිතවතා අනතුරක ඉව වැටුණු කුකුළෙකු සිය ගෙළ දිගුකර බලන්නාක් මෙන් හිටිහැටියේ තම ස්වරූපය වෙනස්කොට මා දෙස බලමින් ඇසීය.

**"එතකොට දෛවය වෙනස් කරන්න බෑ කියන කතාවත් බොරුද? එතකොට සිද්ධාර්ථ කුමාරයාගේ හඳහන බලපු බමුණෝ කුමාරයා ගැන අර වගේ අනාවැකියක් කිව්වේ කොහොමද?"** ඔහු තම ප්‍රකෘති ස්වරූපය මුළුමනින් වෙනස් කරගනිමින් ඇසීය.

**"හැබැයි ඉතින් සිද්ධාර්ථ කුමාරයාට නම් තැබීම ගැන කියන බුද්ධවංශ අටුවාව වගේ මුල්ම පොත්වල නම් තියෙන්නේ බමුණෝ කුමාරයාගේ දේහ ලක්ෂණ බලලා ඒ අනාවැකි කිව්වා කියලයි."**

ඒ කතාව තවදුරටත් ඉදිරියට ගෙනයාම මගේ ආත්මාරක්ෂාවට හොඳ නැති බව වටහාගත් මම එම කතාව එතැනින් නිමා කළෙමි.

මගේ එම හිතවතාට ෆේස්බුක් ගිණුමක් තිබේ. මමද ඔහුගේ ෆේස්බුක් මිතුරෙක්මි. එහෙත් එම ෆේස්බුක් ගිණුම නිසා ඔහු අන්‍යයන්ගේ ඇනුම් බැනුම්වලට ලක්වන තරම් දුටුවිට තවත් එවැනි බැනුම් අසන මිනිසෙකු නම් සිටිය නොහැකි බවයි මට හැඟී ගොස් ඇත්තේ.

මගේ හිතවතා එසේ ඇනුම් බැනුම්වලට ලක්වනුයේ අප රටේ අතිශය අපකීර්තියට පත් දේශපාලනඥයන් කිහිපදෙනෙකු සඳහා වන ප්‍රශස්ති කියුම් නිතිපතා තම ෆේස්බුක් ගිණුමට එක්කිරීමෙනි. විශේෂයෙන් මේ පසුගිය කාලයේ පක්ෂීන්ගේ නම්වලින් සමච්චලයට ලක්වූ දේශපාලනඥයින්ගේ නැති ගුණ ගයමින් ඔහු තබන ෆේස්බුක් සටහන් කෙරෙහි කෝප ගැන්වෙන ෆේස්බුක් මිතුරෝ ඔහුට ලවක් දෙවක් නැතිව බැන වදිති.

නමුදු මා දන්නා තරමින් කිසිඳු දේශපාලන පක්ෂයක් කෙරෙහි පමණට වඩා නතු නොවන ඔහු පොදුවේ දේශපාලනය සම්බන්ධයෙන්ද එ... උන්නදුවක් පළ කරන්නෙක් ...



> **කොයි දේ කළත් ජ්‍යොතිෂයට අත තියන්න තහනම්!**

තත්ත්වයක් යටතේ ඔහු එම ජනඅප්‍රිය දේශපාලනඥයන්ගේ නැති ගුණ ගයමින් මෙලෙස අන්‍යයන්ගේ ඇනුම් බැනුම් නින්දා අපහාසවලට බඳුන් වනුයේ මන්දැයි සිතාගැනීමට මට නොහැකි විය. නමුත් ඒ පිළිබඳව ඔහුගෙන් ඍජුව විමසීමේ අවස්ථාවක්ද මට උදා වී නොතිබිණි.

මේ අතර ඉතා මෑතක අපගේ ඥාති පුත්‍රයෙකුගේ විවාහ මංගල්‍ය උත්සවයකදී මට ඒ හිතවතා යළි මුණගැසිනි. එදින ඔහුටත් මටත් පැය කිහිපයක් සතුටු සාමිචියේ යෙදීමේ අවස්ථාව උදාවිය.

විවිධ මාතෘකා ඔස්සේ සුහද කතාබහක යෙදුණු පසුව කෙමෙන් රටේ දේශපාලනය පිළිබඳ කතාබහකට පිවිසෙන අතරේ ඔහුගේ ෆේස්බුක් ගිණුම පිළිබඳව හෙමි හෙමිහිට විමසීමටද මට ඉඩක් ලැබිණි.

**"ඇත්තෙන්ම කියනවානම් උන්ව (ඔහුගේ ෆේස්බුක් ගිණුමින් ඇගැයුමට ලක්වන දේශපාලනඥයන්) මටත් අප්පිරියයි. ඔතන තියෙන්නේ වෙනම කතාවක්."** ඒ වනවිට මදින් මද වචන පටලැවෙන මට්ටමක සිටි ඔහු කීය. එබැවින් මමද මහත් උනන්දුවකින් යුතුව ඔහුට කන් දුන්නෙමි.

**"මේ දවස්වල මට පහුවෙන්නේ සෙනසුරු ඒරාශ්ඨකයක්. ඒකේදි වෙන ප්‍රධානම දේ තමයි සමාජයෙන් නින්දා, අපහාස, ඇනුම් බැනුම්, තාඩන පීඩනවලට ලක්වෙන්න සිද්ධවෙන එක. ඒක මොනම විදියකින්වත් වළක්වන්න බෑ කියලා තමයි ජ්‍යෝතිෂ්‍යයේ තියෙන්නේ. ඒත් මම තරමක් හරි හොඳ සමාජ තත්ත්වයක් තියෙන කෙනෙක්නේ. ඒ හින්ද ආයතනය තුළදී හරි මම ආශ්‍රය කරන සමාජයේදී හරි ඒ වගේ නින්දා අපහාසවලට ලක්වෙන එක කීයටවත් කරන්න බැරි දෙයක්නේ. ඒ හින්දම තමයි මම මගේ ෆේස්බුක් එකවුන්ට් එකට ඔය වගේ පෝස්ට් දාලා මට ලැබෙන්න තියෙන ඇනුම් බැනුම් ඔක්කොම ඒකට හරවාගෙන තියෙන්නෙ. ඇත්තෙන්ම මම ඒ දාන ඒවා බලලා කවුරුහරි මට බනින තරමට මට සතුටුයි. මොකද එතකොට ඉක්මනින්ම ඒ අපලේ ගෙවාගන්න පුළුවන් හින්ද."** ඔහු කීයේ මා අන්දමන්ද කරවමිනි.

**"ඒත් ඉතින් ඔයාගේ ෆේස්බුක් එකවුන්ට් එකේ ඔයාට මිනිස්සු කියන දේවල් දැකලා නෝනා දුවලා දෙන්නා එහෙම ඔයාට බනින්නේ නැද්ද?"** එම විස්මය තුළින් මම ඇසීමි.

**"මොකද නැත්තේ මට පලු යන්න බනිනවා."** කී ඔහු ඒ සමඟම සිනාසෙමින් කීයේ "ඉතින් මටත් ඕනේ ඒ විදියට බැනුම් අහගන්න නේන්නම්" යනුවෙනි.

ඒ අනුව අප ජීවත්වන පෘථිවියේ සිට කිලෝමීටර් මිලියන 1195 දුරින් පිහිටි සෙනසුරු නිසා කැමැත්තෙන් බැනුම් අසන මේ පෘථිවි තලයේ වෙසෙන එකම මිනිසා ඔහු වීමටද බැරි නැතැයි මට සිතිනි.




**කොමලිගේ කොලම වෙත කවි පැන එවීමේදී**
**පද පේළි 4කින් යුත්**
**එක් කවියක් පමණක්**
**යොමු කිරීමට කාරුණික වන්න.**

මුහුණේ සිරියාව දැක්කම ඉතිරෙනවා
ආලවන්තකම දෑසෙන් වැගිරෙනවා
පාදය තියෙන තාලෙට ඉඟ නළවනවා
කවි සිතුවිලිවලට සිත ඔද්දල් වෙනවා

ආසයි මගේ කරගන්නට ඔබ බාරී
දෙනවද සුරත කරගන්නට හැඩ කාරී
එන බක්මහට කලියෙන් සුරතල් නාරී
පැලට වරෙන් දෑවැදි නැතුවට කාරී

නොයෙකුත් කවි කතා හැඩකර ඔබ ලීවත්
උප්පැන්නෙ හැටියට කොමලී වුවත්
මල්ලිට නපුරු වී හොඳ හැටි ගුටි කෑවත්
නුඹ මට සඳක් අමාවකට සඳ නාවත්

එන බාධක මැඩගෙන පෙරටම යනවා
දුන්නොත් මනාපය නුඹෙ සිත නළවනවා
කරවට මාල කනට තෝඩු පළඳනවා
ගොන් බැඳි කරත්තෙන් මම කොළඹට එනවා

**එස්.ඒ.ආර්.ජයවර්ධන**
**පලුගස්දමන**
**පොලොන්නරුව**

කොළඹට එන විටදි පුලතිසි පුරේ සිට
දක්කා කරත්තය නැගිලා ගොනුගෙ පිට
ගොනු කුර ගෙවී තව දින සති ගෙවෙන කොට
ගෙදරට නාකි වේ දෝ බය සිතේ මට

තුති මල් පුදමි කවි කොලමක් ඇරඹුවට
සිතිවිලි අභියෝග ඇරයුම් කෙරෙවුවට
නිති පබඳින්න කවි හැමටම සැලසුවට
සතියක් ගිය පසුව පසසමි නැරඹුවට

කොමලියෙ ඔමරි පා ඉඟ සුඟ නැළෙව්වට
එමලිය හැඩ නේද ඈහට එරෙව්වට
නම ලියලා ඇයට කවි කොළ ඇලෙව්වට
සිරිලිය වගෙලු ගමෙනුත් ඇය එළෙව්වට

**දක්ෂිණී සාවිත්‍රි ප්‍රනාන්දු ද සිල්වා**
**දෙහිවල**

එළවන්නට ඇයව නැත පෙරමුණ ගත්තේ
ඈමයි යන තැනට වැඩ සලසා ගත්තේ
හස්බන්ඩ් පරිස්සම් කරගනු මැන අක්කේ
දැන් ඈ ඉන්නෙ ඇවිදින් දෙහිවල පැත්තේ

**ඔබේ කවි අභියෝග**
කොමලිගේ කොලමට එවීමේදී 0712808985
හෝ dharanee.editor@liberty.lk යන
ඊමේල් ලිපිනයට යොමු කරන්න.
නැතිනම්,
කොමලිගෙ කොලම, ධරණී පුවත්පත,
නො.91, විජේරාම මාවත, කොළඹ 07. යන
ලිපිනයට එවන්න

# රටම ආදරේ මොනර පැටික්කිට මෙදා කතරගම පෙරහර තහනම්ලු





සෙංකඩගල නුවරයි කතරගම් පුරවරයයි දෙකම වැඩිපුර හැඩවෙන්නේ ඇහැළ මහට කියනවනේ. ඒකට හේතුව ඇසළ මාසෙ මේ නගර දෙකේ පැවැත්වෙන පෙරහර මංගල්‍යය. ඒ අතරින් මේ වෙනකොටත් ඓතිහාසික රුහුණු මහා කතරගම දේවාල පෙරහර නම් පටන් අරගෙනයි තියෙන්නේ.

කතරගම පෙරහරේ වඩාත්ම ආකර්ෂණීය අංගය, කතරගම දෙවියන්ගේ වාහනය නිරූපණය කරන මොනර නැටුමනේ. ගිය වතාවේ සසඳි කියලා පුංචි දැරියක් ඒ මොනර නැටුමට ඉදිරිපත් වෙලා 'මොනර පැටික්කි' නමින් රටේම ප්‍රසිද්ධ වුණා ඔබට මතක ඇති. සසඳිගේ ප්‍රසිද්ධිය නිසාම අපි ඇගේ මව එක්ක කතාබහ කරලා 'ධරණී' පත්තරේ ලිපියකුත් පළ කළා. කොහොම නමුත් මේ නැටුමෙන් පස්සේ ශ්‍රවණාබාධිත දැරියක් වුණු සසඳිට රටේම ආදරේ හිමිවුණා. ඒ හින්දම ගොඩාක් අය මෙදා සැරෙත් කතරගම පෙරහරේ මොනර පැටික්කිගේ නැටුම් බලන්න ආසාවෙන් ඉන්න වග අපි දන්නවා. හැබැයි එහෙම බලන් ඉන්න අයට කියන්න තියෙන්නේ ටිකක් දුක හිතෙන කතාවක්.

"මෙදා සැරේ පෙරහරට යන්න අපිටත් ලියුම් ආවා. ඒත් පෙරහරට කලින් රැස්වීමක් තියෙනවා. අපේ දර්ශනී රංගන කලායතනය වෙනුවෙන් මමයි දුවයි ඒකට ගියා. ගියාම කිව්වා දන්වලා එවන්නම් කියලා. ඒත් දන්වලා එව්වේ නෑ. ඉතින් දුවට මෙදා සැරේ කතරගම පෙරහරට යන්න වෙන්නේ නෑ. පොඩි එකී හරිම ආසාවෙන් හිටියේ පෙරහරට යන්න. යාළුවෝ එහෙම එයාගෙන් පෙරහරට යනවද කියලා අහද්දි යනවා කියනවා. අපි තාම කියලා නෑ යන්නේ නෑ කියලා."

සසඳිට වෙලා තියෙන දේ ගැන එහෙම කිව්වේ සජිත් ඉන්දික. සසඳිගෙ තාත්තා.

"දුව ගිය පාර කතරගම පෙරහරේ නටලා ගොඩාක් ප්‍රසිද්ධ වුණා. මං හිතන්නේ කොච්චර මොනර නැටුම් තිබුණත් දුවම ප්‍රසිද්ධ වුණේ කතරගම දෙවියන්ගේ අනුහසකට වෙන්න ඇති. ඒත් දුව ප්‍රසිද්ධ වෙනකොට සමහරක් අයට ඒක බලාගෙන ඉන්න බැරිවුණා. ඒ අයට දුව ගැන ඉරිසියාවක් හිතෙන්න ඇති. සමහර කලායතනවලින් පවා එක එක ප්‍රශ්න ආවා. සසඳි කියන්නේ පුංචි දරුවෙක්නේ කියලාවත් සමහරු හිතුවේ නෑ."

එහෙම කිව්වේ මොනර පැටික්කිගේ අම්මා අරෝෂිකා උදයංගනී. ඒකෙන් මේකෙන් වුණේ මෙදා සැරේ පොඩි එකී ආසාවෙන් යන්න හිටපු කතරගම පෙරහරත් හේතුවක් නැතිවම සසඳිට අහිමිවුණු එක.

"මේ ටිකේම දුව ඉස්කෝලේ යන්න කලින් නැගිටලා අහනවා අද අපි පෙරහරේ නටන්න යනවද කියලා. ඒ පුංචි හිත රිද්දන්න ලෝබයි. ඉතින් අපි බොරුවට කියනවා හෙට අනිද්දට යමු කියලා. එයා මේ ටිකේම ෆෝන් එකෙන් පෙරහර බැලුවා. අපට තේරෙන්නේ නෑ දුවට මේක කොහොම කියන්නද කියලා. අපට යන්න වෙන්නෑ කීවොත් පොඩි එකීට ඒක දරාගන්න බැරිවෙයි."

කොහොම නමුත් කතරගම දෙවි හාමුදුරුවෝ මැදිහත්වෙලා හරි ලබන සැරේවත් මේ පුංචි එකීගේ ආසාව ඉටුකරලා දෙයි කියලයි අපේ විශ්වාසය. මොකද තමන් වෙනුවෙන් තියෙන පෙරහරේ මොනර පැටික්කී නැති අඩුව උන්නාන්සේටත් දැනෙයි නොවැ!

■ **රුවන් එස්.සෙනවිරත්න**


දශක හතක් පුරා ජනතාවගේ විශ්වාසය දිනූ කිරිවත්තුඩුවේ "ක්‍රිමිරාජ" නමින්ම ඉල්ලන්න.

බඩෙ කැක්කුම්, බඩ පුරවා දැමීම, බඩේ අජීර්ණය ඇතුළු ලොකු කුඩා සැමට ඕනෑම බඩේ අමාරුවකට ක්‍රිමිරාජ කරල් ගුලි.

දත් මුල් දියවීම, දත් වලින් ලේ ගැලීම, දත් හිරිවැටීම, දත් සෙලවීම, මුඛයෙන් ගඳ ගැසීම සඳහා ක්‍රිමිරාජ මුඛ ශෝධනය.

පපුවෙ සෙම් ගතිය, කැස්ස, ඇදුම, සෙම හිරවීමට, කැස්ස පැණිය.




ඇතුළු නිෂ්පාදන රැසක් වෙළඳපොලේ




එම්.ඩී. ලිවේරිස් අමරතුංග සහ පුත්‍රයෝ
බාලෞෂධාගාරය, කිරිවත්තුඩුව, හෝමාගම.
011 275 3889



නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ. සෑම මනුෂ්‍යයකුම නීතිය දැන සිටිය යුතුය. නීතිය රැකෙන්නේ ඒ පිළිබඳ දැනුවත්වීමෙනි. එවිට වඩා යහපත් සමාජයකට අඩිතාලම සැකසෙනු ඇත. නීතිය සම්බන්ධව දැනුවත් කිරීමේ ඉදිරි පෙළ චරිතයක් ලෙස ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න සැලකිය හැක. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකි. අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස හෙතෙම වසර තුනක කාලයක් කටයුතු කළේය. ඔහු අපරාධ විද්‍යාව හා යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද, ව්‍යවහාරික විද්‍යාවන් සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් උපාධියක්ද ලබා ඇත. බ්‍රිතාන්‍ය මණ්ඩලය ප්‍රදානය කළ චෙවනින් (Chevening) ශිෂ්‍යත්වයක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ෆුල්බ්‍රයිට් ආයතනයෙන් පිරිනැමූ හියුබට් හම්ෆ්‍රි (Hubert Humphrey) ශිෂ්‍යත්වයක්ද දිනා ඇත. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, රගර් ක්‍රීඩක වෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී සිදුවීම් ගණනාවක නඩුවල පැමිණිල්ල මෙහෙයවීමට දායක වූ ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතියට අදාළව දක්වන අදහස් මෙරට නීති ක්ෂේත්‍රයේ මෙන්ම ඉන් පරිබාහිර තැනැත්තන්ටද වටී. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු 'යළි මැවෙන අපරාධයක්' නමින් ග්‍රන්ථයක්ද රචනා කළේය. එහි සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. රටේ සුප්‍රසිද්ධ නඩු කටයුතු ආශ්‍රිතව ඔහු ලබාදෙන අදහස්ද බෙහෙවින් වැදගත් වේ. තිස්මඩ ඝාතනය එකල රටම කම්පා කළ සිදුවීමකි. කෙතරම් උපක්‍රමශීලීව සිදුකළද අපරාධයක් සදාකාලිකව සැඟවීමට නොහැකි බවට මෙයද උදාහරණයකි. මෙම ලිපිය එම සිදුවීම ආශ්‍රිතවයි.

20 කොටස


# කොස් ගෙඩියක් විසින් කැඳවූ සාක්ෂිකරු තිස්මඩ මිනීමැරුමේ ඝාතකයන් හෙළිකරයි

## පවුලට වාසනාව ගෙනා කුලුඳුල් දියණිය

මහනුවර තිස්මඩ පදිංචිව සිටි මුණසිංහ පවුලට කුළුඳුලේ පැමිණියේ දියණියකි. ඈ සෝමලතා ය. ඇය තමන්ට වාසනාව රැගෙන ආ බව දෙමාපියන් සිතුවාට සැක නැත. සෝමලතා, ලොක්කී වූ මේ පවුලේ සම්පූර්ණ දරුවන් ගණන අටදෙනෙකි. මැණික්දිවෙල මහා විද්‍යාලයේ ඉගෙනගනිද්දීම මේ දැරිය අධ්‍යාපනයේ සමත්කම් දැක්වූවාය. පසුව පිළිමතලාව මධ්‍ය මහා විද්‍යාලයෙන් සරසවි වරම් ලැබූ සෝමලතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට තේරී පත්විය. එය උණුසුම් පුවතක් ලෙස ගම පුරා පැතිර ගියේ තිස්මඩ ගමේ දැරියක් විශ්වවිද්‍යාලයට යාම විස්මිත දෙයක් වූ බැවිනි. සෝමලතාගේ පියා ගමේ වෙද මහත්තයා වූයෙන් ඔවුන්ගේ පවුල ප්‍රදේශයේ ගෞරවයට පාත්‍රව තිබිණ. ගමේම සිටි විස්සකට ආසන්න පවුල් අතරින් වෙද මහත්තයාගේ පවුල කැපී පෙනෙන්නට සෝමලතාද හේතුවක් විය. ඇය උපාධිය සම්පූර්ණ කළ ද වෙද මහත්තයාටත් මෑණියන් වූ එන්සොහාමිටත් සතුට නිමක් නොවීය. සියල්ලෝ රිසි සේ සතුට සැමරූහ. සෝමලතා මුණසිංහටද සිය අනාගතය ගැන බලාපොරොත්තු ගොන්නක් තිබිණ. ඒ වෙනුවෙන් ඈ බොහෝ වෙහෙස වී කටයුතු කළාය.

## දේශපාලන මතය

මුණසිංහ පවුලේ දේශපාලන මතය ගමේ බොහෝ පවුල්වලට වඩා වෙනස් විය. විශේෂයෙන් ඔවුන් මෙන්ම ගමේ පිළිගැනීමට ලක්ව සිටි කුලසිංහ පවුල සමඟ ඔවුන්ට දේශපාලනික වශයෙන් මෙන්ම ඊට පරිබාහිරවද විවිධ මතගැටුම් තිබිණ. කුලසිංහ ගමේ උපතැපැල් ස්ථානාධිපතිවරයායි. ඔහු වෙද මහත්තයාට දුරින් නෑදෑ වන අයෙකි. සෝමලතා අධ්‍යාපනයෙහි ජය කෙහෙළි නංවමින් සිටියේ එවැනි අවදියකදීය. ඇයට රාජ්‍ය සේවයට එක්වීමේ කැමැත්තක්ද තිබිණි. 1970 කැබිනට් මණ්ඩලයේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ධුරය හිමිවූ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක ඒ වනවිට අමුතු ප්‍රතිපත්තියක් හඳුන්වා දී තිබිණ. ඒ, රාජ්‍ය සේවයට එක්වීමට නම් ආසනයේ ආණ්ඩු පක්ෂ නියෝජිතයකු විසින් අදාළ තැනැත්තා නිර්දේශ කරනු ලැබිය යුතු බවයි. 'චිට් ක්‍රමය' ලෙස එකල එය ප්‍රචලිතව තිබිණ. තිස්මඩ ගමේ එම බලය හිමිව තිබුණේ කුලසිංහටයි. එනිසා සෝමලතාට නිර්දේශය ගැනීමට වූයේ අසල්වැසි ගමකිනි. එසේ වුවද ඇගේ අපේක්ෂාව ඉටු නොවීය. පසුව ඇයට මහනුවර වැවිලි කටයුතු කාර්යාලයේ රැකියා අවස්ථාවක් ලැබිණ. පරිවර්තකයකු වූ සිය පෙම්වතා ඇයට හමුවූයේද ඒ අතරදීය. එම සබඳතාව නිවැසියන්ටද රහසක් නොවූ අතර දියණිය නිසි කල වයසේ සිටි බැවින් ඊට ඔවුන්ගේ විරෝධතාවක්ද නොවීය. මාස කිහිපයකට පසු 1971 සැප්තැම්බරයේ විවාහයට එළැඹීමටද සෝමලතා සහ පෙම්වතා සූදනමින් සිටියහ.



ඔහු යමක් නරඹන අයුරු සේනපාල නිරීක්ෂණය කළේය. ඒ සමඟම ඔහු දුටුවේ රිචඩ් නමැති අයවයි

## අනාගත උප දිසාපති නෝනා

සියල්ල සුන්දර ලෙස සිදුවෙද්දී සෝමලතා රජයේ පරිපාලන විභාගයටද පෙනී සිටියාය. එය සමත්වීම ගැන ඇයට කිසිඳු සැකයක් තිබුණේ නැත. උප දිසාපතිවරියක ලෙස පත්වීම ඇගේ අරමුණ විය.

**"මේ ඉතින් අපේ ඊළඟ උප දිසාපති නෝනා"**

යැයි ගම්වාසීන්ද පවසන්නට වූයේ ඇගේ පත්වීම පිළිබඳ දැඩි විශ්වාසයෙනි. විභාග ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අතරම ඈ වැවිලි කටයුතු කාර්යාලයේ රාජකාරියට දිගටම සහභාගි වූවාය. කෙසේ වෙතත් සෝමලතා ඉදිරියට තබන පියවරක් පාසා ඇය සහ පවුලේ පිරිස ප්‍රීතියෙන් පිනා යද්දී ආවේණික කුහකකම සහ ඊර්ෂ්‍යාවෙන් පෙළුණු පිරිසක්ද ගමේ වූහ. ඔවුන්ට ඇගේ දියුණුව ඇසේ කටු අනින්නාක් මෙන් විය.

## වැසිබර අඳුරු දවසක්

1971 ජූනි 25 වන සිකුරාදා රෝස පැහැති සාරියකින් සැරසුණු සෝමලතා සුපුරුදු ලෙසම රාජකාරියට යාමට සැරසුණාය. එදින උදෑසන අහස කළු වලාවෙන් වැසී තිබිණ.


පරිසරයේ අඳුරු ගතිය අසුබ ලකුණක් යැයි ඈ සැලකුවේ නැත. සුපුරුදු ලෙසම සෝමලතා මගට බැස්සාය. තිස්මඩ සිට මැණික්දිවෙලට බසයෙන් පැමිණ එතැන් සිට නැවතත් මහනුවරට යාම ඇගේ ක්‍රමයයි. නැවත පැමිණෙන්නේද එලෙසමය. ඇතැම් දිනවල මහනුවර සිට තිස්මඩ දක්වා එකම බස් රථයකින් පැමිණිය හැකිය. එහෙත් ඒවා සුලබ නැත. එනිසා බොහෝවිට මැණික්දිවෙලින් බැස බසයකින්, වෙනත් වාහනයකින් හෝ පා ගමනින් යා යුතුය. මෙදින රාත්‍රිය වනතෙක් ඈ නිවසට නොපැමිණියාය. එහෙත් එය කලබලයට හේතුවක් නොවේ. මක්නිසාද රෑ බෝ වුණ දිනවල මහනුවර පිහිටි සිය මිතුරකුගේ නිවසේ නවතින ලෙස වෙදමහත්තයා සෝමලතාට කලින්ම උපදෙස් දී තිබූ බැවිනි. ඇය එම නිවසේ නැවතුණු අවස්ථා මීට පෙරද තිබී ඇත. එනිසා බියවීමට කරුණු නැත. අනෙක් අතට සෝමලතා පිළිබඳ කිසිඳු සැකයක්ද නොවේ. ඇය කීකරු මෙන්ම සත්‍යගරුක තැනැත්තියකි. එසේ වුවද පසුදා වෙද මහත්තයා මහනුවරට ගියේ දියණිය පිළිබඳ සොයාබැලීමටයි. ඈ කාර්යාලයෙන් පිටව තිබිණ. නමුත් මිතුරාගේ නිවසට ගොස් නැත. පෙම්වතා හමුවීමටද දියණිය නොගිය බව පියා දැනගත්තේය. ඇය පෙරදා මැණික්දිවෙල හන්දියටද පැමිණ තිබේ. එතැන් සිට නිවස දෙසට පා ගමනින් සෝමලතා ගමන් ගත් අයුරු දුටු පුද්ගලයෝද වෙති. එසේනම් ඈ කොහි ගියාද?

## මගහැරුණු වාසනාව

1971 ජූනි 25 වනදා සවස සෝමලතා ගොඩවූයේ මහනුවර - පොත්තපිටිය බසයටයි. එය ගමන්ගන්නේ මැණික්දිවෙල හරහාය. සෝමලතා මැණික්දිවෙලට ආසන්න වෙද්දී මහනුවර - තිස්මඩ බසය වේගයෙන් එය පසුකර ගියේය. එම බසය අල්ලා ගැනීමට නොහැකි වූ විට සෝමලතාට තිස්මඩට යාමට බසයක් නැත. ඇය ගමන් ගත් බසයේ රියැදුරාද ඒ බව දැන සිටියේය. එනිසාම ඔහු තිස්මඩ බසයට ඇසෙන ලෙස නලාව හැඬවූයේ එය නවතන්නැයි ඉල්ලීමේ අදහසිනි. එහෙත් සෝමලතාගේ අවාසනාවටදෝ තිස්මඩ බසයේ රියැදුරුට එය නොඇසුණි. ඔහු වේගයෙන් බසය ඉදිරියට ධාවනය කළේ සෝමලතාට ඊට ගොඩවීමට ඉඩක් නොතබමින්ය. එනිසා පයින් යාමට හිත හදාගන්නවා හැර කිරීමට වෙනත් කිසිවක් නොවීය. මැණික්දිවෙලින් බසයෙන් බැසගත් සෝමලතා කඩවූ බලාපොරොත්තු සහිතව ගම දෙසට ගමන් ගත්තාය. එහෙත් ඇය වෙනදා මෙන් නිවසට ගියේ නැත.



ගමේ මිනිස්සු හරි අව්‍යාජයි කියලා අපි හිතුවාට එදා විතරක් නෙවෙයි අදටත් ගම්වල මේ වගේ කුහක මිනිස්සු ඉන්නවා





## සෝමලතා දුටු ගම්වාසීන්

සෝමලතා පිළිබඳ සොයා බලා තොරතුරක් නොවූ තැන වෙද මහත්තයා පොලිසියේ පැමිණිල්ලක් දැමීය. පසුව නැවත ගමට ආවේය. ඔහු දකින දකින කෙනාගෙන් දියණිය පිළිබඳ විමසීය. මැණික්දිවෙල සිට තිස්මඩට යන මාර්ගයේ තිබූ වෙළඳසැලක හිමිකරු සෝමලතා දැක තිබිණ. ඇගේ පෙරමගට පැමිණි අයද ඈ හමු වූ බව පියාට කියා තිබේ. සෝමලතා ජූනි 25 සවස නිවස වෙත ගමන් කරමින් සිටි බව පැහැදිලිය. එසේ නම් ඈ අතුරුදන් වී ඇත්තේ මැණික්දිවෙල හන්දිය සහ නිවස අතරයි. පසුදා දිනය පුරා සොයා බැලුවද ඈ පිළිබඳ කිසිඳු තොරතුරක් නොවීය.

## සිරුර හමුවෙයි

සෝමලතා අතුරුදන් වූයේ සිකුරාදා දිනකය. ඊට පසු ඉරිදා දින ඇගේ ප්‍රාණය නිරුද්ධ සිරුර තිස්මඩදී හමුවිය. ඒ ලදු කැලෑවක් අසළ කාණුවක තිබියදීයි. කොස් අතුවලින් එය ආවරණය කර තිබිණ. ගෙලෙහි කැපුම් තුවාලයකි. පශ්චාත් මරණ පරීක්ෂණයේදී හෙළිවූයේ ඈ දූෂණයකට ලක් වී නොමැති බවයි. මංකොල්ලයකට අදාළ සාධකද නැත. පැළඳ සිටි කරාබු යුවල පමණක් අතුරුදන්ව ඇත. එසේ නම් ඇයට මෙවැනි අපරාධයක් කිරීමට හේතුව කුමක්ද? එසේ කළේ කවුරුන්ද? ඒ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් විමර්ශන ආරම්භ කෙරිණ.

## පැසුණු කොස් ගෙඩිය විසින් කැඳවනු ලැබූ සාක්කිකරු

1971 ජූනි 25 වනදා උදෑසන සෝමලතා ගමන් ගත් මාර්ගයේ සේනපාල ද ගමන් කළේය. හෙතෙම අවට ගස්වැල්ද නිරීක්ෂණය කළේය. ඔහු දුටුවේ හොඳට පැසුණු කොස් ගෙඩියකි. හවස්වරුවේ එය කඩා ගැනීමට සිතාගත් සේනපාල ඉදිරියට ගමන් ගත්තේය. කොස් ගෙඩිය කැඩීමට ඔහු පැමිණෙන විට සවස 4 පමණ විය. ගසට නැගී සිටියදී ඔහුට කිසිවකු කෑ ගසනවා ඇසිණ. ඒ අනුව ගසෙන් බැසගත් සේනපාල හඬ නැගුණ දෙසට ළං විය. ඔහු ප්‍රථමයෙන්ම දුටුවේ ප්‍රේමදාස නමැත්තාවය. ඔහු කුලසිංහගේ සහෝදරයායි. ඔහු යමක් නරඹන අයුරු සේනපාල නිරීක්ෂණය කළේය. ඒ සමඟම ඔහු දුටුවේ රිචඩ් නමැති අයවයි. හෙතෙම බිම සිටි කාන්තාවකගේ උදරය මත නැගී සිටියේය. ජයවර්ධන නම් පුද්ගලයා කාන්තාවගේ දෙකකුල් අල්ලා සිටින අයුරුද සේනපාල දුටුවේය. රිචඩ් අත පිහියකි. ඔහු කාන්තාවගේ ගෙල සිඳින අයුරු සේනපාල එවෙලේම දුටුවේය. ඒ කාන්තාව අන් කිසිවකු නොව, සෝමලතාය. ඇගේ ඇසින් කඳුළු වැටෙන අයුරු මෙන්ම පසුව ප්‍රේමදාස ඇගේ කන්පෙති ස්පර්ශ කරන අයුරුද ඔහු දැක තිබේ. සිදුවීම පිළිබඳ ලඝු නොවන පරීක්ෂණයේදී සේනපාල මහේස්ත්‍රාත්වරයා හමුවේ සියල්ල පැවසීය. සෝමලතාගේ ඝාතනයට අදාළ ප්‍රබල සහ වඩා වැදගත්ම සාක්ෂිය සේනපාලගෙනි. විත්තිකරුවන්ට එරෙහි නඩුව ඒ මත රඳා පැවතිණ. තවත් සාක්ෂිකරුවෝ රැසක් අධිකරණයට පැමිණියහ. සෝමලතා පැමිණි බසයේ රියැදුරු සහ මගදී හමුවූවෝද ඒ අතර වූහ. එහෙත් සොබාදහම විසින් කොස් ගෙඩියක් මගින් කැඳවනු ලැබූ සේනපාල නොවන්නට මෙම ඝාතනය සදහටම රහසක් වීමට ඉඩ තිබිණ. ලඝු නොවන පරීක්ෂණයේදී පළමු විත්තිකරු ලෙස නම් කර තිබුණේ කුලසිංහයි. ඔහු ඝාතනය කරවූ බවට සැක පළ විය. එහෙත් සේනපාලගේ සාක්ෂියේදී ඔහු පිළිබඳ කිසිවක් කියැවුණේ නැත. පැහැදිලි සාක්ෂි නොවූ බැවින් නඩුව ඉදිරියට යොමු කරද්දී කුලසිංහ නිදහස් වී සිටියේය. මහේස්ත්‍රාත්වරයා හමුවේ ප්‍රේමදාසද ප්‍රකාශයක් කළේය. හෙතෙම එහිදී කුලසිංහ පිළිබඳවද පැවසීය. එහෙත් නීතියට අනුව ප්‍රේමදාසගේ ප්‍රකාශය යොදා ගැනීමට හැකි වන්නේ ඔහුට විරුද්ධව පමණි. එනිසා කුලසිංහට ඉන් හානියක් නොවීය.

## මහනුවර මඟුල් මඩුවේ නඩු විභාගය

1972 දී සෝමලතා ඝාතනය පිළිබඳ නඩු විභාගය සිරිමාන්න නම් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුගේ ප්‍රධානත්වයෙන් ඉංග්‍රීසි කතා කරන ජූරි සභාවක් ඉදිරියේ ආරම්භ විය. එයට සුවිසල් ජනතා ආකර්ෂණයක් ලැබී තිබිණ. එකල නඩු විභාග පැවතියේ වෙනස් මුහුණුවරකිනි. ඒවා හැඳින්වෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ සැසි වාර ලෙසයි. විනිසුරන් ගමන් ගන්නේ කොළඹ සිට දුම්රියෙනි. මහනුවරදී බෙර වයමින් ඉහළ පිළිගැනීමක් ඔවුන්ට ලබාදෙයි. එය උත්කර්ෂවත් අවස්ථාවකි. සෝමලතා ඝාතනය පිළිබඳ නඩුව විභාග කෙරුණේද එවැනි පසුබිමකය. එහිදී අධිකරණ වෛද්‍යවරු දෙදෙනෙක් සාක්ෂි දුන්හ. සේනපාලගේ සාක්ෂියද සැලකිය යුතු පරස්පරතා නොමැතිව ඉදිරිපත් විය. සෝමලතාගේ පියා සාක්ෂි ලබාදීමේදී දෙපාර්ශවය අතර තිබූ විරසකය ආදී සියලු කරුණු හෙළි කළේය.

සිරිමාන්න විනිසුරුවරයා ජූරිය අමතන දේශනය අසා සිටීමට නීති වෘත්තිකයින්, සිසුන් ඇතුළු බොහෝදෙනෙකු පැමිණ තිබීමද විශේෂත්වයකි. විශිෂ්ට විනිසුරකු ලෙස ඔහු ප්‍රචලිතව තිබීම මෙන්ම මෙම සිදුවීමට හිමිවූ සමාජ ආකර්ෂණයද ඊට හේතු වන්නට ඇත. ඔහු සිය දේශනය ආරම්භ කර පවත්වාගෙන යද්දී විත්තිකරුවන්ට නිදහස ලැබේ දැයි බොහෝදෙනෙකුට සැක හිතෙන්නට ඇත. එහෙත් අවසානයේදී ඔහු ජූරියට උපදෙස් දුන්නේ සේනපාලගේ සාක්ෂිය අසත්‍ය යැයි සිතෙන්නේ නම් එවැනි ප්‍රකාශයක් කිරීමට ඔහුට හේතුවක් තිබේද යන්න විමසා බලන ලෙසයි. සියල්ල අවසන විත්තිකරුවන් තිදෙනාටම මරණ දණ්ඩනය නියම කිරීමට ජූරි සභාව කටයුතු කළේය. පසුව එයට එරෙහිව අභියාචනයක් කෙරුණු අතර ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ලෙන් ලැබුණේ බෙදුණු තීන්දුවකි. ඉන් ජූරි සභාවේ තීන්දුව ස්ථාවර කෙරුණි. ඊට එරෙහිවද අභියාචනා කෙරුණු අතර එහිදී විත්තිය වෙනුවෙන් රාජ්‍ය නීතීඥ ජෝර්ජ් චිට්ටි, බන්ටි සොයිසා, විජය මලලසේකර, ලාල් විජේනායක ආදීහු පෙනී සිටියහ. රජය වෙනුවෙන් ඉදිරිපත් වූයේ පුල්ලෙනායගම් නීතීඥවරයායි. අවසානයේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ ප්‍රේමදාස සිදුවීම නැරඹුවා මිස මිනීමැරීමට දායක නොවූ බවයි. ඒ අනුව ඔහුට නිදහස හිමිවිය. අනෙක් දෙදෙනාට එරෙහිව මරණ දඬුවම එලෙසම තහවුරු කෙරිණ. රිචඩ් සහ ජයවර්ධන යන එම චූදිතයන්ට එරෙහිව මරණ දඬුවම ක්‍රියාත්මක වූයේ 1975 නොවැම්බර් 25 වනදා බෝගම්බරදීය. යමෙක් තව කෙනෙකු කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් ක්‍රෝධයෙන් පිරී ඉතිරී ගිය විට එම තැනැත්තාගේ හානිය අපේක්ෂා කරයි. එහෙත් අනෙකාගේ පරිහානිය වෙනුවෙන් ක්‍රියා කරද්දී තමාට වන හානිය නොපෙනේ. ඒ බව වැටහෙද්දී හානි පූරණයට කාලයක් නොලැබෙනු ඇත. එය ඊයේට මෙන්ම අදටත්, අදට මෙන්ම හෙටටත් වලංගු සත්‍යයකි.

■ නීතීඥ රජනිකා ලියනගේ



පොලිස් මාධ්‍ය ප්‍රකාශක
නිහාල් තල්දූව

# දවසට පැය දෙකයි මාසෙට ලක්ෂයයි

මේ දිනවල අන්තර්ජාලය හරහා සිදුවෙන මූල්‍යමය අපරාධවල වැඩිවීමක් දක්නට ලැබෙන බව පොලිස් පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය පවසනවා. පොලිසිය කියා සිටින්නේ ඔවුන්ගේ ප්‍රධානම ඉලක්කය වී ඇත්තේ නිවාසවලට සීමා වී සිටින කාන්තාවන් සහ තරුණ තරුණියන් බවයි.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක නිහාල් තල්දූව මහතා මේ ගැන වැඩිදුරටත් පැහැදිලි කරමින් කියා සිටියේ මෙවැනි කතාවක්.

"අපිට දැනට ලැබිලා තියෙන තොරතුරුවලට අනුව මේ ජාවාරමට දේශීය වගේම විදේශීය ජාවාරම්කරුවන් පිරිසකුත් සම්බන්ධයි. මොවුන් මුලින්ම කරන්නේ ලෝකප්‍රසිද්ධ වෙළඳ සමාගම්වල රැකියා ලබාදෙන බවකුයි, ව්‍යාපාරවලට මුදල් ආයෝජනය කිරීමට අවස්ථාවක් තියෙන බවයි කියලා ජංගම දුරකතනවලට, වට්ස්ඇප් ගෲප්, ටෙලිග්‍රෑම් ගෲප්වලට ආකර්ෂණීය කෙටි පණිවිඩ එවන එක.

මේ අය කියන විදියට මුලින්ම කරන්න තියෙන්නේ ඔවුන් කියන ඇප් එකක් බාගත කරගෙන (download) මුලින්ම රුපියල් 5000ක 10000ක වගේ මුදලක් ආයෝජනය කරන එක. ඒ වගේම පැයක් දෙකක් වගේ කෙටි කාලයක් වැඩ කළහම දවසට රුපියල් 10000ක් 15000ක් වගේ ආකර්ෂණීය වැටුපක් ලබාදෙන බවකුත් කියනවා. එහෙම කිව්වම නිකන් ගෙදරට වෙලා ඉඳගෙන මාසෙකට ලක්ෂයක් හමාරක් හොයාගන්න පුළුවන් නිසා අපේ මිනිස්සුත් දෙපාරක් නොහිතා අර සුළු මුදල ආයෝජනය කරනවා.

ඔතන ඉඳන් තමයි නියම සෙල්ලම පටන්ගන්නේ. අර බාගත කරගන්න කියන ඇප්වලින් පෙන්නුම් කරන්නේ කෘත්‍රිමව නිර්මාණය කරපු ව්‍යාපාර කටයුත්තක් කියලා මේ වෙනකොට පොලිසිය අනාවරණය කරගෙන තියෙනවා. නමුත් මොවුන් කරන්නේ ඕනම කෙනෙක් මුලින්ම ආයෝජනය කරපු මුදල්වලට ආකර්ෂණීය ලාබයක් දීලා වංචාවට අහුවෙන පුද්ගලයන්ගේ විශ්වාසය දිනාගන්න කටයුතු කරන එක. උදාහරණයක් විදියට රුපියල් 5000ක් ආයෝජනය කරපු කෙනෙකුට රුපියල් 10000ක් 15000ක් වගේ ලාබයක් මුලින්ම ලබාදෙනවා. ඊටපස්සෙ ඒ විශ්වාසය මත තමයි ගොඩක් උදවිය මහා ප්‍රමාණයෙන් මුදල් ආයෝජනය කරන්න පටන්ගන්නේ. ඒ විශ්වාසය කොයිතරම්ද කියනවා නම් සමහරක් උදවිය දකුණු අප්‍රිකාවේ රන් ආකරවලට පවා මිලියන ගණනින් මුදල් ආයෝජනය කළා කියලා නීතියේ පිහිට පතාගෙන ඇවිත් තියෙනවා.

සුළුවෙන් ආයෝජනය කරපු පුද්ගලයෙක් මේ වෙනකොට ඔය විදියට ලොකු මුදලක් ආයෝජනය කරපු ගමන්ම මේ අපරාධකරුවන් කරන්නේ අර මුදල් ටිකත් අරගෙන අදාළ පුද්ගලයාව සියලුම ඇප්වලින් අවහිර කර දාන එක (block).



මේ වෙනකොට ජාවාරම්කරුවන් නීතියේ රැහැනට හසුකරගැනීමට අවශ්‍ය සියලුම පොලිස් පරීක්ෂණ කරගෙන යන බවයි මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩිදුරටත් කියාසිටියේ.

ගෙවුණු අවුරුදු තුනක කාලය තුළ මෙම ජාවාරමට විදේශිකයන්ගේ සෘජු සම්බන්ධකම් තිබිලා තියෙන බවක් පොලිසියට අනාවරණය වෙලා තියෙනවා. ඒ වගේම මීට සම්බන්ධ බවට සැකපිට නැගෙනහිර අප්‍රිකානු ජාතිකයින් 21 දෙනෙක්ව අත්අඩංගුවට අරගෙනත් තියෙනවා. වැරදිකරුවන්ට 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත යටතේ මහාධිකරණයේ නඩු පවරා දඬුවම් ලබාදීමටත් පොලිසිය මැදිහත් වෙලා කටයුතු කරනවා."

බොහෝ අය මෙම අපරාධකරුවන්ගේ වින්දිතයන් බවට පත්වෙන්නේ නොසැලකිලිමත්කම සහ නිසි අවබෝධයක් නැතිකම නිසා බවයි ඔහු පවසන්නේ.

"විශේෂයෙන්ම කාන්තාවන්ට, තරුණ තරුණියන්ට විතරක් නෙවෙයි අනිත් හැමෝටමත් මම කියන්නේ ඔබේ ජංගම දුරකතනය, ෆේස්බුක් ගිණුමට, වට්ස්ඇප් සහ ටෙලිග්‍රෑම් ගෲප්වලට නොදන්න අයගෙන් එන කෙටි පණිවිඩ ගැන මීට වඩා සැලකිලිමත්ව කටයුතු කරන්න. කවුරු හරි කෙනෙක් ඔබට කිව්වොත් දවසට පැයක් දෙකක් ගෙදරට වෙලා ස්මාර්ට් දුරකතනයක් ඔබපු පලියට මාසෙට ලක්ෂ ගණන් මුදල් උපයන්න පුළුවන් කියලා එතැන ගැටලුවක් තියෙන බව තේරුම්ගන්න. එහෙම නැතුව අන්තර්ජාලය හෝ ජංගම දුරකතන භාවිතය අවම කරන්න කියලා අපිට මේ ගැටලුව විසඳන්න අපහසුයි."

■ ලිහිණි මධුෂිකා



කොළඹ විශ්වවිද්‍යාලයේ
කථිකාචාර්ය
ජනහිත විජයබණ්ඩාර

# ගැහැනු කවුරුද වරදෙ නොබැඳෙන?



තොටගමුවේ ශ්‍රී රාහුල හාමුදුරුවෝ ලියපු කාව්‍යශේඛරයේ හරි අපූරු කවියක් තියෙනවා.

**'පිරිමිනිදු පතන**
**අවසර කල් රහස් තැන්**
**මිස නොලැබෙන බැවින**
**ගැහැනු කවුරුද වරදෙ නොබැඳෙන'**

ගොඩක් උදවිය හිතන්නේ මේක ගැහැනු වරදට පොළඹවාගන්න ලේසියි කියන අර්ථයෙන් ලියැවුණු එකක් කියලා. හැබැයි ටිකක් හොයලා බැලුවම කතාව ඊට වඩා වෙනස්.

මේකෙන් කියැවෙන හැටියටනම් පිරිමි බලාගෙන ඉන්නෙම ගැහැනියක් දැලේ දාගන්නලු. නමුත් හැම ගැහැනියකගෙන්ම ඒකට අවවාද අනුබල ලැබෙන්නෙත් නැහැනේ. හැබැයි හරි වෙලාවක් තැනක් බලලා ඒකට අවස්ථාව හදාගෙන ගෑනු හිත්වල අනුකම්පාව සහ ආදරය දිනාගන්න පිරිමි හරි සූරයෝ. ගැහැනියක් වරදක බැඳෙන්නේ අන්න එහෙම වෙලාවල්වලදී කියලයි මේ කියන්නේ.

පිරිමි වරදේ බැඳීම පිළිබඳව මහා පරිමාණ වශයෙන් කතාබහ නොවුණත් ගැහැනිය වරදේ බැඳීම ගැන අදටත් මහා ඉහළින් කතා වෙනවා. සාක්ෂි ඇතුව හෝ නැතිව සමාජය විසින් බොහෝවිට ඇයව වරදකාරිය කරනවා. ඇත්තටම ඒක සාධාරණද? කොළඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ජනහිත විජයබණ්ඩාර මහතා ඒ ගැන කිව්වේ මෙහෙම කතාවක්.

ඔය තොටගමුවේ රාහුල හාමුදුරුවෝ එදා ලියපු කවිය එදාටත් වැඩිය ගැළපෙන්නේ අද කාලෙට. මොකද අද කාලේ ගැහැනු බහුතරයකට ජීවිත වැරදිලා තියෙන්නෙත්, වරදින්න හේතුවක් වෙලා තියෙන්නෙත් පිරිමින්ව අසීමිත විදියට විශ්වාස කිරීම සහ ඔවුන්ට අනුකම්පා කිරීම කියලයි මට හිතෙන්නේ.

ඕකට මම ඇත්තම කතාවකුත් කියන්නම්.

මට ඉතාමත් හිතවත් ගුරුවරියෙකුට දුවෙක් හිටියා. මේ කියන කාලේ ඇය උසස් පෙළ ලියලා ප්‍රතිඵල අපේක්ෂාවෙන් ගෙදර හිටියේ. ඔහොම ඉන්නකොට මේ දැරිවි ගමේ ත්‍රීරෝද රථ තරුණයෙක් එක්ක පෙම් පලහිලව්වක පැටලිලා තිබුණා. ඔය දේවල් ගෙදර උදවිය දැනගන්නකොට අර දැරිවිට වෙන්න ඕන සියල්ලම වෙලා අර තරුණයාගෙන් දරුවෙකුත් ලැබෙන්න හිටියා. පස්සේ අර දෙමාපියෝ අර තරුණයා ගැන ටිකක් වැඩිදුර හොයලා බලනකොට තමයි දැනගන්න ලැබිලා තියන්නේ ඔහු කසාද බැඳලා දරු දෙන්නෙකුත් ඉන්නවා කියලා. අර දැරිවිට ඒ දේවල් කොයිතරම් තේරුම් බේරුම් කරන්න හැදුවත් ඇයට පෙම්වතා ගැන තිබුණු විශ්වාසය නිසා පලක් වුණේ නෑ. ඔහොම ඉන්නකොට තමයි අපිට ආරංචියක් ආවේ අර තරුණයා අර දැරිවිව රවට්ටගෙන ප්‍රසිද්ධ උද්‍යානයකට එක්කගෙන ගිහිල්ලා වස පානය කරන්න දීලා කියලා. පෙර පිනකට අහල පහළ උදවිය දැකලා ඇයව රෝහල්ගත කරලා තිබුණු නිසා දරුවා නැතුව ඇගේ ජීවිතය විතරක් යාන්තමට බේරගන්න පුළුවන් වුණා.

දැන් නිකමටවත් එදා ඇය අවජාතක දරුවෙක් බිහි කළා නම් රට්ටු කියන්නෙ වනචරකමේ ගිහින් බඩක් හදාගෙන ඇවිත් කියලා මිසක් තමන්ගේ ප්‍රේමවන්තයා ගැන තිබුණු ආදරය, විශ්වාසය නිසා ඇය අසරණ වුණා කියලා නෙමෙයිනේ.

මහාචාර්ය නන්දසේන රත්නපාල මහත්තයා ලියපු 'ගණිකාවෝ' කියන පොත ඕකට හොඳම උදාහරණයක්. ඔහු ඒ පොත ලියලා තියෙන්නේ ගණිකා වෘත්තියේ යෙදෙන කාන්තාවෝ එක්ක කතාබහ කරලා ඔවුන්ගේ ඇත්තම ජීවිත කතා ආශ්‍රයෙන්. අවසානයේදි ඔහු නිගමනයකට ඇවිල්ලා තියෙනවා අපේ සමාජයේ ගණිකා වෘත්තියේ නියැලෙන 99%ක්ම ගැහැනු ඒ වෘත්තියට ගිහින් තියෙන්නෙ රාගය නිසාවත් වනචරකම නිසාවත් නෙවෙයි කියලා. සමහරුන්ට ඒ තත්ත්වය උදාවෙලා තියෙන්නෙ පෙම්වතාව එක්කෝ සැමියාව අසීමිතව විශ්වාස කරලා. නැතිනම් ළමා වියේදී හෝ පසුව මුණදෙන්න සිද්ධ වෙලා තියෙන ලිංගික අපයෝජන නිසා.

නන්දසේන රත්නපාල මහත්තයාගේ ඒ නිගමනය හරි කියලා සිංහබාහු නාට්‍යය තුළින් සරත්චන්ද්‍ර කියන නාට්‍ය ශිල්පියා තවදුරටත් සහතික කළා. සුප්පා දේවිය කියන්නෙ බොහෝ පිරිමි එක්ක යහන්ගත වෙලා අන්තිමේදි සිංහයෙකුට ආදරේ කරන්න ගත්තු ගැහැනියක්. සිංහබාහු කතා මූලාශ්‍රයේ හැටියට සුප්පා දේවිය කියන්නෙ පිරිමින්ට ලොල් වනචර ගැහැනියක්. නමුත් සරත්චන්ද්‍ර කියන මේ නාට්‍යකරුවා සුප්පා දේවිය එහෙම ගියේ ආදරය හොයාගෙන මිසක් වනචරකමට නෙවෙයි කියන වග පෙන්වලා ඇයව සුදු චරිතයක් බවට පත්කරනවා.

මේ කතාව අවසානෙදි මගේ මතයත් එයම තමයි. 'බඹරුන් පසුපස මල් දිව නොගියට අවමන් වින්දේ මල් කුලයම නොවෙදෝ' කියලා කිව්වට ගැහැනු බොහෝවිට වරදේ බැඳුනේ වනචරකම නිසාම නෙවෙයි.

■ ලිහිණි මධුෂිකා

# තණමල්විල ගුණසිරිට ඇමරිකාවේ ටොම් කෲස් වැහිලා





තොරතුරු
**රණවීර ගමගේ ගුණසිරි**
(සෙවණගල)

**'පැටව් එක්ක ආවද බොල ඇතින්නී
ඒ කා දමා හොල්මන් වැට කඩන්නී
අංගුලිමාල අණ දැනගත් ඇතින්නී
බඳිමි සීමාව නො පනින් ඇතින්නී'**

සාමාන්‍යයෙන් හේනේ පැල් රකින ගොවීන්ගේ ඉල්ලීම එය වුවත් සෙවණගල ගුණසිරි ඊට වෙනස්ය. අලි වැට පනින සද්දන්තයන්ගෙන් ඔහු කිසිදු එලෙස ඉල්ලීම් නොකළේය. ඔහුගේ අවිය වූයේ කවිය නොවේ. ට්‍රැක්ටරයයි.

උඩවලව වේල්ලේ සිට තණමල්විල ආසන්නය දක්වා වන අලි වැටක කිලෝමීටර හයක පමණ පෙදෙසක් රැකීම ඔහුගේ කාරිය විය. සවස හයේ පමණ සිට පසුදු උදෑසන හය පමණ වන තෙක් ඇහිපිල්ලමක් හෝ නොගසා අලි ඇතුන් නිරීක්ෂණය කිරීමේ රාජකාරිය ඔහු ඉටුකළේ දේවකාරියක් මෙන් සිතාය. සෙවණගල උක් ගොවීන්ගේ වගාවන්, අලි ඇතුන්ගෙන් බේරාගැනීමයි ඔහුගේ අරමුණ වූයේ.

ඒ ගුණසිරිගේ රාජකාරිය බව අලි ඇතුන්ද නොදන්නවා නොවේ. ඒ නිසා දෙගොල්ලෝම එකිනෙකා ගැන විමසිලිමත්ය. ගුණසිරි ට්‍රැක්ටරය පදවාගෙන යන විට කැලේ පැත්තෙන් කිසිඳු හාවක් හූවක් නැත. එහෙත් ඇතැම් අවස්ථාවල ගුණසිරි යද්දී යසට තිබූ වැට එද්දී පෙරලා දමා තිබේ. එය අලියා ගම් වැදුණු බවට ඉඟියකි. එවිට ඔහුගේ එක වැඩේ දෙක වෙයි. වැට කඩා ගම් වැදුණු දඩබ්බරයා සොයා යා යුතුය. එපමණක්ද? අනවසරයෙන් වගාවට ඇතුළු වූ සද්දන්තයා නැවත කැලයට යැවීමද කළ යුතුය.

එය එක අතකින් ත්‍රාසජනක ක්‍රීඩාවක් මෙනි. එක පැත්තකින් කැලයට යවන අලියා තව ටිකකින් බලද්දී වෙනත් පැත්තකින් නැවත ගමට ඇතුළු වේ. ඔවුන් එසේ ගම් වදින්නේද ගුණසිරි ගැන ඔත්තු බලමිනි. ඔවුහු ගුණසිරිට රවමින්, සද්ද දමමින් සිය ආධිපත්‍යය පැතිරවීමට උත්සාහ දරති. ගුණසිරිද ඊට දෙවැනි නැත. කනෙන් අල්ලා අලියා කැලයට දැමීමට කළ යුතු සියල්ල ඔහු කරන්නේය. අනතුරුව කඩා දැමූ වැටද පිළිසකර කරන්නේය.

දිනක් ගුණසිරි ඉතා බිහිසුණු අත්දැකීමකට මුහුණ දෙන ලදී. එදින උක් වගාව රස බැලීමට පැමිණි අලියා වනයට යැවීමෙන් පසු ඔහු අලි වැට සැකසීම ආරම්භ කළේය. වෙලාව පාන්දර දෙකට පමණ ඇත. වාහනය නවතා පාරෙන් අනෙක් පසට පැන හෙතෙම කාර්යය ඇරඹීය. ඔහු සහ ට්‍රැක්ටරය අතර දුර මීටර 50ක් පමණ වන්නට ඇත. සද්දන්තයා ගලවා දැමූ කණුව සිටුවා පස් දමා තද කිරීමට සැරසුණා පමණි. සැක සහිත සද්දයකින් ගුණසිරි තිගැස්සුණේය. හැරී බැලූ විට ඔහු වෙතට වේගයෙන් එමින් සිටියේ ඔහු විසින්ම පලවා හරිනු ලැබූ දැවැන්තයාය.

අලියා වාඩුව ගැනීමට සූදානමිනි. ගුණසිරිට සිත සිතා සිටීමට කාලයක් නැත. කණුව අතැර ජීවිතය බේරාගැනීමට තිබුණේ මොහොතකි. ඔහු මීටර හතර පහක් සමීපයේ සිටින අලියා මග හැර හැකි උපරිම වේගයෙන් පාරට පැන්නේය. වැඩි ආලෝකයක් ලබා ගැනීමට ට්‍රැක්ටරයේ අටවා තිබූ විදුලි ලාම්පුවල ආලෝකයෙන් අවට සිටින ඕනෑම අයෙකුට සිදුවීම පැහැදිලිව පෙනෙයි. පාරට පැනගත් වේගයෙන්ම පාර හරහා පනිමින් සිටි ගුණසිරි අසලම තිරිංග තද කළේ වේගයෙන් ධාවනය වෙමින් තිබූ මෝටර් රථයකි. එහි බොනට්ටුවට දෑතම තබා පැන දුව යන ගුණසිරි, මෝටර් රථයේ රියැදුරාට හොලිවුඩ් ත්‍රාසජනක චිත්‍රපටයක රඟන ටොම් කෲස් සිහි ගැන්වූවාට සැක නැත. ට්‍රැක්ටරයට ගොඩ වූ පසු ගුණසිරි අවදානම් කලාපය පසුකර අවසන්ය. ගුණසිරිගේ දිවීමත්, සද්දන්තයාත් එකවර දුටු මෝටර් රථ රියැදුරුද නොනවත්වා රථය ධාවනය කළේ සිය ජීවිතය බේරාගැනීමේ අපේක්ෂාවෙන් විය යුතුය. ඉලක්කය වැරදුණු සද්දන්තයාට ආපසු හැරී යාමට සිදුවිය. ඒ වෙන කිසිවක් නිසා නොව, ගුණසිරිගේ ට්‍රැක්ටරයටත් එහි හඬටත් බිය බැවිනි.

■ **රජනිකා ලියනගේ**




නිවාස වාස්තු දෝෂ පරීක්ෂාව

- භූමිය පරීක්ෂාව
- අලුතින් සෑදීමට බලාපොරොත්තු වන නිවසේ සැලසුම හෝ දැනට පදිංචි නිවසේ වාස්තු පරීක්ෂාව
- ඉඩමේ සහ නිවසේ පාද බෙදීම
- ගෘහස්ථ ඒකාදශ පොරොන්දම පරීක්ෂාව
- ද්වාර පරීක්ෂාව
- වේධ දෝෂ පරීක්ෂාව
- ළිඳ සහ මුලුතැන්ගෙය පිහිටීම පරීක්ෂාව




වාස්තු දේශක සහ සැලසුම් ශිල්පී W.A රසාංග වියතුංග

දිනයක් කලින් වෙන් කරන්න

ඔබ වටා රැස් වලල්ලක් ඇති බව දැන සිටියාද? නිවසක වාස්තු දෝෂ ඇත්නම් ඔබගේ aura එක දුර්වල වේ. එවිට සෞඛ්‍ය, ආර්ථික, ගැටලු ඇති වේ.

දැන්ම අමතන්න : 076 0767420



AUTOWHEEL

පවුලේ අවන්හල දැන් විවෘතයි

ශ්‍රී ලාංකීය දිවා ආහාර දැන් ලබාගත හැක

සජීවී සංගීතය සමඟින්

එකක මිල රු.455/=




AA CEYLON Estd. 1904

ලංකා ඔටෝමොබයිල් සංගමය


40, ශ්‍රීමත් මාකන් මාකර් මාවත, කොළඹ 03.

විමසීම්: 077 - 4369013 ( ක්‍රිෂෝන් )

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම 2017 වසරේ වැඩ ඇල්ලුවේ දකුණු අප්‍රිකාව සමඟ පැවති විස්සයි විස්ස තරඟාවලියකිනි. එවර අපේ කණ්ඩායමට දඟපන්දු යවන නවක ක්‍රීඩකයෙක්ද ඇතුළත්ව සිටියේය. ඒ ලක්ෂාන් සඳකැන් ය. ඔහුට මංගල තරඟය ලෙස ක්‍රීඩා කරන්නට ලැබුණේ දකුණු අප්‍රිකාවේ ජොහැන්ස්බර්ග්හි පැවති ඉහත තරඟාවලියේ දෙවැනි තරඟයයි. සත්කාරකත්වයේ වාසියද සමඟ දකුණු අප්‍රිකාව එම තරඟය පහසුවෙන්ම ජයගනු ඇතැයි ක්‍රිකට් විචාරකයෝ එදා පාරම් බෑහ. නමුත් සිදුවුණේ එහි අනෙක් පැත්තය. කඩුලු තුනකින් ශ්‍රී ලංකා කණ්ඩායම ජයග්‍රහණය කළේය. තම මංගල විස්සයි විස්ස තරඟයම අමතක නොවෙන තරඟයක් කරගත් ලක්ෂාන් එම තරඟයේදී ලකුණු 23කට කඩුලු 4ක් බිඳහෙළීමට සමත්විය. එතැන් පටන් මේ දක්වාම සඳකැන්ගේ දඟ පන්දුව විස්සයි විස්ස, එක්දින පමණක් නොව ටෙස්ට් පිටියේද භේදයක් නොමැතිව දඟකැවුණේය. ඉතින් 2023 එක්දින ලෝක කුසලාන තරඟාවලිය ඇරඹෙන්නට ඔන්න මෙන්න කියා ඇති මොහොතක අප සඳකැන්ගේ ගෙදරට ගොඩවුණේ ඔහුගේ ආදරණීය බිරිඳ, වංශිකා කැපිටිආරච්චිගේ සමඟ කතාබහක් වෙනුවෙනි.

# දඟ පන්දුවට වඩා එයාගෙ ගතිගුණවලටයි මම කැමති වුණේ

## ලක්ෂාන් සඳකැන්ගේ බිරිඳ වංශිකා කැපිටිආරච්චිගේ






**මගතොටේදී ක්‍රිකට් ප්‍රේක්ෂකයෝ මුණගැහුනු වෙලාවට ෆොටෝග්‍රැපර් වෙන්නෙත් මම තමයි**

**සඳකැන්ගෙයි වංශිකාගෙයි ආදර කතාව පටන්ගත්තේ හරි අහම්බෙන්ලු නේද?**

ඔව්. සඳකැන්ගේ ගෙවල් තියෙන්නේ කදාන, වත්තල. මගේ ගෙවල් මාතර. යාළුවෙක් මාර්ගයෙන් තමයි අපි දෙන්නා මුණගැහුනේ. දවසක් ඒ යාළුවයි මමයි ඉන්න ෆොටෝ එකක් සඳකැන් දැකලා. පස්සේ එයා අර යාළුවගෙන් විස්තර අහලා මට කතා කළා.

**ඒ කොයි කාලේ වගේද?**

2019 අවුරුද්දේ. ඒ වෙනකොට සඳකැන් ජාතික කණ්ඩායමේ ක්‍රීඩකයෙක්.

***ප්‍රසිද්ධ ක්‍රිකට් ක්‍රීඩකයෙක් එහෙම කැමතිද කියලා අහද්දි සතුටු හිතෙන්න ඇති නේද?**

මුලින්ම කැමැත්ත අහද්දි එයා ජාතික කණ්ඩායමේ ක්‍රීඩකයෙක් කියලා දැනගෙන හිටියේ නෑ. මොකද මං ඒ කාලේ ලොකුවට මැච් බැලුවේ එහෙම නෑනේ. හැබැයි එයා මගෙන් කැමැතිද අහපු දවස ජීවිතේ කවදාවත්ම මට අමතක කරන්න බැරි දවසක් තමයි.

**හැබැයි පස්සේ දැනගන්න ඇතිනේ?**

ඔව් ඔව් පස්සේ දැනගත්තා එයා ජාතික කණ්ඩායමේ ක්‍රීඩකයෙක් කියලා.

**ඔයා සඳකැන්ට කැමතිවුණේ එයා ක්‍රිකට් ගහපු හින්දද?**

මං කැමතිවුණේ එයා ළඟ තිබුණු එයාගේ ගතිගුණවලට. අපි ආදරේ කරන්න කලින් යාළුවෝ වගේ කාලයක් හිටියනේ. ඒ කාලේ මට දැනුණා සඳකැන් කියන්නේ හරිම හොඳ කෙනෙක් කියලා. එහෙම හිතලයි මං එයාට කැමතිවුණේ.

**එහෙම කැමතිවෙලා සඳකැන්ට පොඩි පොඩි කොන්දේසි එහෙමත් දාන්න ඇති නේද?**

(සිනාසෙමින්) අනේ එහෙම නෑ. සඳකැන් කියන්නේ හැමදේම විවෘතව කතා කරන කෙනෙක්. ඒ නිසා යාළුවුණාට පස්සේ එයා ගැන කිසිම බයක් මට තිබුණේ නෑ.

**පෙම්වතා ජාතික කණ්ඩායමේ ක්‍රීඩා කරද්දි වංශිකා ආඩම්බරෙන් ඉන්න ඇති නේද?**

එහෙම නෑ කිව්වොත් ඒක බොරුවක්. ඇත්තම කිව්වොත් පොඩි ආඩම්බරයක් වගේම සතුටක් හිතේ තිබුණා.

**එතකොට ඔය දෙන්නගේ විවාහය සිද්ධවුණේ කොයි කාලෙද?**

ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසේ අපි විවාහවුණේ. තාම අපි විවාහවෙලා අවුරුද්දක්වත් නෑ.

**සඳකැන් එක්ක දැන් ගෙවන අලුත් ජීවිතේ කොහොමද?**

අපි සතුටින් ඉන්නවා. හැබැයි දෙන්නම ටිකක් කාර්යබහුලයි. ඇයි ඉතින් සඳකැන්ට හැමදාම වගේ ක්‍රිකට් පුහුණුවීම් තියෙනවා. මං ජයවර්ධනපුර කැම්පස් එකේ සහකාර කථිකාචාර්ය කෙනෙක් නිසා ඒ වැඩ කටයුතු එක්ක මමත් කාර්යබහුලයි. දෙන්නම ගෙදර ඉන්න දවස්වලට නම් අපි ඇවිදින්න එහෙම එළියට යනවා.

**දැන් නම් වංශිකා සඳකැන් ඉන්න මැච් බලනවා ඇති නේද?**

(සිනාසෙමින්) දැන් නම් ඉතින් සඳකැන් හිටියොත් අනිවාර්යයෙන්ම බලනවා. ඒත් මුලදි නම් බයට බැලුවේ නෑ. හිතේ බයක් තිබුණා මං බලද්දි එයා හරියට සෙල්ලම් කරන්නේ නැති වෙයි වගේ. ඒත් දැන් නම් එහෙම එකක් නෑ.

**දෙන්නා ගෙදරදි බැරිවෙලාවත් ක්‍රිකට් ගැන එහෙම කතා කරන්නේ නෑ කියන්නේ ඇත්තද?**

(සිනාසෙමින්) ඒක නම් ඇත්ත. අපි ක්‍රිකට් ගැන කතා කරන්නේම නැති තරම්. ඒත් ඉතින් සඳකැන් හොඳට සෙල්ලම් කරපු දවසට නම් එයා ඇවිත් ඒ ගැන හරිම සතුටින් කතා කරනවා. හැබැයි ටීම් එක පැරදුණු දවසට එහෙම එයා දවසක් විතර යනකල් මගෙත් එක්කවත් හරියට කතා කරන්නේ නෑ. ඒ පැරදුණු එක ගැන දුකින් තමයි ඉන්නේ.

**සඳකැන් ක්‍රීඩා කරපු තරඟ අතරින් වංශිකාට අමතක නැති තරඟයක් ගැන මතකයක් තියෙනවද?**

සැරයක් LPL එකේදි සඳකැන් අන්තිමට ගහපු හතරක් නිසා එයා ඒ සැරේ හිටපු ගාල්ල ටීම් එකට ෆයිනල් යන්න ලැබුණා. ඒ මැච් එක මට අමතක නෑ. ඒත් සඳකැන්ට නම් එයා ක්‍රීඩා කරපු පළවැනි විස්සයි විස්ස මැච් එක අමතක නැතුව ඇති. මොකද එයා එද පළවැනි බෝලෙන්ම විකට් එකක් ගත්තා වගේම ලකුණු 23කට කඩුලු 4ක් අරගත්තා. ඉතින් පළවැනි මැච් එකේ ඒ වගේ දස්කමක් කරන්න පුළුවන් වුණු එකට අදටත් එයාට සතුටු ඇති.

**හැබැයි ක්‍රිකට් පිටියේ එච්චර වැඩ දාපු සඳකැන්ට අද කණ්ඩායමේ ස්ථානය අහිමිවෙලා තියෙනවා. ඒ ගැන සඳකැන් මොකද කියන්නේ?**

එයාව කණ්ඩායමට ගිලිහුනේ විස්සයි විස්ස පන්දු යවන්නන් ශ්‍රේණිගත කිරීම්වල මුල් දහය අතරේ ඉන්නකොට. හැබැයි දැන් එයා ආයෙමත් හිත ශක්තිමත් කරගෙන උනන්දුවෙන් කැපවෙලා පුහුණුවීම් කරගෙන යනවා. මං හිතනවා සඳකැන්ට ආයෙත් ඉක්මණින්ම ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරන්න ඉඩක් ලැබෙයි කියලා.

**ඒකට හොඳම අවස්ථාවක් ඉදිරියේ උදාවෙනවා නේද?**

ඔය කියන්නේ 'ලංකා ප්‍රීමියර් ලීග්' (LPL) එක ගැන නේද? ඔව් සඳකැන් මේ සැරේ 'කලම්බු' (Colombo Strikers) ටීම් එකට ක්‍රීඩා කරන්නේ. එයා ඒ වෙනුවෙන් දැන් ලෑස්තිපිට ඉන්නේ. මට හිතෙනවා LPL එකේදි හොඳ කම්බැක් එකක් දීලා එයා ජාතික කණ්ඩායමට එන්න ආයෙත් පාර හදාගනියි කියලා.

**හැබැයි සඳකැන්ට තියෙන ප්‍රේක්ෂක ආදරේ නම් තාම වෙනසක් වෙලා නෑ නේද?**

(සිනාසෙමින්) ඒක නම් ඇත්ත. අදටත් පාරේතොටේ යද්දි එයාව දන්න අය කතා කරලා සෙල්ෆියක් එහෙම ගහගෙනම තමයි යන්නේ. ඒකට ගෑනු පිරිමි භේදයක් වයස් භේදයක් නෑ. සමහර වෙලාවට ඒ අයගේ ෆොටෝග්‍රැපර් වෙන්න වෙන්නෙත් මට තමයි.

**වංශිකාට හිතෙන විදියට සඳකැන් ක්‍රිකට් නොගැහුවා නම් අද මොන වගේ තැනක ඉඳියිද?**

ඒක නම් මට හිතාගන්නම බෑ. මොකද එයාගේ ලෝකේ ක්‍රිකට්ම තමයි.

**අවසානෙට අපට කියන්නකෝ දෙන්නගේ අනාගත බලාපොරොත්තු එහෙම මොනවද?**

මේ වෙනකොට නම් එයාටයි මටයි දෙන්නටම තියෙන්නේ එකම බලාපොරොත්තුවක්. සඳකැන්ට ඕන ආයෙත් දක්ෂකම් පෙන්නලා ජාතික කණ්ඩායමට එන්න. මට ඕන එයාගේ ඒ ආසාව ඉටුවෙනවා දකින්න. ඒ වගේමයි මට ලොකු ආසාවක් තියෙනවා එළැඹෙන එක්දින ලෝක කුසලානයට සඳකැන් ක්‍රීඩා කරනවා දකින්න. එයත් ඒ ගැන ගොඩාක් බලාපොරොත්තු තියාගෙනයි ඉන්නේ. බලමු ඉතින් නේද?

■ රුවන් එස්.සෙනවිරත්න

**මෙතෙක් කාලයක් පුරාවට ඔස්ට්‍රේලියානු ජාතික කාන්තාවක වූ ‘කැත්ලීන් ෆෝල්බිග්’ (Kathleen Folbigg) හැඳින්වූයේ ‘ඔස්ට්‍රේලියාවේ දරුණුතම සමූල ඝාතක කාන්තාව’ ලෙසින්. ඒ ඇය තමාගේ දරුවන් සිව්දෙනා ඝාතනය කළ බවට වරදකාරිය වී විසිපස් වසරක සිර දඬුවමක් නියමවීමෙන් පසුවයි. එහෙත් වසර විස්සකට පසුව ඇයව නිදහස් කිරීමට පසුගියදා එක්වරම එරට අධිකරණය තීරණය කර තිබුණි. ඒ ඇය නිවැරදිකාරියක් කරමින්. ඉතින් ඔස්ට්‍රේලියානු ඉතිහාසයේ අසාධාරණම නඩු තීන්දුව ලෙසින් මේ දිනවල ලෝකය පුරා කතාබහට ලක්වෙන කැත්ලීන්ගේ කතාවයි මේ.**

# මවකගේ සෙනෙහස හඳුනගන්න බැරිව ඔස්ට්‍රේලියානු අධිකරණය ඉතිහාසයේ ලොකුම වැරැද්ද කරලා



කැත්ලීන්, ක්‍රේග් ෆොල්බිජ් කියන තරුණයා එක්ක විවාහ වෙනකොට ඇයට වයස අවුරුදු 20යි. විවාහය සිද්ධවුණේ 1987 අවුරුද්දේ. දෙන්නා දෙමහල්ලෝ හරිම සතුටින් ජීවත්වුණා. ඔය අතරෙ 1989 අවුරුද්දේ කැත්ලීන් අම්මා කෙනෙක් යන්න වෙන බවට සුබ ලකුණු පහළ වුණා. කොච්චර සතුටුවුණාද කිව්වොත් බඩේ ඉන්න දරු පැටියගේ මූණ බලාගන්නකල් ඇයට ඉස්පාසුවක් තිබුණේ නෑ.

**“අනේ ක්‍රේග්, මේ දරුවා ඉක්මනටම ලැබෙනවා නම්....”**

කැත්ලීන් එහෙම කිව්වේ ඉදිරියට නෙරලා ආපු තමන්ගේ කුස පරිස්සමට අතගාන ගමන්. ඉතින් ක්‍රේග්ටත් දරු පැටියගේ මූණ බලාගන්නකල් ඉවසීමක් තිබුණේ නෑ.

**“එයා ලස්සන පුතෙක්...”**

රෝහල් වෛද්‍යවරයෙක් කැත්ලීන්ට ඒ සුබ ආරංචිය දෙනකොට ඇයට ඉහිලුම් නැතිව ගියා. මොකද ඇය වගේම සැමියා වුණු ක්‍රේග් ආසාවෙන් හිටියෙත් පිරිමි දරුවෙක්ට. කොහොමහරි දෙන්නගේම ආසාව එකසැරේම ඉටුකරපු පුංචි එකාට ‘කාලෙබ්’ කියලා නම තිබ්බා. ඒත් ඔහුට ජීවත්වෙන්න වාසනාව තිබුණේ ඉපදිලා දවස් 19ක් විතරයි. ඉතින් කැත්ලීන් වගේම ක්‍රේග් දරුවගේ මියයාමත් එක්ක මානසිකව වැටුණා. ඒත් දෙන්නගෙන් කවුරුත්ම ඒ හදිසි මරණයට හේතුවක් දැනගෙන හිටියේ නෑ. අඩුතරමේ රෝහල් වෛද්‍යවරුන්ටවත් ඒකට හේතුවක් හොයාගන්න බැරිවුණා.

**“දුක්වෙන්න එපා. අපි තව දරුවෙක් හදමු කැත්ලීන්...”**

දවස් ගණන් නොකා නොබී අඬ අඬා හිටපු කැත්ලීන්ට එහෙම කිව්වේ ක්‍රේග්. ඊටපස්සෙයි කාලයත් එක්ක ‘පැට්‍රික්’ කියන පිරිමි දරුවා ඔවුන්ගේ ළඟට ආවේ. හැබැයි කාගේ අවාසනාවටද මන්දා ඔවුන්ගේ ඒ දරුවා ජීවත්වුණෙත් මාස අටයි. හිටපු ගමන් මියගිය ඒ දරුවගේ මරණයට හේතුව හොයාගන්නත් ඔවුන්ට පුළුවන්කමක් ලැබුණේ නෑ.

**“දුක් නොවී ඉන්නකෝ කැත්ලීන්. අපි අලුත් දරුවෙක් ගැන හිතමු.”**

පිරිමි දරුවෝ දෙන්නෙකුට පස්සේ ඔවුන් ළඟට ‘සේරා’ කියන පුංචි කෙල්ල එකතුවුණේ ඒ විදියට. ඒත් හොඳ සනීපෙන් හිටපු ඒ පුංචි එකීටත් ජීවත්වෙන්න ඉඩ ලැබුණේ මාස 10ක් තරම් පොඩි කාලයක් විතරයි. ඒ සැරේ නම් කැත්ලීන්ගේ මානසිකත්වය බින්දුවෙනුත් පහළට ඇදගෙන වැටිලයි නැවතුණේ. ඒත් ක්‍රේග් ඇයට ආයෙමත් පුංචි එකෙක් ගැන බලාපොරොත්තුවක් දුන්නේ මේ විදියට.

**“අපි තව එක සැරයක් උත්සාහ කරලා බලමු. මේ සැරේ නම් අපේ දරුවට කිසිම දෙයක් වෙන්නේ නෑ.”**




ඒ විදියටයි ඔවුන් ළඟට ‘ලෝරා’ කියන පුංචි කෙලි පොඩ්ඩ ආවේ. ඒත් ඒ පුංචි එකීටත් කලින් දරුවන්ට වුණු දේම වෙයි කියලා දෙන්නම හිටියේ බයෙන්. ඒ බය පොඩ්ඩක් හරි නැතිවුණා නම් නැතිවුණේ ලෝරාට අවුරුද්දක් පිරුණු දවසේ. මොකද ඉතින් කලින් දරුවෝ එච්චර ලොකු කාලයක් ජීවත්වුණේ නෑනේ. ඒත් ඒ වෙද්දිත් කැත්ලීන්ටත් ක්‍රේග්ටත් හොරෙන් මාරයා ඒ පුංචි එකී ගාවටත් කිට්ටු කරලයි තිබුණේ. එහි ප්‍රතිඵලය විදියට අන්තිමේ ලෝරාත් හිටිගමන් මියගියා. ඒ ඉපදිලා හරියටම අවුරුදු එකහමාරකට පස්සේ.

**“අනේ දෙවියනේ, කිසිම හේතුවක් නැතිව මගේ දරුවෝ ටික නැතිවුණේ කොහොමද? මට මේ ගැන සැකයි.”**

ලෝරාගේ මරණයෙන් පස්සේ එහෙම හිතුවේ ක්‍රේග්. ඔහුට කෙළින්ම සැක හිතුණේ තමන්ගේ බිරිඳ කැත්ලීන් ගැන. ඒ හින්දා ඔහු කළේ මේ සම්බන්ධව පොලිසියේ පැමිණිලි කරපු එක. ඒක දැනගත්තු කැත්ලීන්ට සැමියා ගැන ඇතිවුණේ ලොකු තරහක්. ඒකම දෙන්නගේ විවාහය දෙදරා යන්නත් හේතුවක් වුණා.

**“මෙහෙම එකපාරටම මේ පවුලේ ළමයි හතරදෙනා මැරෙන්නේ කොහොමද? ස්වාභාවික හේතුවක් හින්දා එහෙමත් මැරෙන්න පුළුවන්ද? අනික ස්වාභාවික හේතුවකින්වත් මේ විදියට අවුරුදු දෙකක් වගේ කාලසීමාවකදී එකම පවුලේ ළමයි හතරදෙනෙක් මැරෙයිද?”**

ක්‍රේග්ගේ පැමිණිල්ලත් එක්ක ලහිලහියේ පොලිස් විමර්ෂණ ආරම්භ කෙරුණත් පොලිසියත් හිටියේ ඔන්න ඔය වගේ ප්‍රශ්න ගොඩක පැටලිලා. ඒක නිසාම ඔවුන්ගේ සැකයත් හැරුණේ කැත්ලීන්ගේ දිහාවට. ඔය අතරයි පොලිසිය අතට කැත්ලීන්ගේ දිනපොත හම්බවුණේ. එහි ලියලා තිබුණු දේවල් එක්ක පොලිසියත් කෙළින්ම දරුවන්ගේ මරණයට ඇඟිල්ල දික් කළේ කැත්ලීන්ගේ පැත්තට. මොකද 1989 -1999 කාලය තුළ කැත්ලීන් දිනපොතේ ලියපු දේවල් පොලිසියට පෙනුණේ හරියට තමන්ගේ දරුවෝ මරපු මවක් ඒ වරදකාරී හැඟීම අකුරු කරපු විදියට. කොහොමහරි අවසානෙට ඔස්ට්‍රේලියානු අධිකරණය ඉදිරියේ කැත්ලීන් වරදකාරියක් බවට පත්වුණා. ඒ ඇය තම දරුවන් සිව්දෙනා විටින් විට හුස්ම හිරකරලා ඝාතනය කළාය කියන අධි චෝදනාවට. එහි ප්‍රතිඵලය විදියට 2003 අවුරුද්දේ ඇයට එරට අධිකරණයෙන් වසර 25ක දීර්ඝ සිර දඬුවමක් නියම කළා. ඒත් කිසිම අවස්ථාවක කැත්ලීන් ඒ චෝදනාව නම් පිළිගත්තේ නෑ.



කොහොමහරි 2003 අවුරුද්දේ ඉඳන් මේ වෙනකල්ම කැත්ලීන් හිටියේ හිරේ. හැබැයි ඇය ගැන විමර්ශණ නම් කිසිම වෙලාවක පොලිසිය නැවැත්තුවේ නෑ. එහි ප්‍රතිඵලයක් විදියටයි පොලිසිය අතට ඇයගේ දුරකතන හඬ සංවාදයක් අහන්න ලැබුණේ. ඒ සංවාදය ඇහුවට පස්සෙයි පොලිසියට තරු විසිවුණේ. මොකද ඒ දුරකතන හඬ සංවාදයයේ තිබිලා තියෙන්නේ කැත්ලීන් ඇයගේ දරුවෙක් අසනීප වූ අවස්ථාවක හඬා වැටෙමින් එරටේ හදිසි ගිලන්රථ සේවයට ඒක දැනුම් දෙන හැටි. ඒ වගේම ආයෙත් කැත්ලීන්ගේ දිනපොත කියවද්දියි පොලිසියට වැටහෙන්නේ ඒ ලියලා තියෙන්නේ මරණයෙන් අතිශය කම්පාවට පත්වුණු මවකගේ සිතුවිලි මිසක් දරුවෝ මරපු මවක් ඒ වරදකාරී හැඟීමෙන් නිදහස් වෙන්න ලියපු දේවල් නෙවෙයි කියලා. ඔන්න ඔය හේතු හින්දා ඔස්ට්‍රේලියානු අධිකරණයට සිද්ධවුණා  තමන් කැත්ලීන්ට දුන්නු නඩු තීන්දුව ගැන ආයෙමත් වතාවක් සළකා බලන්න.

**“මෙතැන ඝාතනයක් සිද්ධවෙලා නෑ. නව විද්‍යාත්මක සාක්ෂි අනුව මේ දරුවන් සිව්දෙනාම මියගිහින් තියෙන්නේ ස්වාභාවික හේතුන් හින්දා. ඒ කියන්නේ ජානමය ගැටලුවක් තමයි දරුවන්ගේ මරණයට හේතුව වෙලා තියෙන්නේ.”**

ආයෙත් සැරයක් කැත්ලීන්ගේ නඩු තීන්දුව සළකා බලපු ඔස්ට්‍රේලියානු අධිකරණයට පසුගියදා කියන්න වුණේ එහෙම කතාවක්. ඒත් එක්ක වහාම 2023 ජුනි මාසෙ 05 වැනිදා ඇය නිදහස් කරන්න ඔස්ට්‍රේලියාවේ නිව්සවුත්වේල්ස් අධිකරණය තීරණය කළා. හැබැයි ඒ වෙනකොට වෙන්න ඕන හැමදේම වෙලා ඉවරයි. මොකද ඇත්ත නැත්ත මොකක් වුණත් මේ වෙනකල් කැත්ලීන්ව කවුරුත් හංවඩු ගැහුවේ ඔස්ට්‍රේලියාවේ දරුණුම සමූල ඝාතක කාන්තාව විදියට. ඒ විතරක් නෙවෙයි නොකරපු වැරැද්දකට විසි අවුරුද්දක් සිරබත් කන්නත් ඇයට සිද්ධවුණානේ.

**“මේ තමයි ඔස්ට්‍රේලියානු ඉතිසාසයේ අසාධාරණම නඩු තීන්දුව.”**

විදෙස් මාධ්‍ය කැත්ලීන්ගේ නඩු තීන්දුව ගැන කිව්වේ එහෙම කතාවක්. මේ අතර පසුගියදා 56 හැවිරිදි කැත්ලීනුත් තමන්ට ලැබුණු නිදහස ගැන මේ විදියට අදහස් දක්වලා තිබුණා.

**“මට නිදහස ලැබුණු එක ගැන සතුටක් දැනෙනවා. මං අදටත් කියන්නේ මගේ අතින් දරුවෝ මැරුණේ නෑ. හිරේ හිටපු අවුරුදු විස්ස පුරාවටම හැමදාම මං හිතුවේ දරුවෝ ගැන. අදටත් මගේ දරුවන්ට වුණු දේ ගැන මං දුක්වෙනවා.”**

විවාහවෙලා දරුවෙක් ලැබෙනකල් ඉවසුම් නැතුව හිටපු අම්මා කෙනෙක්ට ඒ දරුවා ලැබුණම මරලා දාන්න තරම් හයියක් කොහෙන්ද? ඇරත් තමන්ගේ දරුවෙක්ගේ බෙල්ල මිරිකන්න තරම් අම්මෙක්ට පුළුවන්ද? ඇත්තටම එහෙම දෙයක් කැත්ලීන් කළේ නෑ කියලා දැන් ඔප්පුවෙලා ඉවරයි. ඉතින් දැන් කවුරුත් කැත්ලීන් ෆෝල්බිග්ව පිළිගන්නේ ආදරණීය මවක් විදියට. හැබැයි ඒ එක පුද්ගලයෙක් ඇරෙන්න. ඒ තමයි ක්‍රේග් ෆොල්බිජ්. ඔහුගේ නීතිඥයා කියන විදියට කැත්ලීන් නිදහස් වුණු එක සම්බන්ධයෙන් ඔහුට තියෙන්නේ මේ වගේ හැඟීමක්ලු.

“ක්‍රේග් තවමත් විශ්වාස කරන්නේ දරුවෝ මැරුවේ කැත්ලීන් කියලා. ඇය නිදහස් වුණා කියලා දැනගත්තට පස්සේ ක්‍රේග් අවුරුදු විස්සක් තිස්සේ දරුවෝ හින්දා විඳපු වේදනාව තවත් වැඩිවෙලා.”

**ලෝකෙම විශ්වාස කළත් තවමත් කැත්ලීන්ව අවිශ්වාස කරන එකම එක පුද්ගලයෙක් ඉන්නවා**

■ රුවන් එස්.සෙනවිරත්න



"ඉල්ලුමක් තිබුණු නිසා මම හදපු නිර්මාණ කිහිපයේ ෆොටෝස් ෆේස්බුක් එකේ මාකට්ප්ලේස් ගෲප්වල දැම්මා. ටික්ටොක් එකවුන්ට් එකක් හදලා ඒවගෙත් දැම්මා. පස්සේ මට ඕඩර්ස් එක දෙක ලැබෙන්න ගත්තා. කිලිනොච්චියේ රෙසින් බඩුගන්න තැන් තිබුණේ නැහැ. රජයෙන් හම්බුණු රස්සාවෙන් පර්මනන්ට් වෙනවට වඩා මේකෙන් දෙයක් කරන්න පුළුවන් කියලා හිතුණා. ඒ පාර දෙන්නම ආයේ ඇවිල්ලා මහත්තයගේ ගම්පහ ගෙදර නතර වුණා."

සාර්ථක වෙන්නේ අවදානම් ගන්න බය නැති මිනිස්සු කියනවනේ. රජයේ රස්සාවක් කරන්න බලාගෙනම උපාධියක් කරන තරුණ පරපුරක් ඉන්න රටක ලැබිච්ච රස්සාවත් එපා කියලා හරියයිදෝ නොයයිදෝ කියලා කියන්න බැරි රෙසින් වැඩේට අතගහන්න නයෝමිලා ගත්තු තීරණයම අවදානමක්.

**"අම්මලා මට උගන්වන්න ගොඩක් මහන්සි වුණා. ඉතින් රස්සාව දාලා මෙහෙම දෙයක් කරන්න යනවා කිව්වහම අම්මයි තාත්තයි කැමති වුණේ නැහැ. එකපාර රස්සාව අතඇරියහම කොයි අම්මා තාත්තත් කණගාටු වෙන එක සාමාන්‍යයිනේ. සමහර පිටස්තර මිනිස්සු පවා ඔය ගැන කතා කිව්වා. හැබැයි ඒ දේවල් මම නම් ගණන් ගත්තේ නැහැ."**

**එළියේ පුංචි කුස්සි කෑල්ලක් තිබුණා. එතැන තමයි වැඩේ පටන්ගත්තේ. මුලදි ටික්ටොක් වීඩියෝ දැම්මට වැඩිය කට්ටිය බැලුවේ නැහැ**

නයෝමි සැමියාගේ ගෙදර තිබුණු පුංචි ඉඩක රෙසින් වැඩේ කරන්න පටන්ගත්තේ ඔහොමලු.

"එළියේ පුංචි කුස්සි කෑල්ලක් තිබුණා. එතැන තමයි වැඩේ පටන්ගත්තේ. මුලදි ටික්ටොක් වීඩියෝ දැම්මට වැඩිය කට්ටිය බැලුවේ නැහැ. ඉතින් වෙනස් දෙයක් කරන්න ඕනේ කියලා මට හිතුණා. පස්සේ මම රෙසින් නිර්මාණ කරන විදිය කියලා දෙන ටික්ටොක් දැම්මා. ඒ කළාම ඔන්න එකපාර වීව්ස් වැඩි වුණා. හිතාගන්න බැරිතරම් ඕඩර්ස් එන්න පටන්ගත්තා. එහෙම බැලුවහම මම හරියට මේ වැඩේ පටන්ගත්තේ 2022 මාර්තුවලදී."

කෙමිකල් වර්ග දෙකක් හරි පරිමාවට අරගෙන මිශ්‍ර කරලා ඒක විනාඩි 20ක් වේලෙන්න තියලා ඒ මැදට ෆොටෝ, මල් වගේ දේවල් දානවලු. එහෙම දාලාත් නිර්මාණය පැය 24ක් වේලගන්න ඕනෙලු.

"මුල්ම කාලෙදි දවසක් මට කීටැග් 100ක ඕඩරයක් ආවා. ඔය කාලේ මට තිබුණේ එක අච්චුවයි. ඉතින් එකක් වේලෙනකල් පැය 24ක් බලාගෙන ඉන්න ඕනේ. අනික එක අච්චුවක් පාවිච්චි කරන්න පුළුවන් හත් අට සැරයයි. ඉතින් එක අච්චුවෙන් මේ වැඩේ කරන්න බැහැ කියලා මට තේරුණා. පස්සේ ඕඩරේ කල්දාලා ඇඩ්වාන්ස් එකක් ඉල්ලගෙන අච්චු ගත්තා. පළවැනි පාර අමුද්‍රව්‍ය අරගෙන ඊගාව පාරට අමුද්‍රව්‍ය හදන්න බඩු ගන්න සල්ලි නැතිව ඉඳපු දවස් තියෙනවා. හැබැයි දැන්නම් මම අමුද්‍රව්‍ය ගන්නේ ලීටර් ගණන්වලින්. සිහිවටන, ස්ටේෂනරීස්, පොඩි මේස, බුක්මාර්ක්, ජුවලරීස් ඔය හැමදේම හදනවා. සතියකට ඕඩර්ස් 100-200ක් කරනවා. වැලන්ටයින් කාලෙට ඕඩර්ස් 1000ක් විතර එනවා."

පුංචි කුස්සියක වැඩ පටන්ගත්තු නයෝමිට අද රෙසින් වැඩ කරන වර්ක්ෂොප් එකක් තියෙනවා. ඒ වගේම මේ හරහා ඇය තවත් තුන්දෙනෙකුට රැකියා සපයලා තියෙනවා.

"මගේ සැමියා මෝෂධ තාරුක. ඩිග්‍රි එකක් තිබුණත් ඔහුත් රැකියාවක් කරන්නේ නැහැ. අපි දෙන්නම එකතු වෙලා තමයි දැන් රෙසින් වැඩේ කරන්නේ. රස්සාවක් කරලා හොයන්න බැරි ගාණක් අද අපි දෙන්නා හම්බ කරනවා. මගේ මහගෙදර ගොඩක් පොඩි කියලා කිව්වනේ. ඒ ගෙදර ලොකුවට හදන එක තමයි මගේ හීනය. මේ මාස කිහිපය ඇතුළේ අපි ගෙයක් හදන්න සල්ලි එකතු කරලා ඉවරයි. මගේ උසස් අධ්‍යාපන වැඩවලටත් සල්ලි එකතු කරගත්තා."

පුංචියට පටන්ගත්තු ව්‍යාපාරයෙන් අද ඇවිල්ලා ඉන්න තැන ගැන නයෝමි කතා කළේ නිහතමානී ආඩම්බරකමකින්.

"රෙසින් කියන්නේ කෙමිකල් එකක්නේ. ටික දවසක් වැඩ කරද්දි මට හුස්ම ගන්න අමාරුකමක් ආවා. රෙසින් හදද්දි කෙමිකල් පෙනහළුවලට යනවා කියලා මම දැනගත්තේ පස්සේ. එහෙමයි කියලා වැඩේ අතඇරියේ නැහැ. ෆේස් මාස්ක් දාගෙන වැඩ කළා. සල්ලි ලැබුණහම ගෑස් මාස්ක් ග්ලවුස් අරන් දැන් බොහොම ආරක්ෂිතව වැඩ කරනවා."

නයෝමිගේ ගමනේ අභියෝග වැඩියි. හැබැයි අභියෝග වැඩිවෙන තරමට සාර්ථක වෙන්න ලේසියි කියන එකයි ඇය කිව්වේ.

**"ඉස්කෝලේ යන කාලේ ඉගෙනගන්න අවධානය දුන්නා මිසක මේ වගේ කලා නිර්මාණ කරන්න අදහසක්වත් තිබිලා නැහැ. ඉතින් මම අනිත් අයටත් කියන්නේ ඉගෙනගත්තු පැත්තෙන්ම යන්න ඕනේ කියලා නීතියක් නැහැ. ඒ පැත්තෙනුත් යන අතරේ තව අලුත් අලුත් දේවලුත් කරලා බලන්න. දැන් මම රෙසින් උගන්වන ක්ලාස් පවා කරනවා. දැනට මගෙන් දරුවෝ 300කට වඩා ඉගෙනගෙන තියෙනවා. එකතැනකට කොටු වුණොත් සාර්ථකත්වයට යන්න අමාරුයි. ඒ නිසා හැමදේම උත්සාහ කරලා බලන්න."**

'ධරණී' කියවන ඔබ වෙනුවෙන් වචනයක් දෙකක් කියන ගමන් ඇයට හයියක් වුණු සැමියා, නයෝමිගේ පවුල සහ සැමියාගේ පවුලේ උදවියත් ඇය ආදරෙන් මතක් කරන්න නයෝමි අමතක කළේ නැහැ.

**■ සෙව්වන්දි හෙට්ටිආරච්චි**

**ඡායාරූප - ප්‍රදීප් දඹරගේ**

# ‘මාතෘ’ සඳහා පොළොන්නරුවෙන් ජන ගඟක්





හෙට දවසේ අපගේ ආදරණීයයන්ගේ ආරක්ෂාව, රැකවරණය හා සුරක්ෂිතතාවය තහවුරු කරනුවස් දීපව්‍යාප්තව පවත්වාගෙන යන ‘මාතෘ’ වැඩසටහන් ද්විත්වයක් පසුගිය ජූනි මාස 25 වන දින උදෑසන අනුරාධපුර ප්‍රදේශයේත් සවස පොළොන්නරුව රාජකීය විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදීත් පැවැත්විණි. සුවැති රටක් නිර්මාණය කිරීමට මව්වරුන්ගෙන් ඉටුවිය යුතු වගකීම් කොටස පිළිබඳව ඔවුන්ට මඟපෙන්වීමත්, සහායවීමත් අරමුණු කරගත් මෙම වැඩසටහනට ප්‍රදේශයේ මව්වරුන් විශාල පිරිසක් සහභාගී වූ අයුරු දක්නට ලැබුණි.

වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ බොහෝ පවුල්වලට යහපත් කායික, මානසික මෙන්ම සමාජයීය සෞඛ්‍යයක් පවත්වා ගැනීමට බාධා එල්ල වී තිබේ. එකී බාධාවන් ජයගැනීමට සෑම ගමකම මාතෘ සමිති පිහිටුවීම මෙම වැඩසටහනේ අරමුණයි. ඒ සඳහා ගම තුළ ක්‍රියාවට නැංවිය හැකි කෙටිකාලීන සහ දිගුකාලීන ව්‍යාපෘති සමිතිය මඟින් යෝජනා කර ක්‍රියාත්මක කෙරෙන අතර ඉදිරියේදී මාතෘ සමිතිවල සාමාජිකයින්ට අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේදී විශේෂ වට්ටමක් ලබාදීමටද අපේක්ෂා කෙරේ. එකී ව්‍යපෘති සියල්ලම ක්‍රියාත්මක වන්නේ ආහාර හා පෝෂණය, ව්‍යවසායකත්වය සහ පවුලේ ආරක්ෂාව යන ප්‍රධාන නිර්නායක ත්‍රිත්වය යටතේය. මෙය ජාතික තලයේ සිට බිම් මට්ටම දක්වා විහිදෙන දැවැන්ත ව්‍යාපෘතියකි.

අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල පැවති මෙම මාතෘ වැඩසටහන් ‘දෙරණ’ මාධ්‍ය ජාලයේ සභාපති ව්‍යවසායක, නීතිඥ දිලිත් ජයවීර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර මාතෘ සංවිධානයේ සභාපති වෛද්‍ය කසුන් තාරක මහතාද මෙම අවස්ථාවට සහභාගී විය. ඊට අමතරව පවුල් සෞඛ්‍ය සේවා සංගමයේ සභාපතිනී දේවිකා කොඩිතුවක්කු මහත්මියගේ මඟපෙන්වීම ඇතිව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් රැසක්ද මෙම අවස්ථාවට සහභාගී වී සිටියහ.





Cover Story

**රෙසින් කියන්නේ වතුර පාට කෙමිකල් එකක්. ඔය කෙමිකල් එක මැදට ලස්සන ලස්සන පුංචි දේවල් නැත්තම් ෆොටෝ එහෙම දාලා නිර්මාණ කරන වීඩියෝ ටික්ටොක් එකේ තියෙනවා, බලාගෙන ඉන්න ආසයි. ඒ නිසාම ඒ තාලේ ටික්ටොක්වලට සෑහෙන වීව්ස් (නැරඹුම්) තියෙනවා.**

**ටික්ටොක් එකේ ගොඩක්ම තියෙන්නේ පිටරට උදවිය කරන රෙසින් නිර්මාණ. හැබැයි ඔය අස්සේ ලංකාවෙ අපේ තරුණියක් කරන ප්‍රසිද්ධ රෙසින් ටික්ටොක් එකවුන්ට් එකකුත් තියෙනවා. මේ තරුණිය රෙසින් නිර්මාණ කරන්න පටන්ගත්තු කාලේ ලංකාවේ වැඩිය රෙසින් නිර්මාණකරුවෝ ඉඳලා නැහැ. ඒ නිසා රෙසින් නිර්මාණ ගැන කතා කරද්දී අපේ රටේ ගොඩක් අයගේ මතකයට එන්නේ ඇයව. ඒ නිසා ගොඩක් අය ඇයට කියන්නේ රෙසින් කෙල්ල කියලා.**

**රෙසින් කෙල්ලගේ ඇත්ත නම නයෝමි ගීතිකා අතුරලිය. අර කිව්වත් වගේ ටික්ටොක් එකේයි ෆේස්බුක් එකෙයි ඇය හරි ප්‍රසිද්ධයි. ඇගේ නිර්මාණවලට ලොකු ඉල්ලුමක් තියෙනවා.**

**අද කොච්චර ප්‍රසිද්ධ, සාර්ථක ව්‍යවසායිකාවක් වුණත් ඇගේ කතාව පටන්ගන්නේ පුංචි තැනකින්. ඒ විතරක් නෙමෙයි ඇය රෙසින් නිර්මාණ කරන්නේ කෘෂිකර්මයට උපාධියක් තියෙද්දි. ඉතින් උපාධියක් තියාගෙන රෙසින් හදන එකත් සමාජයට ප්‍රශ්නයක් වුණාලු. ඔය එකී මෙකී ප්‍රශ්න මැද ආපු සාර්ථක ගමන ගැන ඇගෙන් අහලා ඇගේ රුවින් අද 'ධරණී' සැරසුවේ නයෝමිගේ කතාව කාටත් ආදර්ශයක් නිසයි.**











# උපාධියට හම්බවුණු රස්සාව පැත්තකට දාලා බිස්නස් එකට අතගැහුවා

## රෙසින් කෙල්ල කිව්වහම අද මාව රටම දන්නවා

ව්‍යවසායිකා
**නයෝමි ගීතිකා අතුරලිය**

"මගේ ගම රත්නපුර. අම්මයි, තාත්තයි, මායි, මල්ලියි තමයි පවුලේ ඉන්නේ.

අපේ තාත්තා කළේ පෙදරේරු වැඩ. පෙදරේරු වැඩ නැති දවස්වල පතල්වල එහෙමත් වැඩ කළා. ඉතින් ආර්ථික පැත්තෙන් අපිට ලොකු හයියක් තිබුණේ නැහැ. හැබැයි අම්මයි තාත්තයි අපි දෙන්නට හොඳට ඉගැන්නුවා. සාමාන්‍ය පෙළ වෙනකල්ම ගියේ රත්නපුර විද්‍යාරාජ මහා විද්‍යාලයට. පස්සේ උසස් පෙළට සීවලී මධ්‍ය මහා විද්‍යාලයට ගියා. අම්මා තාත්තා විඳපු දුක් දැකලා හොඳට ඉගෙනගෙන ඒ දෙන්නට සලකනවා කියන සිතුවිල්ල පුංචි කාලේ ඉඳලම මගේ ඔළුවේ තිබුණා."

නයෝමි උසස් පෙළ හදාරලා තියෙන්නේ විද්‍යාව අංශයෙන්.

**"අපේ මහගෙදර ගොඩක් පොඩියි. ඉතින් මට තිබුණේ බොහොම පුංචි කාමරයක්. තනියම පාඩම් කරද්දි මට නින්ද යනවා. ඉතින් පාඩම් කරද්දි නින්ද ගියොත් ඇහැරවන්න අම්මා මගේ ළඟට වෙලා ඉන්නවා. ඔහොම කොහොමහරි උසස් පෙළ කළා. පළවැනි පාර කැම්පස් යන්න ලකුණු මදි වුණා. දෙවැනි පාර තේරුණේ යාපනේ කැම්පස් එකට. රත්නපුරේ ඉඳලා යාපනේට ගොඩක් දුරයි. ඒත් ආයේ විභාගේ කරලා අම්මව මහන්සි කරවන්න මට ඕන වුණේ නැහැ. ඒ නිසා මම යාපනේ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම අංශයට ඇතුළත් වුණා. අවසාන අවුරුද්දේ වැඩිම ලකුණු තියෙන ළමයින්ව ඉන්ස්ට්‍රක්ටර්ස්ලා විදියට සේවයට බඳවා ගන්නවා. ඒ නිසා අන්තිම අවුරුද්දෙදි කිලිනොච්චියේ කැම්පස් එකේ ඉන්ස්ට්‍රක්ටර් කෙනෙක් විදියට වැඩ කරන්න මටත් අවස්ථාවක් ලැබුණා."**

ඒ වෙනකොට නයෝමිට විශ්වවිද්‍යාලයෙන්ම මුණගැහුනු පෙම්වතෙක් හිටියලු. කිලිනොච්චියේ සේවයට යන්න කලින් මේ දෙපළ විවාහ වෙලා.

"කසාද බැඳලා සතියෙන් දෙන්නත් එක්කලා කිලිනොච්චියේ බෝඩිමක නැවතුණා. හස්බන්ඩ්ට ඔටෝමොබයිල් ඉන්ජිනීරින් ඩිග්‍රි එකක් තියෙනවා. හැබැයි එතකොට එයාට ජොබ් එකක් තිබුණේ නැහැ. අපි දෙන්නම ජීවත් වුණේ මට ලැබුණු වැටුපෙන්."

කිලිනොච්චියේ රැකියාව කරපු කාලය බොහොම දුෂ්කර කාලයක් කියලත් ඇය කිව්වා. ඔය අතරේ නයෝමිගේ ජීවිතේ වෙනස් කරපු අදහස ඇවිල්ලා තියෙන්නේ දවසක් සැමියගේ අම්මා ගත්තු කෝල් එකක් නිසයි

"අපි විවාහ වෙලා සතියෙන් කිලිනොච්චියට ආවනේ. අම්මා මගේ මල් බොකේ එක ෆ්‍රිජ් එකේ අරන් තියලා. ඒකට මොකද කරන්නේ කියලා කෝල් කරලා ඇහුවා. මටත් මුකුත් හිතාගන්න බැරිවුණා. වාහනවලට පාවිච්චි කරන රෙසින් කියලා කෙමිකල් එකක් තියෙනවා. ඒවගෙන් මල් කල් තියාගන්න පුළුවන් කියලා එතකොට හස්බන්ඩ් කිව්වා. පස්සේ මම මල් රෙසින් කරන අයව හෙව්වා. එතකොට ඒ වැඩ කරන අය ගොඩක් අඩුයි. කොහොමහරි තැනක් හොයාගත්තත් එයාලා කිව්ව ගාණ එවෙලේ මට දරන්න බැහැ. ඉතින් මංම බොකේ එක රෙසින් කරනවා කියලා හිතලා කොළඹ ආපු දවසක රෙසින් ගත්තා. ඒත් හොයාගන්න පුළුවන් වුණේ බොහොම පොඩි ප්‍රමාණයක්."

කල්යල් බලලා අමුද්‍රව්‍ය ගනිද්දි නයෝමිගේ මල්කළඹ පරවෙලා තිබුණාලු. ඉතින් නයෝමි ගත්තු අමුද්‍රව්‍යත් අරගෙනම ආපහු කිලිනොච්චි ගිහිල්ලා.

**"අරගත්තු බඩු අපරාදේ නිසා නිකන් ඉන්න වෙලාවක අපි දෙන්නගේ වෙඩින් ෆොටෝ එකක් දලා පුංචි නිර්මාණයක් හැදුවා. පස්සේ ආසාවට මම ඒකේ ෆොටෝ එකක් ෆේස්බුක් එකට දැම්මා. ඒක දකලා හතර පස්දෙනෙක් මගෙන් රෙසින් නිර්මාණ ඉල්ලුවා."**

ඇගේ විශ්වවිද්‍යාල මිතුරියක්ලු ඇගෙන් මුලින්ම නිර්මාණයක් මිලදීගත්තේ. නයෝමි ඒ නිර්මාණය අලෙවි කරලා තියෙන්නේ රුපියල් 450කට.

# ඒවසරේදී

බියංකා නානායක්කාර ලියයි

129 කොටස



තෙන්නකෝන් බණ්ඩාර විසිත්ත කාමරයට ආවේ විසෙන්තිආරච්චි ඇමතිට කියන්නට බොරුවක් හිත ඇතුළේ ගලපමිනි. ඉහිරී ගිය උස් සිනා හඬේ මේනකගේ කටහඬ ඔහුට හොඳින් ඇසුණේය. ඔවුන් සිනාසෙන්නට කාරණාව කිමදැයි සිතමින් විසිත්ත කාමරයට අඩිය තැබූ තෙන්නකෝන් බණ්ඩාරට පුදුමත් හිතුණේය. විසෙන්තිආරච්චි ළඟම සෙටි පුටුවේ ඉඳගෙන සිටියේ මේනකය. මේනක සමඟ ඔහු මොකක්දෝ කතාවකය. ඒ කතාව විසෙන්තිආරච්චිගේ බිරිඳත් වාසුලාත් මද සිනා රන්දාගෙන අසා සිටිනු පෙනෙයි. තෙන්නකෝන් බණ්ඩාර විසිත්ත කාමරයට එත්ම සෙනෙහෙලතා මැණිකේ එතැනින් පිටව මුළුතැන්ගෙය දෙසට ආවාය. ඒ අමුත්තන්ට සැළකීමටය.

**"අද ඔයාලා අමුතුම බර්ත් ඩේ පාටියකට ඇවිත් තියෙන්නේ. මං බර්ත්ඩේ පාටියකට කියලා කට්ටිය එක්කන් ආවට අපි එනකොටත් බර්ත් ඩේ බෝයි පැනලා ගිහින්..."**

තෙන්නකෝන් බණ්ඩාර සිනහසෙමින් කියමින් ඔවුන් අතරට ගොස් පුටුවක ඉඳගත්තේ හිත ඇතුළේ වූ පීඩනය කිසිවෙකුටත් නොපෙන්වමිනි. ඒ කතාවට විසෙන්තිආරච්චි කණ්ණාඩියට යටින් ඔහු දෙස බැලුවේ අමුතු බැල්මකි.

**"ඒ මොකද? අපි එනවා කියලවත්ද පැනලා ගිහින් තියෙන්නේ..?"**

විසෙන්තිආරච්චි ඇමති ඇහුවේ හරියටම සිද්ධිය දන්නවා සේය.

**"ෂොප් එකේ කෙනෙක් හදිස්සියේ අසනීප වෙලා කියලා කෝල් එකක් ඇවිත්..."**

තෙන්නකෝන් බණ්ඩාර ඒ කතාවේ අගට බොරුවක් ගැට ගැසුවේය.

**"අපරාදේ ඉතින් බර්ත් ඩේ බෝයි නැතුව මොන බර්ත්ඩේ පාටිද? ඒත් කමක් නෑ. මේ අපිට තව හොඳ කොල්ලෙක් ඉන්නේ."**

විසෙන්තිආරච්චි මේනක තෙන්නකෝන්ගේ පිටට තට්ටු කරමින් කී විලාශයට තෙන්නකෝන් බණ්ඩාරගේ හිතට පුංචි එළියක්ද වැටුණේය.

විසෙන්ති ආරච්චිගේ පවුල ගෙට ගොඩ වී විසිත්ත කාමරයේ අසුන් ගත්තාට පසු නිශ්ශංක රාජපක්ෂ සහ සමන්තිනී ඉදිරිපස දොරෙන් නික්ම ගෙළයනට ගියේ ඒ සමාගමය ඔවුන්ට නොගැළපෙන බව හැඟුණ නිසාය. ඒත් චතුමිණී එහිම රැඳුණාය. ආවේ මාමණ්ඩිගේ ඇමති මණ්ඩලේ ඇමතියෙක් කියා වැටහුණද ඒ කවුරුන්දැයි කියා ඇය නමින් දන්නේ නැත. ඒත් තේනුකගේ උපන්දිනය වෙනුවෙන් ලස්සන ගෑනු ළමයෙකුත් ඉස්සර කරගෙන මේ පැමිණ ඇත්තේ සාමාන්‍ය ගමනක් නොවේ කියා ඇගේ ගෑනු හිත කීවාය. ඒ නිසා මොකක් හෝ කොනක් අල්ලා ගන්නට ඇය එහිම රැඳෙමින් බොරුවට සඟරාවක් කියවන බවක් පෙන්වුවාය.

**"මට සැකයි මැණිකේ අර ඇමතියගේ ඒම..."**

ගෙළයනේ සිමෙන්ති බංකුවෙන් ඉඳගත් නිශ්ශංක රාජපක්ෂ කීවේ මද කේන්තියකින් සේ මුත් රහසින් වගේය.

**"තෙන්නකෝන් මස්සිනාත් අපි නොදැක්ක ගානට එතනින් ගිය හැටි... අපිටත් පිස්සු... සාගරේ වගේ ගේ දොර තියාන එක එකාගේ මදිපුංචිකම් විඳින්න මේවට රිංගන්න එනවට..."**

කලින් කතාවට සමන්තිනී උත්තරයක් දෙන්නටත් පෙර ආයෙත් නිශ්ශංක රාජපක්ෂ කීවේය.

**"ඒක නම් ඇත්ත තමා. මගේ නෙවේනේ නෑයෝ. ඔයාගෙනේ. ඔයාගේ අක්කගෙ ගෙදරනෙ මේ..."**

හිත සනසනු වෙනුවට සමන්තිනී කීවේද එකී අවස්ථාව ඇගේ සිතත් පීඩාවට පත්කර තිබූ නිසාය.

**"අක්කා හින්ද තමයි මං මෙච්චර හරි ඉවසන්නේ. මට තේරෙනවා මේ ගෙදර ඒ ගෑනිට ඕනි දෙයක් කරන්නත් බෑ වගේ. කොහොමත් මං තීරණයක් අරන් ඉවරයි මැණිකේ..."**

නිශ්ශංක රාජපක්ෂ කීවේ සිමෙන්ති බංකුවේ ඇන්දට හිස හාන්සි කරගෙනය. එතරම් නොඋස් තුරුවදුලෙන් ගෙළයන පිරී තිබූ නිසාම පිටත දහය එතැනට දැනුණේම නැති තරම්ය.

**"මොකද්ද ඔයාගෙ තීරණේ..?"**

**"චතුමිණීව කවදාවත් පොඩි පුතා බඳින්නෙ නෑ."**

නිශ්ශංක රාජපක්ෂ කියාගෙන ගියේ ඒ මොහොතේ හිතේ වැඩ කරන සැලසුමය.

**"ඒක ඔයා තීරණේ කරන්නෙ කොහොමද?"**

**"තීරණේ කරන්නෙ නෙවේ, වෙන්නෙ ඒක. මැණිකෙගෙ මෝඩ ඔලුවට ඒක නොතේරුණාට මට තේරෙනවා. ඌ අපේ කෙල්ලව ගණන් ගන්නෙවත් නෑ. මං හිතන්නෙ අපි එක්ක කතා කළෙත් නිකම් බිස්නස් වැඩවලදි කතා කරනවා වගේ..."**

ඒ කතාව සමන්තිනීට තේරී බොහෝ කල්ය. එසේ බලන කල්හී චර්යාව කෙසේ වෙතත් මේනකගේ ගතිගුණ හොඳය.

මොහොතකට කලිනුත් දියණිය කියමින් සිටියේ ඔහුට දුන් මාලය ඒ සැනින්ම ඔහු ගලවා සාක්කුවේ දමාගෙන ඇති බවකි. ඒ බව නිශ්ශංක දන්නේ නැත. එය තබා තේනුක තෙන්නකෝන්ගේ උපන්දිනයට චතුමිණී දුන් මාලයේ හරි වටිනාකමවත් නිශ්ශංක දන්නේ නැත.

**"දැන් ඉතින් ඊළඟට මොකද කරන්නේ?"**

ඔහුගේ තීරණය අවසාන තීරණය නිසා සමන්තිනී ඒ ටික ඇසුවේද හිත සැකයෙනි.

**"සුදු දුව කොළඹ බිස්නස් කරන්න ඕන නෑ. මං කොළඹින් ගෙවල් ගන්නෙත් නෑ. ඔය ඔක්කෝම කරන්න හැදුවෙ තේනුක ගැන හිතලා. වහාම දුව ගෙදර යන්න ඕන. එච්චරයි..."**

නිශ්ශංකගේ කතාවට සමන්තිනී දෙතොළේ සිහින් සිනාවක් නැගුණි. ඔවුන් දෙදෙනා ඉදිරියේ වූ පුංචි ගසක වැසූ කුරුල්ලන් දෙදෙනාගේ කෑගැහිල්ල කතාබහ අස්සේ දෙදෙනාටම ඇසුණේය.

**"ඔයා හිතන්නේ තාම දූ පොඩි එකෙක් කියලද? එයා අපි කියන ඒවා අහලා ගෙදර එයිද?"**

සමන්තිනී කීවේ ඇත්තටම හිතට දැනුණ සිතුවිල්ලය. චතුමිණී හා නිතර ළඟින් කතා කරන්නේ සමන්තිනී පමණි. ඒ නිසා දියණිය හිතන පතන විදිය ඇය හොඳින්ම දනියි.

**"ඒක මං බලාගන්නම්. ඔයා ගිහින් දුවට කියන්න මං කතා කරනවා කියලා..."**

සමන්තිනී එතැනින් නැගිට්ටේ ඔහුගේ අණ පිළිපදින්නම නොවේ. මේ මොහොතේ ඔහු කේන්තියකින් සිටින නිසා ඔහුට තනිවන්නට ඉඩ දීය. ගෙදරදීද එවන් මොහොතක ඔහුගේ හිත සන්සුන් කරන ක්‍රමය එයයි. එසේම ඈ විසිත්ත කාමරයට පිවිසියේ දියණිය මේ මොහොතේ ඔහු හා කතාවට නොඑවන්නට තීරණය කරමිනි.

අමුත්තන් වෙනුවෙන් සීතල පානයක් හදන්නට සෙනෙහෙලතාට උදව් කළ සෙනුකා මුළුතැන්ගෙයි වූ රවුම් මේසය ළඟින් ඉඳගත්තේ එහි වූ ජංගම දුරකතනයද අතට ගෙනය. සොහොයුරා හා කතා කරන්නට ඇගේ සිතේ ප්‍රශ්න කීපයක්ම විය. ඒ අතරේ පියා පිළිබඳ කිසියම් නොරුස්නා හැඟීමකින්ද ඈ සිත පෙළුණේය. තේනුක මැදිව ඇති මානසික තත්ත්වය මේ වෙද්දී සෙනුකාට හොඳින්ම අවබෝධ වී තිබුණි. ඇත්තටම ඔහුගේ ආදරවන්තිය සුන්දරය. ඔහු කී කතාවලින් තේරෙන්නේ සොහොයුරා ඇයට බොහෝ ප්‍රේම කරනා බවකි. ජපානයේදීද තරුණියන් ඔහු හා පෙමින් බැඳෙන්නට උත්සාහ කළ සමහර සිද්ධීන් ඈ දන්නීය. එවන් අවස්ථාවකවත් තරුණියක් කෙරේ නොබැඳුනු ඔහු සිත සොරාගෙන ඇත්තේ නියම ආදරවන්තිය කියා සෙනුකාට සිතුණි. ඇය ඔහුට ඇමතුම ගෙන දුරකතනය කන තබා ගත්තාය.

**"ඔබ ඇමතූ දුරකතනයෙන් ප්‍රතිචාරයක් නොමැත. කරුණාකර පසුව අමතන්න..."**

සෙනුකාගේ හිත බිඳ වැටුණාය. ඔහු සාමාන්‍යයෙන් දුරකතනය නිවා තබන කෙනෙක් නොවේ. තවත් වරක් තවත් වරක් ලෙසින් හත් අට වරක් ඊට කතා කරන්නට හැදුවාය. ප්‍රතිචාරය එයමය. ඔහු ගෙදරින් ගියේ හිත අවුලෙනි. ඊටද ගේට්ටුවෙන් කාරය එළියට ගත්තේත් වේගයෙනි. සෙනුකාගෙ හිත නොහඳුනනා බියකින් පිරෙන්නට ගත්තේය.

ලබන සතියට

## අද ඔයාලා අමුතුම බර්ත් ඩේ පාටියකට ඇවිත් තියෙන්නේ

## මැණිකෙගෙ මෝඩ ඔලුවට ඒක නොතේරුණාට මට තේරෙනවා. ඌ අපේ කෙල්ලව ගණන් ගන්නෙවත් නෑ

# මූණේ දැලි ගාගත්තම හත්මුතු පරම්පරාවටම ආඩම්බරයි

## දැන් උදවිය දාන්නේ නැති වුණාට පුරාණ මිනිස්සු මේ රහස දැනගෙන හිටියා

14 වැනි සියවසේදි එංගලන්තේ පාලනය කළේ මිෂනාරි පූජකවරු. ඔය කාලේ මිනිස්සුන්ට හැදෙන ලෙඩ රෝගවලට ප්‍රතිකාර කරලා තියෙන්නේත් ඒ උදවියමයි. 14 වැනි සියවසේ අගබාගෙදි මිනිස්සුන්ට බොහොම දරුණු බෝවෙන තුවාල වාගයක් හැදුනලු. මිෂනාරිවරු මේ ලෙඩේට එක එක ජාතියේ බෙහෙත් කරලා තියෙනවා. ඒ එකක්වත් හරි නොගිය තැන ඒ උදවිය ලෙඩ්ඩුන්ගේ ඇඟේ අඟුරු තලලා ගෑවලු. අඟුරු ගෑවයින් පස්සේ මේ රෝගේ පැතිරිලා යන එක පාලනය වෙලා ලෙඩ්ඩු ක්‍රමයෙන් සුව වුණා කියලයි කියැවෙන්නේ.

යම් පරිසරයක නැත්තම් ශරීරයේ තියෙන විෂබීජ, කුණු අපවිත්‍ර උරාගන්න අඟුරුවලට පුළුවන්. ඔතැනදිත් බලපාලා තියෙන්නේ ඒ තාක්ෂණේ. බොහොම අතීතේ ඊජිප්තුවේ ජීවත්වෙච්චි මිනිස්සු නයිල් ගඟේ වතුර පිරිසුදු කළේ අඟුරුවලින්ලු. ඒ උදවිය විතරක් නෙමේ අපේ පුරාණ මිනිස්සු පවා අඟුරුවලින් වතුරයි වාතයයි පිරිසුදු කරලා තියෙනවා. අදටත් අපේ ආත්තම්මලා අම්මලා අඟුරු කැට දාලා ළිඳත් එක්කලා ගණුදෙනු කරන්නේ ඒකනේ.

අඟුරුවල තියෙන ඔය තාක්ෂණේ මූණට වැඩ කරන හැටි ගැනයි කතාව. මූණේ තියෙන තෙල්, කුණු, දූවිලි උරාගන්න අඟුරුවලට පුළුවන්. ඒ විතරක් නෙමේ බ්ලැක්හෙඩ්ස්, වයිට්හෙඩ්ස්වලටත් මේක කියාපු බේත. ඒ නිසා මූණේ අඟුරු උලාගන්න එක මැදපෙරදිග ගැහැනු කැමැත්තෙන් කරන වැඩක්. උන්දැලා මෙව්වට කියන්නේ ඇක්ටිව් චාර්කෝල් කියලා (Active charcoal). ඒ රටවල නම් මෙව්වයේ මිල අධිකයි. චාර්කෝල් අඩංගු රූපලාවණ්‍ය නිෂ්පාදන අපේ රටේත් තියෙනවා. අර කියාපු විදියට එච්චත් තරමක් මිලයි. හැබැයි ඇක්ටිව් චාර්කෝල් ගෙදරදිම හදාගන්න එක බොහොම සුළු වැඩක්. ඒ නිසා බොරුවට සල්ලි වියදම් නොකර අඟුරුවලින් ලස්සන වෙන හැටි අපි කියලා දෙන්නම්.

ගෙදරදිම ඇක්ටැව් චාර්කෝල් හදන්න ඕන කරන්නේ පොල්කටු තුන හතරක් විතරයි. මුලින්ම පොල්කටු තුන හොඳට පිරිසිදු කරලා තෙත නැති වෙනකල්ම අව්වේ වියලාගන්න. ඊටපස්සේ ගෑස් ලිපට හරි දර ලිපට හරි අල්ලලා පොල්කටු අඟුරු කරගන්න. හොඳ පිරිසිදුවට මේ වැඩේ කරගන්න එක තියෙන්නේ ඔයාලගේ අතේ.

පස්සේ පොල්කටු අඟුරු ටික පිටි ගාණට කුඩු කරගන්න. දැන් ඉතින් ඕන් තියෙනවා ඇක්ටිව් චාර්කෝල්. මෙව්වා භාජනේකට දාලා ජල වාෂ්ප නොවදින විදියට ගබඩා කරලා කාලයක් තියාගන්නත් පුළුවන්. හදාගනිපු චාර්කෝල්වලින් කරගන්න පුළුවන් සත්කාර ගැන දැන් කතා කරමු.

සමේ තියෙන තෙල් විෂබීජ අවශෝෂණය කරගන්න පුළුවන් නිසා තෙල් සහිත හමක් තියෙන අයට, කුරුලෑ තියෙන අයට අඟුරු සත්කාර බොහොම යසයි. ඇක්ටිව් කාබන්කුඩු තේ හැඳි එකකට කෝමාරිකා යුෂයි, රෝස වතුරයි දාලා හොඳට මිශ්‍ර කරලා තෙල්, කුරුලෑ සහිත සමේ ආලේප කරන්න. පැක් එක ගාලා විනාඩි 15ක් විතර තියලා සෝදලා අරින්න.

කුඩු නොකරපු පොල්කටු අඟුරුවලට රෝස වතුර කෝප්ප බාගයක් විතර දාලා පැයක් විතර තියන්න. එතකොට අර රෝස වතුර ටික අඟුරුවලට උරාගන්නවා. පස්සේ මිශ්‍රණය කුඩු කරලා තෙල් සහිත සමේ ගාන්න.

අඟුරුවලින් සම පිරිසදු වෙන නිසා ඒත් එක්කම වගේ සමේ පැහැපත් බවත් වැඩිවෙනවා. සම අවපැහැ ගැන්වෙච්චි ගෑනු ළමයින්ට අඟුල් කෙල්ල, අඟුරු කෑල්ල කියලා කියනවනේ. ඔන්න කළු කෙල්ලන්ට හම පැහැපත් කරගන්න ගෙදරදිම කරගන්න පුළුවන් කළු ෆේෂල් එකක් තියෙනවා.

මුලින්ම අර කිව්වා වගේ ඇක්ටිව් චාර්කෝල් ටිකක් හදාගන්න. අඟුරු ටික කොටස් තුනකට වෙන් කරගන්න ඕනේ. මුලින්ම කරගන්න ඕනේ ක්ලෙන්සර් එක. මූණ හොඳට පිරිසිදු කරගන්න. වෙන්කරගත්තු අඟුරු කොටහකට කෝමාරිකා යුෂ එකතු කරලා මූණේ ගාලා විනාඩි 2ක් ක්ලෙන්සර් කරන්න. (කවාකාරව සම්බාහනය කරමින් සම පිරිසිදු කරන්න.)

ක්ලෙන්සර් කරාට පස්සේ සම ස්ක්‍රබ් කරගමු. ඊකට අඟුරු කොටහකට සීනියි වතුරයි එකතු කරලා ස්ක්‍රබ් එක හදාගන්න. ස්ක්‍රබ් එකෙන් විනාඩි 2ක් විතර සම ස්ක්‍රබ් කරගන්න.

කළු ෆේෂල් එකේ අවසාන පියවර පැක් එක දාන එක. අඟුරු කුඩුවලට කඩල පිටි, යෝගට්, බිත්තර සුදුමද වතුර එකතු කරලා ඝන පේස්ට් එකක් හදලා ගාන්න. විනාඩි 15ක් විතර තියලා සෝදලා ඇරලා මොයිස්චරයිස් එකක් හරි සීරම් එකක් හරි ගාන්න.


බ්ලැක්හෙඩ්ස්, වයිට්හෙඩ්ස් අහක් කරන චාර්කෝල් මාස්ක් එකක් හදාගන්න හැටියි දැන් කියන්නේ. මේකට ජෙලටීන් තේ හැඳි 2ක්, චාර්කෝල් පවුඩර් තේ හැඳි 2ක්, වතුර අඩුකොප්ප 1ක් අවශ්‍යයි.

මුලින්ම භාජනයක් ලිපෙන් තියලා වතුර ටික උණු කරගන්න. තවත් භාජනයක් අරගෙන ජෙලටීන් ටිකයි, අඟුරු ටිකයි දාලා උණුවතුර එක උඩ තියලා ඩබල් බොයිල් ක්‍රමේට උණු කරගෙන මූණේ ගාන්න පුළුවන් රස්නෙට නිවුනට පස්සේ වයිට්හෙඩ්ස්, බ්ලැක්හෙඩ්ස් තියෙන තැන්වල ආලේප කරන්න.

මිශ්‍රණය වේලුණාට පස්සේ පරිස්සමෙන් උඩු අතට ඇදලා ගලවන්න. සතියට වරක් මාස දෙක තුනක් මේ සත්කාරය කරද්දි බ්ලැක්හෙඩ්ස්, වයිට්හෙඩ්ස් අයින් වෙලා මූණ පැහැපත් වෙන බව ඇස් දෙකට බලාගන්න පුළුවන්.

බිත්තර සුදු මදේකට අඟුරු එකතු කරලා සමේ ආලේප කරන්න. ඒ වගේම යෝගට්, ඇක්ටිව් චාර්කෝල්, මී පැණි මිශ්‍රණෙත් සමට හොඳ සත්කාරයක්.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි



# කවි යාය

සංස්කරණය ලිහිණි මධුෂිකා

## දිවියක කතාවක්

කෙටි වුත් තාවකාලික ලැගුම්හලක් බඳු ජීවිතයක්
දිනෙක මිහිමත පස්ව යට වන ශරීර කූඩුවක්
කුටියක සිතිවිලි සිර කර දමන සිතක්
ගෙවාලයි හුස්ම නතරවන තුරු කාලයක්

උපන්නොත් ඊර්ෂ්‍යාව නමැති පව්ටු සිතුවිල්ල
රැස් කර ගනියි දින දින කෙලෙස් සිතුවිලිම
කළොත් යම් ක්‍රියාවක් කපටි වූ සිතින්ම
දුකම විඳියි නිති නොලබා සැනසුම

**ටී.නිපුනි සමෝද්‍යා වත්තෙගම**
**බෙලිඅත්ත**

## අහිමි පෙම

සිතූ දේවල් අනන්තයි
පැතුම් පැතුවා අනන්තයි
සෙනෙහෙ පිදුවා අනන්තයි
සුසුම් හෙළුවා අනන්තයි

අහිමි වේ යැයි නොසිතුවා
පණ මෙන් ඔබ ගැන සිතුවා
සියලු දේ මගෙ ඔබට පිදුවා
වෙන්වෙතැයි මම නොසිතුවා

නමුදු ඔබ මට එරෙහි වූවා
මගේ සෙනෙහස නොසැලකූවා
වෙනත් කෙනෙකුට සෙනෙහෙ පිදුවා
ගමත් හැරදූ ඔබ ගියා

ප්‍රථම ප්‍රේමය සුන්දරයි
සිතින් තවමත් ඔබ ළඟයි
මියෙනතුරු මම ආදරෙයි
නමුදු සැම දේ අනිත්‍යයි

**එස්.යටියලගල**
**කුරුණෑගල**

## ආදරබර අම්මේ

දෙදණ නමා මා
ඔබ පා වැන්දම හිස අත ගා
මට පින් දුන්නේ
අද ඔබ නැත මා අසලකවත්
කොහි ගියදෝ අම්මේ
හදවත පුපුරා ගලා හැලෙන දුක
වාවන්ද කෙලෙසේ
මහගෙදරම අද පාලුයි නිහඬයි
ඔබ කොහෙදෝ අම්මේ
මගෙ ලොව බැබැලූ පහන් තරුව ඔබ
කොහෙ සැඟවුණිදෝ අම්මේ
මෙතේ බුදුන් දැක නිවන් දකීවා
ආදරබර අම්මේ

**චන්ද්‍රලතා කුමාරි රාජකරුණා**
**ගල්ගමුව**

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.**

''කවි යාය'' 'ධරණී'
කර්තෘ මණ්ඩලය,
අංක 91,විජේරාම
මාවත,කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට
ඊමේල් කරන්න


PHYSICS
COMBINED MATHS
(සිංහල / English)
මාස 3න් A සාමාර්ථයකට
සාර්ථක ක්‍රමවේදයකට
තනි කුඩා කණ්ඩායම් පන්ති
C සාමාර්ථයකට අඩු
ප්‍රතිඵලයට මුදල් ආපසු.
වසර 7ක පළපුරුද්ද සහිත
තිවංක විජේවංස Bsc.
074 389 0133


ඔබ දෛවයට පිටුපායිද.. ?
දෛවය ඔබට පිටුපායිද.. ?
● ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
● වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.
හස්ත රේඛා විශේෂඥ
එස්. කෝරලේගේ
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,
සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

දැන්වීම් සඳහා
අමතන්න
0112672 601
0112 672 603

උගස් තැබූ
රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
රන් පවුම - 175,000/-
076 101 88 53

සංවර්ධිත බැංකු ඇබෑර්තු
★ කුඩා හා මධ්‍ය පරිමාණ බැංකු ශාඛා සඳහා ප්‍රාදේශීය මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.
වැටුප 40,000/-
18/40 ගැ/පි
(මැන් පවර් නොවේ)
0716 434 278 | 0703 346 072
0702 725 731 | 0718 853 997
0742 916 140 | 0774 024 155

ගාල්ල අවටින්
පුහුණු /නුපුහුණු
රූපලාවණ්‍ය
ශිල්පිනියක්
අවශ්‍යයි
ඉහළ වැටුප්
U Shine
076 902 7676

ඔබේ විදේශ ගමන කොතරම් ප්‍රමාදද? ව්‍යාපාර වලින් හෙම්බත්වෙලාද?
❖ සැමියා/දරුවා මත්ද්‍රව්‍යය, මත්කුඩුවලට ඇබ්බැහි වී දුක් විඳිනවාද?
❖ සැමියා/බිරිඳ අනියම් සබඳතා නිසා දුක් විඳිනවාද?
❖ 2023 - 2024 සියලු විභාග ජය ගැනීමට
❖ රැකියා ලබා ගැනීමට ❖ හැර ගිය අය ගෙන්වීම
පුරාණ විහාරය, වේරතැන්න, වේරපිටිය
අමතන්න: 071-0 314 878
මගේ විදේශ ගමන සාර්ථකවීම නිසා ඩුබායි හි සමන් කුමාර විසින් පළ කරන ලදී
උපන් දිනය / උපන් වේලාව සමග අමතන්න
ඔබ දුකෙන් තැවෙන ඕනෑම ගැටලුවකට විසඳුම්
පුරා දශක 4ක් දුකට පත් ජනතාව දුකින් මුදවා ගත්,
පූජ්‍ය වේරපිටියේ ඥානිස්සර ගුරු හාමුදුරුවෝ
(කල නොහැකි වැඩ භාර ගන්නේ නැත)


ජීවිතේම වූ ආදරය ගොඩගැසූ හීන කන්ද එක් මොහොතකින් සුනුවිසුනු වුනාද?
පණවගේ ආදරය කල සැමියා/බිරිඳ, පෙම්වතා/පෙම්වතිය පිටුපෑවාද?
■ පවුල් ජීවිතයේ පෙම් හබ නිසා කනගාටුද ■ සුරාව/සූදුව නිසා දුක් විඳීද ■ විභාග/නඩුහබ ජය ගැනීමට
■ රැකියාව අහිමිද/රැකියාවක් සොයනවාද ■ ව්‍යාපාර කඩා වැටිලාද ■ ඔබ විඳින සියලු දුක් වලට විසඳුම්
පුරා දසකයක් මා හෙළු සියලු වෙර වෑයම් දුකින් පෙලෙන ඔබගේ හිතසුව පිණිසමය... මාහට බාරදුන් කිසිවක් වැරදි නැත.

පූජ්‍ය බඹරගහඇල්ලේ ධම්මජෝති හිමි
071 55 94 747 / 076 90 55 484
සෙත් පියස, පලාපත්වල



**සීතා පොන්නම්පෙරුම**
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

පාඩම් අංක 76

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

# චූටි ගහකින් ලක්ෂපතියෙක් වෙන්න



**"මුලින්ම මේ ගහ දිහා හොඳට බලන්න. පස්සේ ඇස් වහලා ඒ ගහ ගැන විතරක් හිතන්න."**

මේක 1984 අවුරුද්දේ තිරගත වෙච්ච 'ද කරාතේ කිඩ්' චිත්‍රපටයේ දෙබසක්. ඔය චිත්‍රපටයේ ප්‍රධාන චරිතේ ඩැනියෙල්. ඩැනියෙල් සම වයසේ මිතුරන්ගේ හිරිහැරයට ලක්වෙච්චි දරුවෙක්. ඔය කතාවේ ඉන්නවා මියාගි කියලා ජපන් මහත්තයෙක්. ඒ මහත්තයගේ විනෝදාංශේ බොන්සායි ගස් ගදන එක. අර තගදන කොල්ලොත් එක්ක තරඟ කරන්න මියාගි මහත්තයා ඩැනියෙල්ට කරාතේ උගන්වනවා. කරාතේ කියන්නේ මනස එකතැන් කරගෙන ප්‍රගුණ කරන්න ඕනා කලාවක්ලුනේ. ඉතින් අර බොන්සායි ගහ දිහා බලාගෙන ඉන්දැද්දියි එච්චට සාත්තු සප්පායම් කරද්දියි මනස එක්තැන් වෙනවා කියලයි මියාගි මහත්තයා ඩැනියෙල්ට කියන්නේ.

කතාවේ කියැවුණාත් වගේ ලෝකේ පුරා ගොඩක් මිනිස්සු භාවනා කමටහනක් විදියට බොන්සායි ගස් පාවිච්චි කරනවා. අපේ රටෙත් බොන්සායි ගස්වලට හොඳ ඉල්ලුමක් තියෙනවා. මනස නිවාගන්න විතරක් නෙමේ හදලා විකුණලා ගොඩයන්නත් පුළුවන් වැඩක් මේක. ඉතින් අද ස්වයං රැකියා පිටුවෙන් කියලා දෙන්නේ බොන්සායි ගස් හදන හැටියි.

බොන්සායි කියන එකේ තේරුම පැතලි තැටියක හිටවපු ගහ කියන එක. බොන්සායි කියන්නේ ජපන් වචනයක් වුණාට මුලින්ම ගස් බොන්සායි කරලා තියෙන්නේ චීන මිනිස්සු. ඔන්න මීට අවුරුදු 3000කට කලින් චීනේ මින් කියලා රජ කෙනෙක් හිටියලු. මේ රජතුමා ගහකොළට හරියට ආදරේ කළ රජෙක්ලු. හිම කාලෙට කොළ පාට ගස් පේන්න නැතිකොට මින් රජතුමා සෑහෙන සන්තාප වෙනවලු. රටේ හිටපු ප්‍රභූවරු පැතලි තැටිවල ගස් හිටවලා එච්චා පොඩිවට හදන කලාවක් හොයාගෙන තියෙන්නේ මේ රජාගේ සොව මකන්න. කාලෙකදි මේ කලාව රට පුරා පැතිරිලා බොන්සායි බොහොම වටිනා දෙයක් වෙලා. ඉස්සර චීන ජාතිකයෝ දුවගේ දෑවැද්ද විදියට බෑණලාට දීලා තියෙන්නේත් මේ පැළ. පස්සේ ජපානේ චීනය ආක්‍රමණය කළානේ. එතකොට ජපන් අය බොන්සායි කලාව ඉගෙනගෙන ඒක වැඩිදියුණු කරලා. ඉතින් අද ගොඩක්දෙනා කියන්නේ බොන්සායි ජපන් කලාවක් කියලා.





බොන්සායි කලාව බොහොම බරසාරෙට යන මහවිශාල කලාවක්. ඉතින් ඒ කලාවම පත්තර පිටුවකට ලඝු කරන එක ලේසි නැහැ. ඒ නිසා කාටත් තේරෙන විදියට අවශ්‍යම කරුණු ටිකෙන් වැඩේ කරන හැටි තමයි කියලා දෙන්නේ.

අරටුව තියෙන ආයුෂ වැඩි ඇට්ටර ගස් තමයි බොන්සායි කරන්න ගන්නේ. ඇට්ටර ගස් වුණත් පුංචි කොළ තියෙන ගස් තෝරගන්න ඕනේ. අඹ, දෙල්, කොස් වගේ විශාල කොළ තියෙන ගස් මේ වැඩේට ගැළපෙන්නේ නැහැ. කුඹුක්, වීර, පළු, බෙන්ජමිනා, බෝ, බෝගන්විලා, සියඹලා, දිවුල්, කරඳ, දෙළුම්, නුග වර්ග, මාදං, ඇට්ටේරියා, බුරුත, කළුවර, මී, කෝං වගේ ගස් හොඳයි.

බොන්සායි කියන්නේ පැතලි තැටියක හිටවපු ගහට කියලා කිව්වනේ. ඉතින් මුල්ම වැඩේ බඳුන තෝරගන්න එක. අඟල් තුනක් උස බදුනක් නම් වැඩිය හොඳයි. පළල නම් කොහොම වුණත් කමක් නැහැ. වැඩේට වැඩිය හොඳ මැටි භාජන. රවුම්, කොටු, නැත්නම් ලස්සන හැඩයක් ගන්න ඕනම පැතලි බඳුනක් ගන්න පුළුවන්.

භාජනය තෝරගෙන වගා මාධ්‍ය හදගමු. ගඩොල් කැට, බොරළු, වේලිච්ච ගොම, ගඟේ වැලි, අඟුරු, මතුපිට පස් සමාන ප්‍රමාණවලින් ගන්න. ගඩොල් කැට ටික 1cm ප්‍රමාණයට එන්න කඩාගන්න. ගඩොල් කොටහක් පිටි ගාණට කුඩු කරලත් තියාගන්න. අඟුරුත් එහෙමයි. 1cm ප්‍රමාණවලින් කොටසයි, පිටි වගේ අඹරගත්තු කොටසයි.

මාධ්‍ය ටික ලැහැස්ති කරගෙන භාජනේ පුරවමු. ගඩොල් කුඩු ටිකයි, අඟුරු කුඩු ටිකයි ඇරුණම අනිත් කියාපු ටික එකට කලවම් කරගන්න. ඊටපස්සේ මිශ්‍රණේ තියෙන ලොකු කැට ටික භාජනේ පතුලටම දාන්න. ඊටපස්සේ මධ්‍යම ප්‍රමාණවල කෑලි භාජනය මැදට දාන්න. අර කුඩු කරගත්තුවා උඩටම දාන්න. මේ මාධ්‍යවල කැට ප්‍රමාණ වෙන්කරගන්න උපකරණ තියෙනවා. පොඩියට වැඩේ පටන්ගනිද්දි ඒවා අතින් තෝරගෙන, වැඩේ සාර්ථක වෙද්දි එච්චා ගන්න බැරියෑ.

භාජනේ හදලා ඉවර වුණාම අර උඩ කියාපු ගස්වලින් පොඩි පැළයක් ගන්න. හීන්සීරුවට මුල්වල තියෙන පස් අහක් කරගන්න. ඒ වැඩේ නම් බොහොම සීරුවට කරන්න ඕනා ඕන්. ගහේ මුදුන් මුලට උඩින් හොඳ ශක්තිමත් මුල් ටිකක් තියෙනවා නම් මුදුන් මුලේ පහළ කොටස කපලා දාන්න. එහෙමට කියාපු හයිය මුල් නැතිනම් මුදුන් මුල කපන්න යන්න එපා. එහෙම කරලා ගහ බඳුනෙන් හිටවන්න.

පැළය මුල් ඇදලා අලුත් දළු දානකල් රසායනික පොහොර දාන්න එපා. දළු දැම්මයින් පස්සේ යෝගට් හැන්දක් විතර රසායනික පොහොර දාන්න. මල් එන ගස්වලට නම් පොස්පරස් දාන්න. කොළ ගස් නම් යූරියා හොඳයි.

දළු දැම්මයින් පස්සේ පැළයේ මුල ඉඳලා අඟල් හතරක් යනකල් තියෙන අතු කපලා දාන්න. (මුවහත් පිහියක් හෝ අඬුවක් පමණක් භාවිතා කරන්න) ගහේ අතු බෙදෙන එක ගැන ඇහැගහගෙන ඉන්න වෙනවා. පැළේ ඉස්සරහට වෙන්න අතු වැවෙන්න දෙන්න එපා. මොකද ඉස්සරහින් බැලුවහම ගහේ කඳ පේන්න තියෙන්න ඕනානේ. ඒ නිසා ඉදිරිපස අතු කපලා එක පැත්තකට අත්ත නැවිලා කඳ පේන විදියට ගහ සකස්කරන්න.

කදේ මුල ඉඳලා අඟල් 5ක් උසින් වම් පැත්තට අත්තක් යවන්න. තව ටිකක් උඩින් පිටිපස්සට වෙන්න අත්තක් යවන්න. ඊට තවත් ටිකක් උඩින් දකුණු පැත්තට අත්තක් යවන්න. ගහ උඩට යනකොට කේතුමය හැඩයක් එන්න ඕනේ. අවශ්‍ය අතුවලට තඹ නැත්නම් ගැල්වනයිස් කම්බි ඔතලා මාසයක් දෙකක් තියන්න. එතකොට අත්ත ඒ අනුව හැඩවෙනවා. හැඩවුණාට පස්සේ කම්බි අහක් කරන්න.

මේ පැළ බලාගන්න විදිය තමයි ඊළඟට වැදගත්. බොන්සායි පැළ දවසට පැය තුන හතරක් හිරුඑළියට නිරාවරණය කරන්න ඕනේ. පැළේ ගේ ඇතුළේ තියෙනවා නම් ජනේලයක් ළඟ පැය තුන හතරක් තියන්න. වාතාශ්‍රය දෙන්න. තද සුළං එන තැන්වල පැළය තියන්න එපා. වතුර දද්දි ස්ප්‍රේ කරන්න. එකපාර වතුර ගොඩක් දාන්න එපා. අවුරුද්දකට වතාවක් පැළය ගලවලා වගා මාධ්‍ය අලුත් කරන්න ඕනේ. එතකොට මුදුන් මුල වැවිලා නම් ඒකෙන් ටිකක් කපලා ඉවත් කරන්න. බඳුනේ ජලය පරිවහනය ක්‍රමවත්ව වෙන්න ඕන නිසා බඳුනේ සිදුරු හතරක් පහක් තියාගන්න. බඳුනේ තියෙන පස්වල පාසි වවාගන්න. ජලය තියෙන තැන්වලින් පාසි ගලවලා බොන්සායි තැටියේ පස්වල හිටවන්න.

අලෙවි කරද්දි බඳුන අලුත් කරලා අලුත් පාසි හිටවලා විකුණන්න. ගහ විකුණද්දි නඩත්තු කරන හැටි පාරිභෝගිකයාව දැනුවත් කරන්න.

ලස්සන බොන්සායි ගහක් හැදෙන්න අවුරුදු දෙකේ ඉඳලා හතර දක්වා කාලය ගතවෙනවා. ඉතින් මේක එකපාර කරන්න පුළුවන් වැඩක් නෙමෙයි. රැකියාවක් කරන ගමන් කරන්න පුළුවන් ස්වයං රැකියාවක් විදියට වැඩේ පටන්ගන්න.

ලංකාවේ බොන්සායි ප්‍රදර්ශන තියෙනවා. ඒවට ගිහිල්ලා මේවා අලෙවි කරන්න පුළුවන්. සමාජ මාධ්‍ය හරහාත් බොන්සායිවලට ලොකු ඉල්ලුමක් තියෙනවා.

පැළේ වයස වැඩිවෙන්න වෙන්න වටිනාකම වැඩිවෙනවා. චීනෙයි, ජපානෙයි කෞතුකාගාරවල අවුරුදු 2000ට වඩා වැඩි බොන්සායි පැළ තියෙනවා. ඒවායේ වටිනාකම මිල කරන්නවත් බැරිලු. ඉතින් අවුරුදු අටක් විතර හොඳට නඩත්තු කරලා හදාගන්න ගහක් ලක්ෂයකට වැඩි මුදලකට දෙන්න පුළුවන්. අවුරුදු දෙකේ ගස් විසි තිස්දහේ ඉඳලා මිල කරන්න පුළුවන්. බොන්සායි ගැන තවත් දැනගන්න 0714766819 ට කතා කරන්න.

■ **සෙව්වන්දි හෙට්ටිආරච්චි**




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.